


Scanned by CamScanner

20

# නීලියා

රමණී බුලත්සිංහල

Scanned by CamScanner

# පිවිසුම

**සංගීත රාවය උත්සන්න වෙමින් තිබිණ...**

මුළු ශාලාවේම වූයේ අඳුරකි. සුදේශ් අයේෂා දෙස බැලුවේය.... ඇය තොල් පොපියවා සිනැහුණාය.. කිහිප දෙනෙක් අතරම කිසිවක්ම නොපවසා දෙනෙත් වලින් කුමක්දෝ කථාවක් එහේ මෙහේ විය... සුදේශ් අයේෂාගේ තොල් සිප ගත්තේය... කිහිප දෙනෙක්ම ඒ සමගම කුඩා සිප ගැනීම් වලට ලක්වෙනු කාහටත් දැකිය හැකි විය... ඉන් අනතුරුව පිරිමි දහ පහළොස් දෙනෙක්ම මේසයක් වටා සිට ගත්හ... මේසයට වැටුණේ මුදල් නොවේ... කාමරයන් හී දොරවල්වල යතුරුය...

කුඩා රන්පාට අනංගයාගේ හැඩය ගත් අයේෂාට හිමි යතුර වෙනත් අයෙක් ගනිද්දී සුදේශ්ට ආවේ නිල්පාට යතුරු ඇමුණුම ඇති යතුරය... ඔහුට සිනහවක් ගියේය... තමාට ලැබුණේ තමා තෝරාගෙන සිටි තැනැත්තියම බව ඔහුට හොඳින්ම විශ්වාසය...

Scanned by CamScanner

කාමරයේ දොර හරිද්දීම ...

හැරී බැලුවාය... ඒ වන විටද ඇයගේ ගත සැරසී තිබුණේ කුඩා රාත්‍රී ගවුමකිනි...

"ම්... තැන්ක් ගෝඩ්... මං ඒත් බයෙන් හිටියේ..." කියමින්ම ඇය ඔහු දෙසට ආවාය... කාමරයේ ඇරුණු දොර වැසිණ...

"දැන් හරිනේ... මං දැක්කා වින්සන්ට්ට ගියේ මනෝජ්ගේ යතුර...." කී සුදේශ් ඇයව තදින් තෙරපා සිප ගත්තේය...

"කට්ටියගේ යතුරු දන්නවා නේද...?" ඇය ප්‍රශ්න කළේ තරමක් ඔහුගෙන් ඈත් වෙමිනි...

"නැතිව බෑ නේ... නැත්තං මට ඕන කෙනාගේ යතුර හොයා ගන්නේ කොහොමද...?" ඔහු ඇසක් ගසමින්ද ඇසුවේ කමිසය ගලවමිනි...

"ඔයාට දුක නැද්ද අයේෂා එහෙම යනවට...?" ඇය එවර පැණයක් නැගුවේ දැන් යහන මත වැතිරී සිටින ඇය වෙත ඔහු එද්දීය.

"තාම නැහැ... මං හිතුවෙත් නැහැ..." ඔහු ඇය දෙසට හැරුණේය... "ඇත්තම කිව්වොත් මං ඇහුවෙත් නෑ..." ඔහු එවර කීවේ ඇයව ඔහු දෙසට ඇද ගනිමිනි... සැමියාගේ සීමාවෙන් පිට වෙනත් පෙම්වතුන් ඇසුරු කරන ඇයට අයේෂාගේ වගක් කුමකටදැයි අසන්නට ඔහු සිතුවේ නැත... දැන් ඔහුට අවශ්‍ය මේ මොහොත ගෙවා දැමීම පමණකි...

"මං හෙට ඔෆිස් යන්නත් ඕන..." ඇයට කියූ ඔහු හැරී විදුලි පහන නිවා දමා යළිත් ඇයව ඇද ගත්තේය...

තම සැමියා වෙනත් බිරිඳක හා ගැවසෙද්දී ඒ බිරිඳ සුදේශ්ගේ පහසට නතුවෙමින් සිටියාය...

# ඔලිවියා

මෙම කථාව දිව යන්නේ 1960 වසර පරාසයකදීය.

එකල මෙකල මෙන් ජංගම දුරකථන භාවිතයක් තිබුණේ නැත.

තුන්රෝද රථ හෝ යතුරු පැදි බහුලව තිබුණේත් නැත.

වාහන මෙතරම් දකින්නට ලැබුණේත් නැත.

එහෙයින්ම මෙම පොත කියවන පාඨකයා

එම කාලයට ගමන් කරමින්

මෙම පොත රසවින්දනයක යෙදිය යුතුය.

අද කාලයට මෙය ගැලපෙන්නට නොපිළිවන් වුවද,

එකලත්

මෙවැනිම සමාජයීය රටාවකට හුරුවූ

පුද්ගලයින් නම් අනන්තකවත් සිටි බව

මෙයින් මම කියන්නට තැත් දැරුවෙමි.



# එක

**"සර්** කෝල්ස් තුනක් ඇවිත් තිබුනා..." සුදේශ් රැස්වීමෙන් පසු කාර්යාල කාමරයට ඇතුල්වෙද්දීම ඔහුගේ පුද්ගලික ලේකම් වරිය මොනිකා කීවාය...

"කාගෙ කාගෙන්ද...? එනිතිං... ඉම්පෝර්ටන්ට්...?"

"එකක් අයේෂාගෙන්... එකක් කම්පැනි එකකින්... අනික නං සර්... මිස්ට ඉලුක්කුඹුර කියලා ලෝයර් කෙනෙක් ගෙන්... එයා නං තුන් හතර පාරක්ම ඇහැව්වා සර් ආවද කියලා..." කියමින්ම ඇය ලිපිගොනුවක් ගත්තේ සුදේශ් ඉදිරියෙන් තැබුවාය... "මං ඒත් ඇහැව්වා හදිසියක්ද කියලා... සර්ටම කියන්න ඕන මොකක් හරි ඉන්සිඩන්ට් එකක් වගේ තමයි කථා කරේ..."

"ඉලුක්කුඹුර..." සුදේශ් මඳක් එවර කල්පනා කළේය... ඒ නමින් නම් මෙතෙක්ම ඔහු කවරෙක්වත් හඳුනන්නේ නැත... සමහරවිට ඔහුගේ පළමු නාමය...

"එයාගේ ෆර්ස්ට් නේම් එක කිව්වද...?"

"නැහැ සර්... ඉලුක්කුඹුර කියලා විතරයි..."

"කොයි වෙලාවෙද කෝල් කළේ...?"

"උදේ මං ආව ගමන්ම එක සැරයක් කෝල් කළා... මං ඉතින් කිව්වා අද නං සර් ටිකක් පරක්කු වෙයි කියලා... ඊට පස්සෙ එකොළහට විතර කෝල් කළා... ඒ පාර ඉතින් මං කිව්වා ආව ගමන්ම මීටින් එකකට ගියා... එන්න ටිකක් වෙලා යයි කියලා... දැන් පැය භාගෙකට විතර ඉස්සෙල්ලත් කෝල් කළා..."

"නම්බර් එක දුන්නද...?"

"ඔව් සර්... එත් දැන් සර් ලන්ච් අරගෙනත් නෑ නේද...?"

"මීටින් එකේදි රිෆ්‍රෙෂ්මන්ට් එකක් ගත්තානේ... අර මැන් හදිසියක් කියලා කිව්වද...?"

"එහෙමම කිව්වෙත් නෑ... ඒත් අදම කථා කරන්න පුළුවන් නං හොඳයි කිව්වා..."

සුදේශ් තොල් පට සපාගෙනම මොහොතක් කල්පනා කළේය...

නොදන්නා තැනැත්තෙක් නම් තුන් හතර සැරයක් කථා කළේ නම්... එය කුමක් හෝ වැදගත් ආරංචියක් වන්නටද පිළිවන... සමහරවිට විදේශගත කිසියම් කාර්යයක්...

"කමක් නෑ එහෙනං... ගන්න ඉස්සෙල්ලම ඒ නම්බර් එක..." ඔහු කීවේ එවර ඔහුගෙන් පිළිතුරක් එනතුරු බලාගෙන සිටින මොනිකා දෙස බලමිනි...

ඇය දුරකථනය වෙත ගියාය... යළි ඔහු දෙස බැලුවාය...

"ආං සර්... තව පොඩ්ඩෙන් මට අමතක වෙන්න ගියේ... මිස්ට පරාක්‍රම ආවා..."

"පරාක්‍රම...?" සුදේශ්ගේ මුහුණට කරදරකාරී පෙනුමක් එක් විය... "පණිවිඩයක් කිව්වද...?"

"නැහැ සර්... ආයේ එන්නං කියාගෙන ගියේ..." මොනිකා කියා නිමවෙන්නටත් පෙර කාමරයේ දොර විවර වී පියන් කෙනෙක් ඇතුළට ආවේය...



"සර් පරාක්‍රම සර් ඇවිත්..."

"එහෙනං ඉස්සෙල්ලා එයාට එන්න කියන්න... මොනිකා කෝල් එක ගන්න එයා ගියායින් පස්සෙ..."

"සර් ලන්ච් ගන්න අවුට් යනවද...?" දොර විවර කරගෙන පියන් යද්දී මොනිකා ඇසුවාය.

"මං යන්න හිටියේ... දැන් ගෙන්නන්න මොනිකා... යන්න වෙලාවක් නැති වෙන්න පුළුවන්... තුනහමාරට අර කම්පැනි එකකින් එනවා කිව්වා නේද...?" සුදේශ් ඇසුවේ සුදු ලෑල්ල දෙස බලමිනි... එහි එම වේලාව ආයතනයක නමක් හා තැනැත්තෙකුගේ නමක් ලියා වෙන් කර තිබිණ...

"අයියේ..." කියාගෙනම පරාක්‍රම ඇතුල් විය...

"වාඩිවෙන්න..." සුදේශ් කථා කළේ නිළ ස්වරූපයකිනි... ඔහු කවදාවත් පරාක්‍රම හෝ එම නිවසින් එනවාට කැමැත්තක් නොදැක්වීය.

පරාක්‍රම යනු ඔහුගේ පියාගේ දෙවන බිරිඳ වන කුඩම්මාගේ අක්කාගේ පුතෙකි... කුඩම්මා හා සමග මිස සුදේශ් ඒ පවුලේ කිසිවෙක් හා පෑහීමක් නොතිබුණේය...

මව හා පියා අතර විරසකය කුමක්දැයි සුදේශ්ට තේරුම් ගියේ බොහෝ පසුවය... පියා මවගෙන් දික්කසාදයකින්ම වෙන් වෙද්දී සුදේශ් සිටියේ අවුරුදු දහයක වයසකය... සුදේශ් පියා හා නැවතීමට කැමැති විය... පියා මියුරි කුඩම්මා හා විවාහ වුණේද ඒ අවුරුද්දේම අග භාගයේදීය...

සුදේශ්ට මව නැති අඩුව කිසිදාක නොදැනෙන්නට කුඩම්මා ඔහුට ආදරය කළාය... ඔහු ඇයට මමීයැයි ඇමතුවේද එහෙයින්මය...

ඔහුට මව දකින්නටද ඇයගෙන් කිසිදු තහනමක් නොවිණ... පියා නොව ඔහුට මව හෝ මවට ඔහු හෝ දකින්නට අවශ්‍යයැයි කියූ විටෙක ඔහුව මව වෙත රැගෙන ගියේ කුඩම්මාය...

දන්නා තරමින් මව හෝ කුඩම්මා අතරද කිසිදාක විරසකයක් තිබුණේ නැත... එහෙත් ඇය ඒ නිවසේ බොහෝ වේලා රැඳී සිටියේ

Scanned by CamScanner

නැත... ඇය වන්දනාවකට යද්දී හෝ සිල් ගන්නට යද්දී සුදේශ්ව මව ළඟ තබා යන්නට තරම් ඇය කරුණාවන්ත වූවාය...

සුදේශ් ළමා ලෝකයෙන් යෞවන ලෝකයට එබෙද්දී පියාගේ සියළුම කියුම් කෙරුම් දැන ගනිමින් සිටියේය... මව අභියසදී තරමක් මෙල්ල වූවද, කුඩම්මාට නම් පියා මෙල්ල කරගත හැකි නොවීය... ඔහු මිළ මුදලින් පමණක් නොව අනික් සියල්ලෙන්ම පරිපූර්ණ විය... පියා හා මව අතර විරසකය ආවේ ඒ නිසා බව සුදේශ් දැනගත්තේ යෞවන වියට පත්වෙද්දීමය...

පියා කුඩම්මා ළඟා කර ගත්තේ තමාව පාලනය කරන බිරිඳට වඩා තමාට පාලනය කරගත හැකි බිරිඳක ලෙසින් විය හැකි බව සුදේශ්ට තේරුම් ගියේ ඒ ලෙසය...

කුඩම්මා සිටියදී වුවද, පියා වෙනත් ගැහැනුන්ද ඇසුරු කළේය... බොහෝ විට කුඩම්මාගේ කාලය ගෙවුණේ සුදේශ් හා කථා බහෙනි... ඇයට දරුවෙක්ද නොවිණ... ඇය ඒ ගැන කිසි දිනෙක කථා නොකළාය... පසුතැවිලි වෙන බවක්ද නොපෙන්වූවද, ඇය ඒ පිළිබඳව තැවුණු බව ඔහු දැනගත්තේ කුඩම්මා මෙලොවින් සමුදුන්නාටද පසුවය...

පියා මිය යද්දී සුදේශගේ වයස දහනවයකි...

ඒ වෙද්දීද ඔහුට මිතුරියන්ගෙන් නම් හිඟයක් නොවීය. පුතාද පියාගේ අඩි පාරේ යන්නට පෙර කුඩම්මා ඔහු පිටරටකට යැව්වාය. ඇය සිතූ පරිදි සුදේශ්ගේ චරිතයේ කිසිවක්ම වෙනස් කරන්නට නම් හැකි නොවිණ...

එහෙත් පියාට වඩා සුදේශ් ඇය ඉදිරියේ තරමක් මෙල්ල විය... ඇයගේ සිත රිදෙන අයුරු කිසිවක් කිරීමට ඔහු අසමත් විය... මවට වඩා ඔහු කුඩම්මා ගැන සැලකිලිමත් වූයේය...

ඔහු කාන්තාවන් ඇසුරු කළේ ඔහුටම ආවේණික අන්දමකිනි... පියාට වඩා පෙනුමින් හා කඩවසම්කමින් මෙන්ම තරුණ ජවයෙන්ද වැඩිවූ නිසාදෝ ඔහු වටාද පියා වටා මෙන්ම විවාහක කාන්තාවන්ද පෙළ ගැසී සිටියහ...



විවාහකයකු නොවුණද ඔහු සමාජශාලාවේදී අන් අය අභිබවා යතුරු සෙල්ලමින්ද ජය ගත්තේය.. ඔහු හා ළඟින් ඇසුරු කළ සමහරක් කාන්තාවෝ පසුව පසුව නිවසටද යන්නට එන්නට සූදානම් වෙද්දී සුදේශ් එයට නම් කැමැත්තක් දක්වූයේ නැත...

සුදේශ් එතනදී පියා ගත් මග ගන්නට නම් නොසිතුවේය... පියා සතුව තිබුණු එම පුද්ගලික නිවාසයේ දැන් ජීවත්ව සිටියේ කුඩම්මාය... එයට එන කාන්තාවන් දෙස බලමින් කුඩම්මා සිත තලා ගැනීම ගැන ඔහුගේ සිතේ කැමැත්තක් නොවිණ... එහෙයින්ම එම නිවසට යාබද නිවස මිළට ගත් සුදේශ් එය තමාට හැකි අයුරින් වෙනස් කර වෙනම මන්දිරයක්ද තැනුවේය...

එහෙත් ඒ මැදුර ඔහුගේ බව කුඩම්මා මැරෙනතුරුම දැනගත්තේ නැත... ඒ තරමට ඔහු කුඩම්මාගෙන් ඔහුගේ ජීවිතය වසන් කර ගත්තේය...

වෙනත් තැනක මන්දිරයක් ගත්තේ ආනන්ද විලා යැයි නම් කළේ සමාජශාලා තත්ත්වයේ මන්දිරයකටම පෙරළුවේය... එය නිවසක් මෙන් පෙණුනද, එහි බොහෝ විට ගැවසුණේ වෙනත් අදහස්වලින් යුත් සමාජයේ වැදගත් යැයි සම්මත එක්තරා කොටසක් පමණකි...

සමාජයේ ධනවත් යැයි සැලකෙන පෙළන්තියට ඔවුන්ගේ ජාගර හැඟීම් පිට දැමීමට ඒ විසල් තාප්පයෙන් වටවූ නිවසට හැකියාවක් තිබුණ බව කවුරුත් දැන සිටියේ නැත...

ඔහුගේ විසල් තේ වත්තේද ඔහු නිවෙස් දෙකක් ඉදි කළේය... කුඩම්මාගේ අදහස් අනුව ඉදිකළ නිවසට ඔහු වෙනත් ගැහැනුන් ගෙන යන්නට කැමැත්තක් දක්වූයේම නැත...

එහෙයින්ම ඔහු වෙනත් නිවසක් වෙනත් අයුරකින් නිම කරගත්තේ එය කුඩා හෝටලයක් ලෙස පවත්වාගෙන ගියේය... කුඩම්මා සිටියදී නම්... එයට ආවේ ගියේ ඔහුගේ විදේශික මිතුරු මිතුරියන් පමණකි...

මොන තරම් ගැහැනුන් හා ගියද සුදේශ්ගේ එක්තරා පැත්තක් පියාට වඩා හොඳ පැත්තකට ඉදිරියෙන් තිබුණේය... ඔවුන්ගේ වත්තේ

Scanned by CamScanner

බොහෝ තරුණියන් පවා ගැහැනුන් වූයේ පියා අතිනි... එහෙත් සුදේශ් කිසි දිනෙක ලාබාල තරුණියක් බලෙන් නොව සිරුරේ එතෙද්දී වුවද අනාථ කළේ නැත...

එහෙත් සමාජයේ සුදේශ්ගේ නම ගියේ ලැබුණු සෑම යුවතියකම සමග යහන් ගත වෙන පුද්ගලයෙකු විලසිනි... ඔහු සෑම විටම සොහොයුරියන් ගැන සිතන සොහොයුරෙක් මෙන් විය... ඒවා සමාජය තුළට කෙදිනකවත් සුදේශ්ගේ හොඳ හා බැඳී ගියේ නැත...

ඔහු හා බොහෝ විට යහන් ගත වුණේ විවාහක කාන්තාවන්ම පමණකි... ඒ ඔවුන්ගේ අවශ්‍යතාවයන්ද සපුරා ලමිනි...

කවුරුත් නොදත්තේ වුවද සුදේශ් හා එකට බැඳුණු එකම අවිවාහක යුවතිය වූයේ අයේෂාය...

ඇය වුවද සුදේශ් පෙම්වතෙකු ලෙස සැලකුවා විනා විවාහයකින් බැඳෙන්නට තරම් සිතන්නට ගියේ නැත... සුදේශ් මුණ ගැසෙද්දී වුවද ඇය පෙම්වතුන් කිහිප දෙනෙක් හා සම්බන්ධවී සිටි බව ඔහුද දැන සිටියේය... ඔහු ඇය හා ඇසුරු කරන්නට ගත්තේද එය දැන දැනමය... පසුව පසුව විවාහකයන් අතර පවතින බොහෝ සමාජශාලා කෙළි සෙල්ලම් සඳහා ඔවුන් දෙදෙන සහභාගි වන්නට වූයේ සැමියා හා බිරිඳ ලෙසමය... ඔහු හා ඇය විවාහ වෙතැයි කවුරුත් සිතා සිටියද මේ වෙන තෙක්ම නම් එලෙස සිදු නොවූයේ අයේෂා තවමත් ඉගෙන ගන්නා නිසා බව කවුරුත් දැන සිටියහ...

එහෙත් ඇය යහන් ගත වූයේ සුදේශ් සමගම පමණක් නොවන බවත්..., ඔහු යහන් ගත වන්නට වූයේ ඇය සමගම පමණක් නොවන බවත් ඒ සමාජයේ කවුරුත් දැන සිටියහ...

සැමියා මෙන්ම මෙම කරුණේදී ඇයගේ ඥාති පුතාද නවත්වා ගැනීමට කුඩම්මා නම් අසමත් වූවාය...

එහෙත් ඒ ගැන දැනගත් මව ඔහුට දැඩි ඔවදනක් දෙකක් දුන් පසු සුදේශ් මාසයක් දෙකක් මවගෙන්ද වසන්වී සිටියේය...

...මට හරියන කෙල්ලෙක් හම්බ උනොත් මං බඳින්නං අම්මේ...



ඉන්පස්සේ මං තාත්තා වගේ නං වෙන්නේ නෑ... ඔහු මවට වරක් කීවේය...

...මමී බයවෙන්න එපා... මං කෙල්ලෙක් හොයාගත්තොත් ඉස්සෙල්ලම මමීට පෙන්නන්නංකෝ... ඔහු කුඩම්මාට වරෙක කීවේය...

කුඩම්මා සිතැහුණද ඔහු එය කීවේ සැබැවින්ම එලෙසම සිතමිනි... කුඩම්මා මවට වඩා බොහෝ පියකරුය... එම රූමත්කම සැඟවුණු රූමත් කමක් බව ඔහු සිතුවේය... පියා ඇය තෝරාගන්නට ඇත්තේ එය නිසාම නොවන බව ඔහු සිතුවේය... කුඩම්මා කිසිවිටෙකත් මව මෙන් දැඩි තීරණ ගත්තේ නැත... කෝප ගත්තේද නැත...

මව මෙන් නොව කුඩම්මා නම් සුදේශ්ගේ ඒ කථා විශ්වාස කළාය... කවුරුත් නොදන්නා කාහටවත් නොදැනෙන සුදේශ්ගේ යහපත් ජීවිතයක් ගැන ඇයගේ දෙනෙත් ඉදිරියේ ඇය අත්විඳ තිබුණ හෙයිනි... ඔහු මෙවැනි නරාවලකට යොමු වුණේ පියාගේ අයහපත් කල්ක්‍රියාවෙන් බව ඇයට විශ්වාසයට ගැනී තිබිණ... එහෙයින්ම ඇය හදිසි හෘදයාබාධයකින් මැරෙන දිනයට පෙර දිනයේද ඔහුට යුවතියන් සෙව්වාය... එහෙත් ඔහුට ගැලපෙන කෙල්ලෙක් ඔහුට මෙතෙක්ම මුණ නොගැසුණ අතර..., ඔහු ගැන දන්නා සමාජයේ කිසිදු කෙනෙක් යහපත්ව හැදුණු වැඩුනු ගැහැනු ළමයෙක්ව ඔහු හා පෙළවහකට කථා කරන්නට තරම් උනන්දුවක්ද ගත්තේ නැත...

ඔහුගේ කුඩම්මා මෙලොවින් සමුගත්තේ දැන් අවුරුදු තුනකට පෙරය... සුදේශ් දැන් සිටින්නේ තිස් එක් වැනි වියේය...

සුදේශ්ගේ ඒ හැසිරීම් නිසාම දෝ කුඩම්මාගේ පැත්තෙන් ඇයගේ අක්කා මෙන්ම ලොකු මල්ලීද කිසි දිනෙක නෑකම එළිපිට දක්වන්නට කැමැත්තක් දැක්වූයේ නැත... අන් අයුරකින් බැලුවහොත් ඔහුත් ඒ අයත් අතර ලේ නෑකමක් නොවිණ...

කුඩම්මාගේ අක්කාගේ සැමියා නැතිවෙද්දී, ඇයගේ ලොකු පුතාට..., එනම් පරාක්‍රමට වයස දහඅටක් හෝ දහහතක් පමණ විය... ප්‍රශ්න ආවද අක්කා... තම පුතා වන පරාක්‍රම සුදේශ් ළඟට එවන්නට අකැමැති වූයේ ඔහුද සුදේශ්ගේ අනවශ්‍ය සබඳතා අතරට එක්වෙතැයි

සිතූ හෙයිනි... පරාක්‍රමගේ සියලුම ඉගෙනීම සඳහා වියදම් දරන්නට සිතා සිටි සුදේශ් ඒ සියල්ල අතහැරියේ දිනක් ඒ නැන්දාගේ අනවශ්‍ය කථා බහක් දුර දිග යද්දීය... ඒ ලොකු අම්මා වුවද සුදේශ් ඇයට කථා කළේද නැන්දා යන නාමයෙනි...

ඔහු ඒ පවුල හා ඉන්පසු කිසිදු සබඳතාවයක් නොදැක්වූ අතර ඒ මගම ගත් ලොකු මල්ලීගේ බිරිඳ එනම් ලොකු නෑනා ද, සුදේශ් නම් ඥාති පුතා පමණක් නොව ඇයගේ නෑනා.., එනම් සුදේශ්ගේ කුඩම්මා ද අමතක කළාය... එපමණක්ම නොවේ... ඇයද අක්කා මෙන්ම නෑනාගේ මළගමට පවා නාවාය... ඔවුන් දෙදෙනම යම්තමකට ඇතුල්වී පෙනී සිටියාම පමණකි...

එහෙත් කුඩම්මාගේ පුංචි මල්ලී මෙන්ම එම බිරිඳද..., කුඩම්මා හා බොහෝ විට කථා බහ කළා පමණක් නොව ඔවුන්ගේ සිඟිති දියණියද සමහරවිටක ඒ නිවසට රැගෙන ඒම නතර නොකළෝය...

කුඩම්මා ජීවිතයෙන් සමුගනිද්දී ඒ දෙදෙන සිටියේ පිටරටක වූවද. මළගම වෙනුවෙන්ම දිවයිනටද පැමිණ කුඩම්මාට අවසන් ගෞරවය දක්වන්නට පෙළැඹී සිටියාහ. වරක් දෙවරක් කථා කළද ඉන්පසු ඒ මාමා හා නැන්දා සමග වූවද පයුරු පාසානයක් කරන්නට තරම් සුදේශ් උත්සුක වූයේ නැත... තවත් අවුරුද්දක් පමණ ගත වෙද්දී ඔවුන්ගේ කථා බහද නැවතිණ... මාමා හෝ නැන්දා ඔහුට කථා නොකළ බැවින් ඔහුද කථා කරන්නට සිතුවේ නැත... සුදේශ් කිසි දිනෙක ඔවුන් ගැන සොයවන්නට නම් ගියේ නැත...

පරාක්‍රමලා වුවද ඒ මාමා හා නැන්දා ගැන සොයවන්නට නොගිය බව ඔහු දැන සිටියේය... ඒ ඉඳහිට කථා කළ ඔවුන්ද හඳුනන කිසියම් මිතුරෙක් හා තරමක කථා බහකට යොමු වෙද්දීය...

කුඩම්මා නැතිවීම සුදේශ්ගේ ජීවිතයේ ඔහු ලැබූ ඉමහත් තනිකමක් බව කවුරුවත් දැනගත්තේද නැත... එහෙයින්ම ඔහු ඉන්පසු ඔහුගේ කොළඹ නිවසට ආවේ ගියේද කලාතුරකිනි... ඔහු බොහෝ විට ගත කළේ වත්තේ බංගලාවේය... නැතහොත් සිටියේ අනික් නිවාසයේය... එහෙයින්ම කුඩම්මා සතු තරමක් විසල් නිවස මෙන්ම



එයට යාබද සුදේශ් තැනවූ කුඩා යැයි කිව හැකි එහෙත් බොහෝ අයට විසල් යැයි සිතෙන තරමේ නිවසද පාළුවට ගොස් තිබුණේය...

සුදේශ්ගේ මව පුතාගේ මෙම තනිකම මකන්නට සිතමින් ඔහුගේ නිවසට යන්නට සිතුවද, ලොකු අක්කා ඇය ළඟ සිටින මව වෙනතක යවන්නට කැමැත්තක් දැක්වූයේ නැත..:

ඇයට දරු දෙදෙනෙක්ද සිටියහ... ඇය සිටියේ අවිස්සාවේල්ල පැත්තේය...

එයටත් වඩා මල්ලීගේ කෙරුවාවන් දකිද්දී මවට හෘදයාබාධයක් සෑදෙන්නටත් හැකි බව ඇයට සිතෙමින්ද තිබුණ හෙයිනි...

ඇය එහෙත් එය නොකියා තමාගේ දරුවන්ගේ තනිකම ගැන කියමින් මව නවත්වා ගත්තාය...

පොඩි අක්කා සිටියේ මාතර පැත්තේය...

ඇය කවදාවත් සුදේශ් ගැන සොයන්නට බලන්නට ගියේ නැත... ඉඳහිට ඇයි හොඳයි කියන්නට කථා කළද..., ඇය සුදේශ්ගේ නිවසටවත් එන්නට කැමැති වූයේ නැත...

සුදේශ්ගේ ජීවිතය ගැන ඔවුන් සිතුවේ සෙල්ලක්කාර කිසිදු වගකීමක් දරන්නට නොහැකි..., ගැහැනුන් ගැනම ලොල්වී ජීවිතය ගෙන යන තැනැත්තෙක් පරිද්දෙනි...

එහෙත් ඒ තැනැත්තා බොහෝ කාර්ය ශූර අන්දමින් සියල්ලම ගෙන යන බව සිතන්නට ඔවුන් කවදාවත් සිතුවේ නැත...

ඔහුගේ වියදමක් ගැන දැණුනොත් ඒ වියදම අපරාදයක් බව කිව්වා මිසක..., ඒ එන ආදායම ගන්නට ඔහු ගන්නා තැත ගැන ඔවුන් සිතන්නට නොපෙළඹුනේ බොහෝ විට අනෙක් අයගේ මතවාද ගැනද සිතන හෙයින්ම විය යුතුය... අනික් අයගේ සිතේ සුදේශ් නැමැත්තා ගැන එතරම් පැහැදීමක් තිබුණේ නැත...

ඔවුන්ට ඔහුගේ ජීවිතය මහ ගුප්ත අන්දමේ ජීවිතයක් මෙන් වී තිබිණ...

Scanned by CamScanner

එහෙයින්ම මවගේ හෝ පිය පාර්ශ්වයේ හෝ කුඩම්මාගේ පාර්ශ්වයේ හෝ නෑදෑයින් ඔහු ගැන තැකීමක් නොකළ අතර ඔවුන් ගැන ඔහුගේ තැකීමක්ද තිබුණේ නැත...

සුදේශ් හා නෑදෑයින් අතර වූ එම පරතරයද ඔහුගේ සෙල්ලක්කාර ජීවිතයට මහත් පිටිවහලක්ව තිබිණ... පරාක්‍රම තරමක් දුරට ඔහු හා ආශ්‍රය කළද...., ඉඳහිට හමුවූවද..., ඔහු පරාක්‍රම හා වැඩි හජනයකට යන්නට අකැමැත්තක් දක්වූයේය... ඒ පරාක්‍රමගේම මිතුරන් හා එක්වුණු පරාක්‍රමගේ හැදියාවේ වැරැද්දක් වූවද..., එහි නරක නාමය එන්නේ තමාට බව සුදේශ් වටහාගෙන සිටි හෙයිනි...

කෙසේ වූවද, කාගේවත් කීම් බහක් ගැන සිතන්නට නොගියද..., ඒ අයගේ විශ්මයට මෙන්ම සමහරුන්ගේ නෙත් වලට දූවෙන ප්‍රශ්නයක්ද වන පරිදි සුදේශ් පියාගේ ව්‍යාපාර පමණක් නොව වත්තද සිතාගත නොහැකි අන්දමින් දියුණු කරගත්තේය...

එහෙයින්ම අවසන් වරට මුණ ගැසී අවුරුද්දකට පමණ පසු පරාක්‍රම තමා සොයන්නට මෙලෙස පැමිණියේ නම් කුමක් හෝ වැදගත්ම කරුණක් නිසා වන්නට ඇතැයි දූන් ඔහු දොරෙන් ඇතුළ් වෙද්දීම සුදේශ් සිතාගත්තේය...



# දෙක

"**මොකක්ද** ප්‍රශ්නෙ...?" වාඩිවී තමා දෙස බැලූ පරාක්‍රමගෙන් සුදේශ් ඇසුවේද නිළ මට්ටමකිනි...

අයියා කෙනෙක් ලෙස සුදේශ් ගැන සිතාගෙන සිටියද, මෙලෙස අසද්දී බොහෝ විට පරාක්‍රම තරමක් පසුබසින්නේය. සුදේශ් කවදාවත් තමා හා සුහදත්වයෙන් කථා කළා ඔහුට මතකයේ තිබුණේම නැත...

ආගිය තොරතුරු කථා කිරීමට සුදේශ් යොමු නොවෙන බව වටහාගත් පරාක්‍රමට මඳ චකිතයක්ද දැණින... ඔහු පැමිණියේ මවගේ කීමටය... නැතහොත් සුදේශ් මුණ ගැසෙන්නට ඔහුගේද කැමැත්තක් නොවුණේ මෙම අයියා කිසි දිනෙක තමාට මල්ලී කෙනෙකු ලෙස නොසලකන බව මතකයට ගනිමිනි... එහෙත් සුදේශ් තමා ප්‍රතික්ෂේප නොකර කථා කරන බව නම් ඔහු අත්දැකීමෙන් දැන සිටියේය... උදව්වක් පදව්වක් ඉල්ලූ විටෙක සුදේශ් එය පැහැර නොහරින බව නම් පරාක්‍රම සිතුවේය...

කෙසේ වූවත් තවමත් එලෙස උදව්වක් ඉල්ලන්නට තරම් ඔහුට ආත්ම ශක්තියක් නොවිණ... තමාගේ මව මේ තැනැත්තාට එදා

Scanned by CamScanner

කළ කථා බහෙන් පසු මෙලෙස හෝ තමා සමග තරමක සබඳකමකින් කථා කිරීම පුදුමයක් යැයි ඔහු සිතමින්ද සිටි හෙයිනි...

මේ තිබෙන්නේ කුඩම්මා ගැන ඔහුගේ ගෞරවය මිසක වෙනත් යමක්යැයි සිතාගන්නට නම් පරාක්‍රම අසමත් විය. පරාක්‍රම තබා ඔහුගේ මවටද ඒ ගැන දැනීමක් නොතිබිණ...

සුදේශ්ගේ හා පවුලේ අතර සබඳකම ඇත්වීමට ප්‍රධාන හේතුව වූයේ තමාගේ මව බව නම් පරාක්‍රම හොඳින්ම වටහාගෙන සිටියේය... සුදේශ්ගේ හුදකලා චරිතයද එයට හේතුවක් වන්නට ඇත...

"පුංචි මාමා අයියාට කථා කළාද...?" එහෙයින්ම පරාක්‍රම කෙළින්ම මෙන් ඔහු පැමිණි කාරණයට බැස්සේය...

"නැහැ..." සුදේශ් පිළිතුර දුන්නේ නම් විමතියෙනි. දැන් අවුරුදු දෙකකට නොඅඩු කාලයක්ම පුංචි මාමා ඔහුට කථා කළේ නැත... ඔවුන් වෙන රටකට යන්නට ඇතැයි ඔහු සිතාගෙන සිටියේය...

කුඩම්මා තමාට බොහෝ ආදරය කළ බව දන්නා නිසාම නැන්දා නම් කිසි දිනෙක තමා අත් නොහරින බව ඔහු දැන සිටියේය... කුඩම්මා හා ඇය අතර වූයේ සිතාගත නොහැකි මිතුරුදමකි... සෙනෙහසකි... එහෙත් ඒ සෙනෙහස දැන සිටියේ වුවද..., සුදේශ් ඔවුන් ගැන වුවද සොයන්නට නොගියේ..., කුඩම්මාගේ අනික් නෑදෑයින් ගැන ඔහුගේ ඇති බලවත් අකැමැත්ත නිසාමය...

එසේ වූවද, තමා සොයා ආ දිනෙක..., නැතහොත් තමාට කොහිදී හෝ මුණ ගැසුණු දිනෙක..., පරාක්‍රමට හෝ වෙනත් නෑදෑයකුට නොසලකා හරින්නට නම් සුදේශ් සිතුවේ නැත...

"නැහැ...?" පරාක්‍රම ඇසුවේ තරමක කුතුහලයකිනි... සුදේශ් පුංචි මාමා ගැන දන්නවාම වන්නට හැකියැයි ඔහුට කීවේ නම් ඔහුගේ මවය...

එක්තරා අන්දමකින් බැලුවහොත් පුංචි මාමා නොව කුඩම්මා ඇසුරු කළේ පුංචි මාමාගේ බිරිඳය. මල්ලීට වඩා ඇය මිතුරිය හා එක්වී සිටියාය... පුංචි මාමා කවදත් අනික් අය ඇසුරට ගියේද නැත...



ඔහු කසාදයෙන් පසු මුළු පවුලෙන්ම මෙන් අයින් වුණේය... ඔහුගේ කසාදයට එම නිවසින් නම් කැමැත්තක් නොදැක්වූ හෙයිනි... නන්දා තමාට හඳුන්වා දුන්නේ පොඩි අක්කා එනම් මියුරි නිසා ඇයටද එහි වගපල ආ බව එඩ්වඩ් එනම් පුංචි මාමා පමණක් නොව දැන් පරාක්‍රමලාද ඒ බව දැනගෙන සිටියහ...

මේ සියල්ල ගැන සලකද්දී සුදේශ් පුංචි මාමා ගැන නොදන්නේ යැයි සිතන්නට පරාක්‍රමද මැළිවිය...

තමා ඔවුන් ගැන තබා කවුරුත් ගැන සොයන්නෙක් නොවන බව පරාක්‍රම නොදන්නේයැයි සිතීමට ඒ මොහොතේ නම් සුදේශ්ද මැළිවිය...

"නැහැ... දන්නවනේ මං වැඩිය හොයවන්නෙ නෑ කියලා... මොකද මේ හදිසියේ...?" ඔහු එහෙත් ඇසුවේය... මෙහි කුමක් හෝ කරදරයක් වන්නටත් බැරි නැත... එසේ නම් ඔහු පුංචි මාමා ගැන සෙවිය යුතුය...

"පුංචි මාමා නැතිවෙලා කියලා ආරංචි උනා..."

"මොකක්...?" ඇසූ සුදේශ්ට එවර නම් තදබල පීඩනයක් දැණින... තමා ඔවුන් ගැන නොසෙවීම වැරැද්දක් බව ඔහුට සිතුණේ දැන් ය... පුංචිමාමා නැතිවූයේ නම් නැන්දා හා ඒ දියණිය පත්වන්නට ඇති අසරණ බාවය ගැන ඔහුට හොඳ හැඟීමක් දැණින... නැන්දා මොවුන්ගේ කවරෙක්වත් නොවේ... නැන්දාට මේ පැත්තෙන් සෑහෙන ප්‍රශ්න තිබුණු බව සුදේශ්ට පසුව පසුව වැටහී තිබිණ... එහෙත් ඒවාට අහුකොන් පෑමට ඔහු කවදත් ගියේ නැත...

"කවදද...? පරාක්‍රම දැනගත්තේ කොහොමද...?"

"දැනගත්තේ නං ගිය සතියෙ..." පරාක්‍රම කියාගත්තේය... මව කියූ කරුණ ඔහුට අමතක විය... මව කීවේ අද දැනගත් බව කියන ලෙසය...

"මට එදාම කිව්වේ නැත්තේ ඇයි...?"

"ඒක හරිද කියලා හරියටම..."

Scanned by CamScanner

"ඔගොල්ලොත් දන්නෙ නැති නිසා... හරිනේ... එතකොට නැන්දලා...? නැන්දලාගේ ගෙදර අයත් දන්නෙ නැතිඋද...?" සුදේශ් ඇසුවේ පරාක්‍රමගේ මව කෙසේ වෙතත් පරාක්‍රම නම් ඔවුන්ගේ පැත්තේ දෙතුන් දෙනෙක් හා ඇසුරු කරන බව දැනගෙන සිටි හෙයිනි...

"ඒක තමයි ප්‍රශ්නෙ... නැන්දා අපේ කට්ටියට තියා ඒ ගොල්ලගේ ගෙදර කට්ටියට වත් කිසි දෙයක් කියලා එවලා නෑ..."

අපේ කට්ටියට යැයි කියවෙද්දී සුදේශ්ට ආ උපහාස සිනහව නැතිවී ගියේ නැන්දලාගේ ගෙදරට වත් එය නොදැන්නුවා ගැන පුදුමයක් සිතෙද්දීය...

පුංචි මාමාට මේ පවුලෙන් නම් කවදාවත් හරි දෙයක් කියවී තිබුණේ නැත... නන්දා නැන්දා ගැන ඔවුන්ගේ පැහැදීමක් තිබුණේද නැත... ඉතින් කෙදිනකවත් නැන්දා පරාක්‍රමගේ මවට විශේෂයෙන් යමක් කියතැයි බලාපොරොත්තු විය නොහැකි ය... එහෙත් නැන්දාගේ පවුලට නොදැන්නුවේ නම්... කෙසේ වූවත් පරාක්‍රම කී නිසාම නොව පරාක්‍රම බලාපොරොත්තු වුණා නැතා..., ඒ නැන්දලාගේ මහ ගෙදරට ගොස් ඒ ගැන සොයන්නට ඔහු සිතාගත්තේය... ඒ කුඩම්මාගේ මිතුරියය...

එහෙත් ඒ නැන්දලාගේ මහගෙවල් තිබෙන්නේ කොහේදැයි ඔහු දන්නේ නැත... මතකයකද නැත... බලාගත හැක්කේ කුඩම්මා සතු ලිපින පොතෙනි... හවස නිවසට ගොස් ලිපින පොත බැලිය යුතුය... ඔහු සිතාගත්තේය...

දැන් සිතිය යුත්තේ පරාක්‍රමගේ මේ ආගමනයේ එය දැනුම් දීමට වඩා දෙයක් තිබේදැයි සොයා බැලීමය... ඔහු පරාක්‍රම දෙස බැලුවේය...

මෙම පණිවිඩය කීමට දින සතක්ම අපතේ යැවූ පරාක්‍රම මෙලෙස පැමිණීමේ කිසියම් හේතුවක් තිබිය යුතුය... සමහරවිට එඩ්වඩ් මාමාට අයිති යමක් වෙතොත් එය ලබා ගැනීමටදැයි ඔහුට සාධාරණ සැකයක් ඇතිවිය... එහෙත් තමාගේ සැකය පරාක්‍රමට පෙන්වන්නට සුදේශ් සිතුවේම නැත...



ඔවුන් එලෙස සිතුවේ නම් වැරදිය... එඩ්වඩ් මාමාගේ දේ අයත් විය යුත්තේ ඔහුගේ බිරිඳටත් දරුවාටත්ය... දන්නා තරමින් ඔවුන්ට සිටියේ දියණියක්ම පමණක් බව නම් සුදේශ් දැන සිටියේය...

"ඉතින් දැන් මගෙන් බලාපොරොත්තු වෙන්නේ මොනවද...?" සුදේශ් යළිත් ඇසුවේ නිළ අන්දමකිනි.

"අම්මා කිව්වා අයියාට හරි පණිවිඩයක් දීලා තියෙනවද කියලා බලන්න කියලා..."

"ඕගොල්ලන්ට දෙන්නේ නැති පණිවිඩ... මං වගේ මිනිහෙකුට දෙන එකක් නෑ නේ පරාක්‍රම..." සුදේශ් කට කොණකට සිනහසී කීවේය...

පරාක්‍රම උපහාසය විඳ ගත්තේය... මේ ගමන එන්නට පෙර මව තමා කී වරක් දැනුවත් කළේදැයි මතකයට එද්දී ඔහුට එම උපහාස කටහඬ විඳගන්නටම සිදුවී තිබිණ... ඔහු මාතෘකාව වෙනස් කරන්නට සිතුවේය...

"එහෙනං මං යන්නං..."

සුදේශ් හිස සැලුවේය...

"සුදේශ් අයියා වත්තට යනවද හෙට අනිද්දා තරම...?" පරාක්‍රම එවර ඇසුවේ නැගිටින්නට සුදානම් වෙන අතරමය... මෙය අසන්නේ කෙසේදැයි ඔහු දහ අතේ කල්පනා කරමින් සිටියේය... මව කීවාක් මෙන් මෙවැනි ප්‍රශ්න සුදේශ් නැමැත්තාගෙන් නිකමට අසන්නට නොහැකිය... ඔහු බොහෝ දේ සිතින් සිතා ගන්නා තැනැත්තෙකි...

සුදේශ් දෑස් හකුලා පරාක්‍රම දෙස බැලුවේය...

"ඇයි...?"

"නැහැ... මට ඒ පැත්තේ යාළුවෙක් ගෙ ගෙදරකට යන්න තියෙනවා... අයියා යනවනං මටත් යන්න පුළුවන් නේ කියලා හිතුණා..." පරාක්‍රම කීවේ යළිත් වාඩිවෙන්නට මෙන් තැතක් දරමිනි...

දැන්... මේ වන්නේ කුමක්ද...? මෙතෙක් කලක්ම පරාක්‍රම ඒ පැත්තේ යාළුවන්ගේ නිවෙස්වලට ආවේ ගියේ තමා සමග නොවේ...

මෙහි කුමක් හෝ යටි අදහසක් ඇති බව සුදේශ්ට එවර සැකයෙන් තොරවම සිතුණද ඔහු උත්තරය දුන්නේය...

"යන්න ඉන්නේ නං තව සතියකින් විතර... අවශ්‍යම නං... මං දවස මොනිකාට කියලා තියන්නං... අහගන්න..." කියමින්ම සුදේශ් දුරකථන අංක කරකැවූයේය... තමා හා වෙනත් කථාවක් කරන්නට අයියා නොකැමැති බව දැනගත් පරාක්‍රම වෙනත් කිසිවක්ම කියන්නට නොසිතා නැගිට ගත්තේ කාමරයෙන් පිටවන දොර දෙසට ගියේය...

"අයේෂා... අයැම් සුදේශ් හියර්..." පරාක්‍රමට දොරින් පිටවෙද්දී ඇසුණු සංවාදය විය... ඔහුගේ මුවට සිනහවක් නොනැගුණද, සිතට සිනහවක් නැගුණේය... තමා කියූ කිසිවක්ම සුදේශ් සිතට නොගන්නා බව පමණක් පරාක්‍රමට සිතිණ...

මව නිවැරදිය... සුදේශ්ගේ ඇත්තේ පුංචි අම්මාගේ ලේ නොවේ... තමා මෙතරම් මොහු ඉදිරියේ බැගෑපත් වන්නේ කුමකටදැයි ඔහුට දැන් කේන්තියක් නැගිණ... එහෙත් මෙවැනි ආයතනයක් මෙවැනි අන්දමින් දියත් කරන සුදේශ් කෙරෙහි ඔහුගේ සිතට ඒ තරමක ආඩම්බරයක්ද දැණින...

කවුරු කෙසේ කීවත් ඔහුට තමාගේද නෑකමක් ඇත... කුඩම්මාගේ නෑකම පමණක් නොව හිතවත් කමක් ගැවී ඇති කාහට වුවත්, ඉල්ලුවොත්, ඔහු උදව් කරන් බව නම් පරාක්‍රම දැනගෙන සිටියේය... එහෙත් තමාට ඒ උදව්ව ලබා ගැනීමට නොහැකි වූයේ තමාගේ මවගේ වාචාල කම නිසා බව නම් නොසිතාම නොහැකිය... එසේ නොවූයේ නම් තමාට මෙලෙස කුඩා රැකියාවක් කරන්නට වන්නේ නැත... දැන් තම නිවසද ගරා වැටෙමින් තිබේ... එයට වුවද ණයක් ගෙන සාදවා ගත යුතුය...

සුදේශ්ට එය කිවහොත් ඔහු එයට කිසිවක්ම කරනු ඇත... එහෙත් මවගේ හැඟීම වී ඇත්තේ සුදේශ්ගෙන් උදව්වක් නොගැනීමටය... ඒ ඇයිදැයි ඇය කවදාවත් තමාටද කිව්වේ නැත... දැන් ඇය කියන්නේ වෙනත්ම කථාවකි... මෙලෙස සුදේශ් තමාගේ ගමන ගැන යම් කිසිවක්ම දැනගතහොත්...



පරාක්‍රමට දැඩි පසුතැවිල්ලක් දැණින...

පුංචි අම්මා... මියුරි හෙක්ටර් බාප්පා සමග, එනම් සුදේශ්ගේ පියා හා විවාහ වෙද්දී ඔහුගේ දික්කසාද කම ගැනද නොසලකන්නට තරම් වූයේ පුංචි අම්මා නොව තමාගේ මව ඔහුගේ මුදල් කන්දරාව ගැන සිතූ හෙයින් බව ඔහු දැනගත්තේ ආච්චී ගෙනි. කෙසේ වූවත් පුංචි අම්මාටම මිස හෙක්ටර් බාප්පාගේ බූදලයෙන් අනෙක් අයට වැඩක් වූයේ නැත...

හෙක්ටර් බාප්පා පුංචි අම්මාට ලියූ සියල්ලද සුදේශ්ටම ලියන්නට පුංචි අම්මා තීරණයක් ගත්තේ ඇය සුදේශ්ට දරු සෙනෙහසින් සැලකූ නිසාද..., නැතහොත් සුදේශ් ඇයට මවකට මෙන් ආදරය කළ නිසාදැයි තවමත් පරාක්‍රමට නම් වටහාගත නොහැකිව තිබිණ... එය නම් පුදුමයකි. පුංචි අම්මාට දරුවන් නොලැබෙන බව දැනගනිද්දී, ඇයට ලැබෙන සියල්ලම තමාට හෝ සොහොයුරු සොහොයුරින්ට නැතහොත් එඩ්වඩ්..., එනම් පුංචි මාමාගේ දියණියට හෝ ලැබෙතැයි සිතා සිටියද.... නැත... ඒ සිතූ කිසිවක්ම සිදුවී තිබුණේ නැත... ඇය කසාදයෙන් ඇය සතුව තිබූ සියල්ලම යළිත් සුදේශ්ගේ නමටම පිරි නමා තිබිණ... මවට පුංචි අම්මා එපා වූයේ එය දැනගත් පසුය...

හොඳ වේලාවට ඒ වෙද්දී පුංචි අම්මා ජීවිතයෙන් සමුගෙන තිබිණ... මවගේ අවලාද ඇසුවේ නම් පුංචි අම්මා මියයන්නේ ඒ අවලාද වලින් හෙම්බත්ව බව සිතෙද්දී පරාක්‍රමට තරමක සිනහවක්ද නැගුණේය...

සිතෙද්දී සිනහගියද, පුංචි අම්මා ඒ කළ ක්‍රියාව ගැන ඔහුගේ සිතටද යම් යම් අවස්ථාවල කහටක් එක්වී තිබුණේය... ඇය එවැනි බූදලයකින් කොටසක් හෝ ලීවේ නම් තමාට මෙයට වඩා හොඳ දිවියක් ගැන සිතන්නට ඉඩ තිබිණ...

පුංචි මාමා පිටරට සිටියද හොඳින් හරි හම්බ කළ බව නිවසේ නිතරම මෙන් කථා බහට ලක්වී තිබිණ... පුංචි මාමා වුවද මවට කැමැත්තක් දක්වූයේ නැත... මව වරක් පුංචි මාමාගේ බිරිඳ, නන්දා නැන්දාත්..., පුංචි අම්මාත් අතර වෙනත් කවරෙක්දෝ ගැන කළ

කථාබහකට අනවශ්‍ය අන්දමින් එක් වී නන්දා නැන්දාගේ සිත කඩා තිබෙන හෙයින් බව ඔහු දැනගත්තේ පසුවය...

නන්දා නැන්දා අසනීපයෙන් සිටි බවක් මවට ආරංචි වී තිබුණද, මව ඒ ගැන එතරම්ම නොසැලකුවාය... පුංචි මාමාට ලිපියක් යවන්නට තබා ඔහු හා කථා කරන්නටවත් ඇය උත්සුක නොවූ බව පරාක්‍රමට මතකය... පුංචි මාමා නැතිවූ බව දැනගනිද්දී වුවද මව එතෙක්ම ඒ ගැන වැඩි දුර විස්තර සොයාගෙන ගියේ නැත...

එහෙත් ඇය කාටවත් නොතේරෙන අයුරින්ම වෙනස් වූයේ පුංචි මාමා ඔහුගේ දියණියට ඔහුගේ සියල්ලම ලියා තිබෙන බව දැනගනිද්දීය...

ඇය වඩාත්ම කලබල වූයේ එහෙයින්ම විය යුතුය... මෙහි තිබෙන මහ ගෙදර අයිතිව තිබුණේ පුංචි මාමාටය... එය දැන් අයත් වන්නේද එහෙයින් ඒ දියණියටය... දැන් ඒ නංගීත් නන්දා නැන්දාත් මෙහි පදිංචියට ආ යුතුය... දන්නා අයුරින් නම් නැන්දා එහි රැකියාවක් හෝ කළේ නැත...

මවට අවශ්‍ය වූයේ නැන්දා හා දියණිය මෙහි ගෙන්වා ගෙන ඔවුන්ට හොඳින් සලකා මහ ගෙදර පදිංචියට යාමේ අදහස බව ඔහුට කීවේ මවය... ඒ අදහසට නම් ඔහුගේ අකැමැත්තක්ද නොතිබිණ...

එය විසල් නිවෙසක් බව පරාක්‍රම දැන සිටියේය...

ඉඳහිට පුංචි මාමාලා ආවහොත් එහි නවතින සිරිතක් තිබුණ හෙයින් එහි කොටසක් සැමදාමත් තිබුණේ වසා දමාය... ඉගෙන ගන්නා කාලයේදී නම් නිවාඩුවකට මෙන් යද්දී දිනක් දෙකක් එහි නවතින්නට ඔහු නම් පෙළැඹී සිටියේය... එහෙත් රැකියාවට යන්නට ගත්තාට පසු නම් එය බලන්නට වත් යන්නට නොහැකි විය...

එදා සිටම මහ ගෙදර කුලියට දී තිබුණේ වෛද්‍යවරයෙකුටය... දැන් එය අයිති වන්නේ නන්දා නැන්දාට හා දියණියට නම් ඔහු එයින් ඉවත් වෙනු ඇත...

එහෙත් එම නිවස අවසන් වරට කුලියට ගත් වෛද්‍යවරයා



පුංචි මාමා හා කථා කර තිබුණේ නැත... සියල්ලම පවරා තිබුණේ නීතිඥ සමාගමකටය...

සුදේශ් මුණ ගැසීමට පෙර පුංචි මාමාගේ මේ සියල්ල දැන ගැනීමට නම් එම නීතිඥ සමාගමට යායුතු බව පරාක්‍රම සිතුවද, රට ගියායින් පසු පුංචි මාමා ඒ සමාගමෙන් වෙනත් සමාගමකට සියලුම වගකීම් පවරා තිබුණ බව ඔහු සුදේශ් හමුවීමට පෙර දැනගත්තේ පළමු කී සමාගමේ ඔහුගේ පියා හඳුනන තැනැත්තෙක්ගෙනි....

විස්තර කීමට අළුත් සමාගම කැමැත්තක් දැක්වූයේ නැත...

නිවසේ ප්‍රශ්නය නිසා ඔහුද මේ ගැන සොයන්නට සිතුවේය... දැනට ඇති නිවෙස ගැන සිතෙද්දී අබලන් වූ නිවාසය යළිත් තනන්නට නම් එයින් ඉවත් විය යුතු බවද වැටහෙද්දීය... කුලියට නිවාසයකට ගොස් මෙය තනන්නට නම් ඔහුගේ රැකියාවෙන් හැකියාවක් තිබුණේ නැත... නන්දා නැන්දා වුවද මොන දේ සිදුවූවත්..., තමාට හා නංගීලාට නොසලකා හරිතැයි ඔහු සිතුවේ නැත... මහ ගෙදර අනික් කොටසේ හෝ පදිංචි වී මෙම අබලන් නිවාසය සාදා ගත යුතුය...

සුදේශ්ට වඩා තමාට ඒ නැන්දාගේ නෑකම දැඩිය... හරියටම නම් මවගේ මල්ලීගේ බිරිඳ ලෙසිනි... මව තමාට පෙන්වා දුන් කරුණ ඔස්සේ පරාක්‍රම කල්පනා කළේය... කෙසේ හෝ මව කීවා සේ නැන්දා හා ඒ දියණිය මුණ ගැසෙන්නට හැකි නම්...

ඔහු සුදේශ් සොයා ගෙන ආවේ අන්තිම තුරුම්පුව ලෙසය... මව කීවේ නම් සුදේශ්ගෙන් එම නීතිඥ සමාගම ගැනද විමසන ලෙසය... සුදේශ්ට වඩා ඒවා ගැන ඔවුන්ට දැන ගැනීමට අයිතියක් තිබෙන බව මව තර්ක විතර්ක ගෙන හැර පෑවාය... නැතැයි කිව නොහැකිය... තමාගේ මවගේ සොහොයුරිය ලෙසින් තමාට පුංචි අම්මා වන්නේ සුදේශ්ගේ කුඩම්මාය... කුඩම්මා යනු සුදේශ්ගේ අම්මා නොවේ... පුංචි මාමාගේද නෑකම ඇත්තේ පුංචි අම්මාටය... සුදේශ්ට නෑකමක් තිබුණද එය ලේ නෑ කමක් නොවේ...

එහෙත් සුදේශ්ගෙන් කිසිවක් අසන්නට ඔහුගේ සිතේ බියක් තිබිණ... සුදේශ් යන තැනැත්තා මේ කාටත් වඩා හොඳින් වැජඹෙන

Scanned by CamScanner

බව සිතෙද්දීය... වත්තට ගොස් තරමක් කරක් ගැසුවේ නම් තමාට කුමක් හෝ එදෙසින් දැන ගන්නට පිළිවන් වන බව ඔහු සිතුවේය... අනික සුදේශ් වුවද, තමාගේ කිසිවෙක්ම අපහසුවට පත් කරන කථාවක් කවදාවත් කළේ නැත... තමාට තනිවම වුවද වත්තේ නිවාඩුවක් ගත කිරීමට සැමදාමත් ඔහු අයිතිය දී තිබුණේය... සුදේශ් සිටියදී ගියහොත් තමාට හොඳින් සලකා කථා බස් කරන බව නම් පරාක්‍රමට මතකය... ඒ තරමක් කුඩා කළදීය...

දැනුදු එය එසේ වුවද..., සුදේශ්ගේ කවදත් ඔවුන් හා ඇඟෑලුම්කමින් යුතු සුහද කථාබහක් නම් තිබුණේම නැත... තිබුණේ නිළ කථාබහක් බව ඔහු සිතාගෙන සිටියේය...

දින දෙක තුනක් සුදේශ් හා වත්තේ සිටියහොත් බොහෝ දේ දැනගන්නට හැකි වනු ඇත... කෙළින් නොඅසා වටින්ගොඩින් අසද්දී සුදේශ්ගේ මුවින් නන්දා නැන්දලා ගැන කියවෙන්නට පිළිවන...

පුංචි මාමා ගැන සුදේශ් කිසිවක් නොදන්නේ යැයි මව මෙන්ම ඔහුද විශ්වාස නොකළේය...

සුදේශ්ගේ ආයතනයෙන් පාරට පිය මනිද්දී, ඔහුට පුංචි මාමාගේ දේපළ ගැන සොයා ගත හැකි කෙනෙක් මතක්විය... මෙම නව නීතිඥ සමාගමේ තමාගේ පියා වැඩ කරන බව කියූ මිතුරෙක් ගැන මතකයට නගිද්දීය... මිතුරාගේ නිවසට ගොස් එය පිළිබඳව විමසා ගත හැකි නම්...

පරාක්‍රම සිතමින් සිටියේ නැත... ඔහු මිතුරා සොයා ගෙන යන්නට බසයකට නැග ගත්තේය...

පරාක්‍රම පිටවෙද්දීම අයේෂාට දුරකථන පණිවිඩය ගත් සුදේශ් හවස ඇය සමුවීමට එන බව දන්වා..., ඔහු මෙතෙක්ම නොදන්නා එහෙත් ඔහු ගැන වඩාත් ඕනෑකමින් සෙවූ ඉලුක්කුඹුර නම් නීතිඥයා තමාගේ දුරකථනයට සම්බන්ධ කර දෙන්නැයි මොනිකා කැඳවා කීවේය...

තවත් මොහොතකට පසු ඔහුගේ දුරකථනය හඬ තැලුවේය...

"සර්... මිස්ටර් ඉලුක්කුඹුර..." මොනිකා දැනුම් දුන්නාය...



දුරකථනයේ බොත්තම එබූ ඔහු එය ඔහුට සම්බන්ධ කරගත්තේය...

"මිස්ටර් ඉලුක්කුඹුර..."

"කථා කරනවා..." එදෙසින් ඇසෙද්දී සුදේශ්ට සැනසිල්ලක් දැණිනා... නීතියට අවශ්‍ය වූ විට කවුරුත් ඉක්මණ් විය යුතු බව සිතෙද්දීය...

"මම... සුදේශ්... සුදේශ් නවරත්න... මිස්ටර් ඉලුක්කුඹුර මට කෝල් කරලා තිබුණා..."

"හාං... ඉයස් ඉයස්... මිස්ටර් සුදේශ්... සුදේශ් නවරත්න... අපි මීට කලින් මුණ ගැහිලා නෑ මං හිතන්නෙ..."

"නෑ... මිස්ටර් ඉලුක්කුඹුර... මොකක්ද ප්‍රශ්නෙ...?" සුදේශ් කෙළින්ම ප්‍රශ්නයට බසින්නට සිතුවේය...

"සුදේශ්... ප්‍රශ්නෙ මේ විදියට කථා කරන්න බෑ... මට මිස්ටර්ව මුණ ගැහෙන්න ඕන..."

"මාව...?"

"ඔව්... මිස්ටර් සුදේශ් නවරත්නව..."

ඔහු එය කීවේ සුදේශ්ට මග හරින්නට නොහැකි යමක් තිබෙන බව එම වැකියේ ස්වරයට ගැබ් කරවමිනි...

සුදේශ් මොහොතක් කල්පනා කළේය... දුරකථනයෙන් කියන්නට බැරි නම්...

"මං දැන් නං ඉන්නෙ ඔෆිස් එකේ... මිස්ටර් ඉලුක්කුඹුර ඉන්නෙ කොහේද...?"

"මාත් දැන් ඉන්නේ මගේ ඔෆිස් එකේ... ඒත් සුදේශ් එනවනං... මං ගෙදරදි මුණ ගැහෙන්න කැමැතියි... ඒ මොකද සුදේශ්ට දෙන්න ඩොකියුමන්ට්ස් වගයක් තියෙනවා... ඒවා ගෙදර තියලා ඇත්තේ... දැන් උනත් කමක් නෑ... මං ඉන්නේ..." ඔහු ලිපිනයක් කීවේය... සුදේශ් එය සටහන් කරගත්තේය...

ඉන්පසුව බිත්තියේ සටහන් පුවරුව දෙස බැලුවේය...

Scanned by CamScanner

"මං එහෙනං පහෙන් පස්සේ එන්නං... තුනට මං අහගත්තු වැඩක් තියෙනවා... ඒක ඉවර කරපු ගමන්ම..."

"කමක් නෑ... ඒ වෙලාව හොඳයි... මගෙත් වැඩ ටිකක් තියෙනවා... කොණක් පටක් කරලම එතැකි... එහෙනං පහට පහමාරට විතර මං සුදේශ් එනකං බලාපොරොත්තු වෙනවා..."

"කොයි වගේ දෙයක් ගැනද කියලාවත් කියන්න බැරිද...?" සුදේශ් යළිත් ඇසුවේය... තමා නොදන්නා නීතිඥයකු මෙලෙස තමා ගැන විමසිලිමත් වීම... එයටත් වඩා ඔහු ළඟ ලියවිල්ලක්ද ඇත... එය කුමනාකාරයේ ලිපියක්දැයි ඔහු සිතුවේ තරමක ගැඹුරිනි... නිවැරැද්දේ වුවද වැරැද්දක් සාදා ගන්නට නීතියට හොඳින්ම පිළිවන...

සුදේශ්ගේ කටහඬින්ම ඔහුගේ සිතිවිලි ඉලුක්කුඹුරුට තේරුම් ගියා වැනිය...

"කුතුහලයක තියන්න හදනවා නෙවෙයි සුදේශ්... ප්‍රශ්නෙ හිතාගන්න බැරි තරම් ගැටළුවක් වෙන්න ඉස්සෙල්ලායි මං වැඩට බහින්න හිතුවෙ... මෙච්චර කලක් මං සුදේශ්ට කරදරයක් නොකරම හිටියේ... දැන් බැරි වෙන්න යන්නේ... ටෙලිෆෝන් එකකින් නං විස්තර කරන්න බැරි වෙයි... විස්තර හරියට දෙන්න බෑ..." නීතිඥයාගේ සිතිවිල්ලද සුදේශ්ට තරමකට එම ස්වරයෙන් වටහාගන්නට පිළිවන් විය...

"මං ගේන්න ඕන මොනවා හරි විස්තර තියෙනවද...?" ඔහු ඇසුවේ ඉන්පසුය... සමහරවිට තව කවරෙක්ගෙන් හෝ තමාට ආ ලියකියවිලි නම් ඒ තැනැත්තාගේ එම අවශ්‍යතාවයට ලියූ ලිපිද තමා ගෙන යා යුතුය... සුදේශ්ට සිතුණු හෙයිනි...

"දැනට නැහැ... මට සුදේශ්ව මුණ ගැහෙන්නත් ඕන... අනික තනියම එනවනං වඩා හොඳයි... මං ගැන දැනගන්න ඕන නං... සුදේශ් අඳුනනවා නේද වසන්ත ජයවීර... එයාගේ කම්පැනි එකේ ලීගල් වැඩ කරන්නේ මගේ ජූනියර් ලෝයර් කෙනෙක්... මං යටතෙ..."

කුතුහලය මෙන්ම පුදුමයද ඉහවහා ගියද සුදේශ් ඒ තැනැත්තා මුණ ගැසෙන්නට යන්නට සිතුවේය. ඔහු වසන්තට ඒ ලෙසින්ම කථා



කළේය... ඉලුක්කුඹුර ගැන මඳක් විස්තර දැනගත්තේය... ඔහුට දැනගත යුතු වූයේ ඒ තැනැත්තා තමාට තර්ජනයක් දියත් කරන්නට..., නැතහොත් වෙනත් අයෙකුගේ සේවාවක් සඳහා තමාගේ ආයතනයේ සහය ලබාගැනීමටද යන්න ගැන තරමක් සිතා ගැනීමටය... ඉලුක්කුඹුර යනු කුඩම්මාද හොඳින් හඳුනන තැනැත්තෙක් බව කීවේ වසන්තය...

තමාට ඔහු ඒ බව නොකීවේ ඇයිදැයි සිතෙද්දී නම් සුදේශ්ට කුතුහලය දැඩි වූයේ, ඉලුක්කුඹුර නැමැත්තා සුදේශ් දැකීමට සිතුවාටද වඩා දැඩි ලෙසින් ඔහු දකින්නට ආශාවක් ආවේය... කුඩම්මාගේ කුමක් හෝ ප්‍රශ්නයක් විය හැකිදැයි යන්නද ඔහු සිතුවේ ඉන්පසුවය...

එසේනම් එය වැරැද්දක් විය නොහැකිය... කුඩම්මාගේ බොහෝ ලියකියවිලි සාදවා දුන්නේ ඔහු බැවිනි...

පරාක්‍රම අවුරුදු ගණනකට පසු තමා දැකීමට පැමිණීමත්, මෙම තැනැත්තාගේ මෙම කථාබහත් අතර කිසියම් සබඳකමක් හෝ ඇත්දැයි ඔහුට සැකයක් නැගුණේ තවත් මොහොතකට පසුවය... පුංචිමාමා පිට දමමින් පරාක්‍රම පැමිණියේ කුඩම්මාට ඇති අයිතියක්... හෝ වෙනත් යමක් ලබා ගැනීමටදැයි දැන් ඔහුගේ සිතේ තවත් පැණයක් ලෙසින් ලියැවුණේය...

එහෙත් ඔහු දන්නා පරිදි කුඩම්මාට ඇයගේ පැත්තෙන් නම් කිසිදු දේපළක් හෝ වෙනත් යමක් ලැබුණේ නැති බව ඔහු දැන සිටියේය... ඒවා ඒ පවුලේ පිරිමි දෙදෙනාට සමසේ බෙදාදී තිබුණ අතර..., මහගෙය අයත් වී තිබුණේ එඩ්වඩ් මාමාටය... ඔහු එය කවදත් හොඳින් නඩත්තු කළේය... අනික් මාමා සිටියේ අනුරාධපුර පැත්තේය... ඔහුගේ බිරිඳ ඒ පැත්තේ තැනැත්තියකි...

කුඩම්මාගේ පැත්තෙන් බැලුවහොත් ඇයට.... ඔහුගේ පියාගෙන්ද වෙනත් දෙයක් නම් හිමි වූයේ නැත... ඔහු කුඩම්මාට ලියා තිබුණේ කොළඹ විසල් නිවසම පමණකි... වත්තේ නිවස නම් ඇයට හැකි අයුරු වෙනස් කර ගැනීමට පියා අවසරය දී තිබුණේය... ඔහු එය වෙනස් කළේ කුඩම්මාගේ අදහස් අනුවය. කෙසේ හෝ ඇයට ලැබුණේ නම් කොළඹ නිවසම පමණකි... එයද කුඩම්මා මැරෙන්නට පෙර

Scanned by CamScanner

තමාට ලියා ඇති බව සුදේශ් දැනගත්තේ පසුවය.... ඇයට පියා දුන් මුදල් නම් ඇය වියදම් කළේම තමාගේ ඉගෙනීමටත්, නිවසේ කු මහත් කටයුතු වලටත් බව ඔහු දැනගෙන සිටියේය... ඇය කිසි දිනෙක සුදේශ්ට අයිති වූ ව්‍යාපාර වල මුදල් හෝ ඇයගේ අතට ගන්නට නොසිතුවාය... ඔහුට ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඉගෙන්වීමට ඇය සිතන්නට ඇත්තේද ඒවා එලෙසින්ම රැක ගැනීමට ඔහුට හැකියාව දීමටත් සමගම විය හැකිය...

පියා ඒවා කළේ කළමණාකරණය ගැන දැනගෙන නොවේ... එහෙයින්ම ඔහු පියාට වඩා ඉදිරියට ගියේය... පියාට ගත නොහැකි බොහෝ තීරණ සුදේශ් අර ගත්තේය... ඒ සියල්ලටම සැමදාමත් ඔහුට කුඩම්මාගේ ආශිර්වාදය ලැබී තිබිණ...

කුඩම්මාගේ ආදරය නම් තමාට කිසි දිනෙක අමතක කළ නොහැකි බව ඔහුට සිතුණේ දැන්ය... සමහරවිට ඇය එය ලියන්නට ඇත්තේ මෙම නීතිඥයා හරහා විය හැකිය... එහි නීතිඥ සමාගම ගැන නම් ඔහුට මතකයක් නොතිබිණ... ඒ ඔප්පුව ඇත්තේ නිවසේම විය යුතුය... කුඩම්මා නැති වෙද්දී වුවද එය කියා තිබුණේ නැත... ඔහු එය බාරගත්තේ කුඩම්මාගේ මරණින් සති කිහිපයකට පසු නීතිඥ සමාගමෙන් ඇවිත් ඔප්පුව අතට දෙද්දීය... එය ඔහු එලෙසම ඔහුගේ ලියකියවිලි කබඩයේ තැන්පත් කෙරුවා විනා ඒවා බලන්නටවත් ගියේ නැත...

සමහරවිට පරාක්‍රමලා හදන්නේ ඒ ගැන කිසියම් හෝඩුවාවක් ලබා ගැනීමටත් විය හැකිය...

දැන් පරාක්‍රමලාට නිවස අළුත් වැඩියා කරන්නට කාලය ඇවිත් ඇති බව ඔහු කණින් කොණින් අසා දැනගෙන සිටියේය... මොවුන් එම නිවස ඉල්වන්නට සදන්නේදැයි ඔහුට සාධාරණ සැකයක් ඇතිවී තිබිණ... නැතහොත් මේවා තමාටම මෙන් අයිති වූ නිසා ඒවා ගැනීමට හැකියාවක් ඇතැයි සිතමින් ඔවුන් නීතියේ පිහිට ඉල්ලා කිසිවක් ගොනු කළා වන්නටද පිළිවන... මේවා ගැන විස්තර ඔවුන් ගන්නට සදන්නේ පුංචිමාමාගේ බිරිඳ හරහා වන්නට පිළිවන... කුඩම්මා හා ඒ නැන්දා අතර තිබුණේ තද මිතුරු කමකි... එම මිතුරුකම නිසා ඇයට



බොහෝ දේ කුඩම්මා කියා ඇතැයි පරාක්‍රමගේ මව එනම්, කුඩම්මාගේ අක්කා සිතනවා වැනිය...

මඳක් දුරක් යනතෙක් සිත වෙහෙසුවද පිළිතුරක් නොදක්කෙන් ඔහු එය සිතින් අත්හළේ ඉලුක්කුඹුර නැමැත්තා හමුවුණු පසු ඒ සියල්ල දැන ගැනීමට හැකි නොවේදැයි සිතමිනි.

යළි අතර මැද නැවතී තැපැල් හලකින් දුරකථන පණිවිඩයක් ගෙන අයේෂාට කථා කළ ඔහු තමාට එන්නට හැකි වේලාවක් ගැන කිව නොහැකි බව දැන්වූයේය... නැතහොත් ඇය තමා එනතෙක් ප්‍රමාද වෙමින් සිටින්නට පිළිවන... අද ඇයත් ඔහු හා සමාජශාලාවට යන්නට සිටි හෙයිනි... තමා නැති වූවායැයි කියා ඇයට තනියක් නැත... තමා නැතිව තනියමද ඇය එහි යන්නීය... එහිදී තමා වෙනුවට ඇයට සහකරුවෙක්ද අනිවාර්යයෙන්ම හමුවෙන බව ඔහු දැන සිටියේය... තමා වුවද ඇය නැතිව යන කිසිම දිනයකදී සහකාරියක නැතිව තනි නොවූ හෙයිනි... අද දින රෑ දුම්රියේ ඇය කොහේ හෝ යන බවක් කියා තිබුණා ඔහුට මතක් වූයේ යළිත් වාහනයට නගිද්දීය...

දැන් එය ඇසිය යුතු වන්නේ සමාජශාලාවට රැයේ පණිවිඩයක් දුන් පසුව බව සිතාගත් ඔහු එයද සිතින් අත් හළේය...

Scanned by CamScanner

# තුන

**සුදේශ්** ඉලුක්කුඹරගේ නිවසට යද්දීද නීතිඥයා පැමිණ සිටියේ නැත... තරමක් විසල් කාර්යාල කාමරයකට ඔහු යොමු කරන ලද්දේ ඉදිරියේ සිටි සේවකයෙක් විසිනි...

"මිස්ට ඉලුක්කුඹුර...?" එහි සිටි තරුණියගෙන් ප්‍රශ්නාර්ථයකින් ඇසූ සුදේශ් හොඳින් වටපිට බැලුවේය...

විසල් කාමරයක් වූවද වැඩි දෙයක් එහි තිබුණේ නැත... පසෙක වීදුරු පියන් දැමූ කබඩයක සම්මාන හා පින්තූර තොගයක් තිබෙනු ඔහු දුටුවේ ය... විසල් පොත් කිහිපයකින් යුත් කබඩයක්ද තිබිණ... සියල්ලම නීති පොත් විය යුතුය...

"සර් නං තාම ඔෆිස් එකේ... මෙහෙට ආවෙ නං නෑ... මොකක් හරි...?"

"මගේ නම සුදේශ් නවරත්න..." ඔහු කීවේය...

තරුණියගේ මුහුණ සිනාවකින් ඔපවත් විය...

"වාඩිවෙලා ඉන්න මිස්ට නවරත්න..." කියාගෙනම ඇය නැගිට ගත්තාය... "මට මිස්ට නවරත්න එනවා කියලා කිව්වා... පොඩ්ඩක්



පරක්කු වෙන්න වෙයි කියලා කිව්වෙ දැන් පැයකට විතර ඉස්සෙල්ලම... එන්න මිස්ට නවරත්න..." ඇය ඇරයුම් කළේ කාර්යාල කාමරයේ පසෙක තිබූ දොරක් විවර කරමිනි...

එය වෙනම ඇතුල් ගැබක් වැන්නකි... එය පුද්ගලිකත්වය සලකාම සාදවා තිබුණු අයුරක් ඔහුට එහි ඇතුල්වෙද්දීම සිතිණ... සමහරවිට සමහර නඩු සඳහා පුද්ගලිකත්වය අවශ්‍ය නිසා මෙලෙස ස්ථානයක් තිබෙනවාද විය හැකිය...

"ඇතුළට ගිහින් වාඩිවෙලා ඉන්න..." ඇය කීවේ එම දොර හොඳින් ම විවර කිරීමෙන් අනතුරුවය...

ඔහු වාඩිවී පසෙක තිබුණු සඟරාවක් අතට ගත්තේය... එය විදේශීය නීති සමාගමක සඟරාවකි...

"සර් නං අද මුණ ගැහෙන්න බෑ..." ඇය ඉන්පසු පැමිණි දෙන්නෙකුටම මෙන් කියනවා ඔහු එහි සිටි අඩ පැයක කාලයකදී ඔහුට ඇසුණේය... "අද ඩිස්කෂන් එකක් තියෙනවා..." ඇය පසුව ආ තැනැත්තාට කීවාය... සමහරවිට ඔහු නිරතුරු මෙන් මෙහි එන්නෙක් විය යුතුය... සුදේශ් නිගමනය කළේ ඇයගේ බොහෝ සුහද පිළිගැනීමේ හඬ ගැන ඇසෙද්දීය...

මෙම නීතිඥයා තමා මුණ ගැසීමට... තනිවම තමා මුණ ගැසීමට මෙතරම් උනන්දුවක් දක්වන්නේ මන්දැයි දැන් කුතුහලය ඉහවහා ගොස් සිටි සුදේශ් සිතන්නට ගත්තේය...

ඔහු සඟරාව පෙරලුවා විනා එහි කිසිවක්ම සිතට ගන්නට හැකි වූයේ නැත... එහි තිබුණු විහිළු දෙකක් තුනක් බැලුවා විනා ඔහුට වෙනත් කියවන්නට යමක්ද එහි නොතිබිණ...

"මිස්ට සුදේශ් නවරත්න..." විනාඩි දහයකට පමණ පසු ප්‍රශ්නාර්ථයකින් කියමින් ඇතුල් වූයේ තරමක් වයසැති පුද්ගලයෙකි. සුදේශ් නැගිට්ටේය... "මම ඉලුක්කුඹුර... කෝල් කළේ මම..." කියමින්ම ඔහු අත දිගු කළේ සුදේශ් ඉදිරියේ සිට ගනිමිනි...

"ග්ලැඩ් ටු මීට් යූ..." කියමින්ම සුදේශ් අතට අත දුන්නේය...

"අපි උඩට යමු... නැත්තං මෙතන මගේ කටහඬ ඇහුණොත් අර ළමයට උත්තරයක් දීගන්න බැරි ප්‍රශ්න එයි..." කියූ ඔහු කාර්යාල කාමරයේ දොර ළඟ සිටගෙන මෙදෙස බැලූ යුවතියට කථා කළේය... "නයනා... එන කට්ටියට මම නැහැයි කියන්න... අර ඇතුළෙ ලොකර් එකේ තියෙන ආර් ආර් විසිහතර ගහලා තියෙන ෆයිල් එක ගෙනැල්ලා දෙන්න... මෙතන දොර වහන්න... ඒක දීලා..." එක දිගට කියමින් ඇයගේ අතට යතුරු කැරැල්ලක් දුන් ඉලුක්කුඹුර සුදේශ් පසුකර ගමන් ගත්තේ සුදේශ්ටද හිසෙන් පසුපසින්ම එන්නැයි කියමිනි... සුදේශ් ඔහු පිටුපසින්ම මෙන් පිය නැගුවේය...

උඩුමහලේ ඇතුළ් කාමරයකට ගිය ඉලුක්කඹුර නිදහසේ වාඩිවෙන අතරම සුදේශ්ටද අසුනක් පෙන්වූයේය... තරුණිය පැමිණ කුමක්දෝ ලාච්චුවක් නැතහොත් කබඩයක් අරින ශබ්දයත්..., ඉන්පසු කාමරයට එන අඩි ශබ්දයත් සුදේශ්ට ඇසිණ... පසෙකින් පැමිණි ඇය දෙස බැලූ සුදේශ් හාද මඳක් සිනහසෙමින්ම, ඇය ගෙන ආ ලිපිගොනුව ඔවුන් දෙදෙන ඉදිරියේ තිබූ ස්ටූලය මත තැබුවාය. යතුරු කැරැල්ලද පසෙකින් තැබුවාය...

"අපිට මොනවා හරි ඩ්‍රින්ක් එකක් හදවලා ගෙන්නලා දෙන්න දුව..." ඇයට කියූ ඉලුක්කුඹුර ස්ටූලය මතින් ලිපිගොනුව ගත්තේ, මඳක් පෙරළා බලා ඇය යනතුරු සිටියේය... ඉන්පසු සුදේශ් දෙස බැලුවේය...

"මට එන්න කිව්වේ...? මං වසන්ත එක්ක කථා කළා..." සුදේශ් කිව්වේය...

ඉලුක්කුඹුර සිනහසුණේය... සුදේශ් නැමැත්තා එලෙස කථා නොකළේ නම් එය වැරැද්දක් බව ඔහු සිතුවේය...

"එහෙම නං ඉතින් දන ඇඳුනුම් කම් කියන්න තරං දෙයක් ඕන වෙන එකක් නෑ නේ... මං ගැන දැනගන්න ඇති නේ... අපි කෙළින්ම ප්‍රශ්නෙට බහිමු සුදේශ්... කාලෙ අපතෙ යවන්න දෙයකුත් නෑ... ඒත් කිවයුතු කරුණු ටිකකුත් තියෙනවා මගේ ප්‍රශ්නෙට එන්න කලින්..." කියූ නීතිඥයා හොඳින් හරි බැසී ලිපිගොනුව යළිත් පෙරළා



බලා එලෙසම එය ස්ටූලය මතින් තැබුවේය... එය හරිම ලියැවිල්ලදැයි බලන්නට අවශ්‍ය වූවාක් මෙනි...

තමාට දිය යුතු කිසියම් ලියැවිල්ලක් වේ නම් එය ඇත්තේ මේ ලිපිගොනුවේය... සුදේශ් එය බලන්නට ඉක්මණ් වූණේ නැත... ඔහු නීතිඥයා දෙස බැලුවේය...

"මං මියුරි හොඳට අඳුනනවා..." ඔහු කියද්දී සුදේශ්ගේ සිතට ආවේ එසේනම් මේ කරුණ කුඩම්මාගේ කිසිවක්ම නිසා වන්නට ඇත යන්නය... එසේ නම් තමාට ඒ ගැන දැන ගැනීමටත් එයට ඉදිරිපත් වීමටත් කරුණු ඇත... එහෙත් සුදේශ් යමක් කියන්නට පෙර ඔහුම යළි කථා කළේය...

"ඇත්තම කියනව නං... ඔයාගේ තාත්තාව බඳින්න එපා කියලා මං එයාට කියලත් තියෙනවා... ඒත්... ඒත් එයා ඒක ඇහැව්වෙ නෑ... මියුරි කියන්නේ මගේ ලොකු නංගිගේ හොඳ යාළුවෙක්..."

පියා ගැන ඇසෙද්දී සුදේශ්ට සිනහවක් නැගිණ... කුඩම්මා හෙක්ටර් නැමැති තමාගේ පියා කසාද බඳිනවාට කැමැති වුණේ කුඩම්මාගේ නිවසේ අයම පමණක් විය යුතුය... ඒ කිමදැයි කීමට තරම් නම් සුදේශ් එකල දැන සිටියේ නැත... මුදලට විය යුතු බව ඔහුට සිතුණේ පසුවය...

"ලොකු නංගියි... මියුරියි... නන්දායි තුන්දෙනාම හොඳ යාළුවො..."

නන්දා කියන්නේ කවුදැයි සිතාගත නොහැකි වූ සුදේශ් දැස් හැකිළුවේය... එක්වරම සිතා ගැනීමට අසීරු තරම් විය...

"නන්දා කියන්නේ එඩ්වඩ්ගේ වයිෆ්..." ඉලුක්කුඹුර කීවේ නන්දා යැයි එක්වරම කියවෙද්දී දැන් සුදේශ්ට ඇයව සිහි කරගන්නට නොහැකි වූවා වත්දැයි සිතමිනි...

නන්දා යනු කුඩම්මාගේ පුංචි මල්ලී වන එඩ්වඩ් කසාද බැන්ද නැන්දාගේ නම බව සුදේශ්ට මතක් විය...

සුදේශ්ට සිනහවක් නැගිණ... පුංචි නැන්දා කීවා මිසක පසුව

පසුව ඇයගේ නම නම් සුදේශ් මතකයේ තබා ගත්තේම නැත... කුඩම්මා කීවේ නම් වෙන මොකක්දෝ නමකි... එහෙයින්ම පසුව නැන්දාගේ නියම නම සුදේශ්ට මතකයේ සිටින්නට නැත...

නන්දා නැන්දා... නන්දා නැන්දා... නන්දා නැන්දා... ඔහුට පළමුවර ඇය හඳුන්වා දෙද්දී කියවාගෙන ගොස් කුඩම්මාගෙන් ආදරයට ටොකු පාරක්ද කෑවා ඔහුට අමතක නැත... එහෙයින්ම ඔහුද ඇයට පුංචි නැන්දා කියන්නට පෙළැඹුණා විය හැකිය... ඔහුට සුසුමක් හෙළිණ...

කුඩම්මා අමතක කිරීමට තමාට බොහෝ අපහසුය...

"මතකද...?" ඉලුක්කුඹුර ඇසුවේය... ඔහු තරුණයාගේ මුහුණ වෙනස් වූ අන්දම හොඳින් නිරීක්ෂණය කරමින් සිටියේය... ඔහුගේ මුහුණට මතකය මෙන්ම කිසියම් වේදනාවක් වැන්නක්ද එක්වූ බව පරිණත නීතිඥයකු ලෙස මෙන්ම මිනිසුන්ගේ තරමකට වෙනස් වෙන මුහුණේ ඉරියව් ගැන හොඳින් හදාරා ඇති ඉලුක්කුඹුර තේරුම් ගත්තේය... ඒත් ඒ ඇයි යන්න ඔහු අසන්නට සිතුවේ නැත...

ඔහුට අවශ්‍ය මේ තැනැත්තාට නන්දා මතකයේ තිබේද යන්න පමණකි... එය ඔහුගේ ප්‍රශ්නයට අදාළය...

සුදේශ් හිස සැලුවේ මතකයේ තිබෙන නිසා බව ඔහුට වැටහුණේය...

"මං ඇත්තම කියනවනං... මේ ප්‍රශ්නෙදිත්... මේ වෙලාවෙදි වගේම... මගේ වයිෆ් කැමැති උනෙත් නෑ... ඒ වෙලාවෙදිත්... මේ වැඩේට... ඒත් සිංහල මිනිහෙක් උදව්වක් ඉල්ලනකොට පිටරටකදි ඒක මගාරින එක එච්චර හොඳ දෙයක් නෙමෙයි නිසා මං එදා වැඩේ බාරගත්තේ..."

මේ වැඩය කුමක්දැයි දැන් ඉහවහා ගිය කුහුලකින් යුතුව සුදේශ් නීතිඥයා දෙස හොඳින්ම බලාගෙන සිටියේය... නීතිඥයා ඔහුගේ කුහුල ගැන සිතන්නට ගියේ නැත... ඔහුට නොව දැන් සෑහෙන ප්‍රශ්නයක් ඇත්තේ තමාට බව නීතිඥයා කියන්නට නොගියේය...

"අනික තරහා උනත් මේක කියන්නත් ඕන... මේ වගේ බාරදූර



වගකීමක්... සුදේශ් වගේ තැනැත්තෙකුට දෙන එක හොඳද කියලා මං දෙපාරක් හිතන්නත් කල් ගත්තා... ඒ මොකද මං සුදේශ් මූණ ගැහිලා නැති උනාට... කීප දෙනෙක්ගෙන්ම සුදේශ්ගේ කල් ක්‍රියාව හොඳට දැනගෙන හිටියේ..."

සුදේශ්ට මඳක් කෝපයක් නැගිණ... තමාගේ කල් ක්‍රියාව හොඳ නැත්නම් තමාට ඒ බව කියන්නටම මොහු කථා කළේදැයි සිතමිනි... කුඩම්මා යමක් දැන් කීවා වෙන්නට නොපිළිවන... මේ තැනැත්තාට තමාගේ ජීවිතයේ අයිතියක් නැත...

"මිස්ට ඉලුක්කුඹුර කථා කළේ මගේ කල් ක්‍රියාවල් ගැන කියන්න නෙවෙයි කියලා මං හිතනවා... ඒ මොකද ඒ ක්‍රියාවල් නීතියට යන්න තරං වැරදි විදියට මං පාවිච්චි කරලා නැති නිසා..."

"සහතික ඇත්ත පුතා... හැම වැරැද්දක්ම නීතියට යන්නේ නෑ... නීතිය හැම වැරැද්දක්ම හොයන්න යන්නෙත් නෑ... එහෙම උනා කියලා වැරදි කරන මිනිස්සු නීතියෙන් ගැලවෙන්නෙත් නෑ... අපේ නීති පොත්වල නීතියෙන්ම නෙවෙයි... හෘද සාක්ෂියේ නීතියෙන්..."

"මිස්ට ඉලුක්කුඹුර මට එන්න කිව්වේ...?" නීතිඥයාගේ වැල් වටාරම් නවත්වා ගන්නට සිතූ සුදේශ් ඇසුවේ තද ස්වරයකිනි... නීතිඥයා සිනහසුණේය... කෘතහස්ත පරිණත බුද්ධියක් ඇති නීතිඥයාට සිනහවක් නැගුණේ සුදේශ් නැමැත්තාගේ සිතිවිලි කියවාගත හැකි වූ හෙයිනි... තමාගේ එම කියමන මෙම තරුණයාගේ සිතට තදින් දැණුනු බව ඔහුට විශ්වාසය...

"එන්න කිව්වේ වැදගත් දෙයකට... දැන් සුදේශ්ටත් නීතියට අනුව මං බොහොම බැරෑරුම් දෙයක් බාර දෙන්න යන නිසා... මං මේ වැඩේට කැමැති උනේම නෑ... මං ඉස්සෙල්ලත් කිව්වේ... ඒත්... මේක ලියවපු කෙනාගේ විශ්වාසයක් තිබුණා... සුදේශ් මේක හරියටම කරයි කියලා... ඒ විශ්වාසෙ ආවේ කොහොමද කියලා මං හිතුවේ පස්සේ... ඒක එන්න ඇත්තේ මියුරි හරහා... ඒ වගේම සුදේශ් මේකත් දැන් මට කියන්න හිතෙනවා... සුදේශ්ගේ යුතුකම් වගකීම් ගැන මියුරිගේ අදහසක් තිබුණ නං මොකක් හරි... ඒක වැරදි වෙන්න බෑ කියලා..."

Scanned by CamScanner

සුදේශ් නීතිඥයා දෙස විමසිල්ලෙන් බැලුවේය...

වෙනත් යමක් කියවෙන්නට පෙර සේවකයෙක් බීම වීදුරු දෙකක් බන්දේසියක තබාගෙන ආවේය...

"ගේන්න..." සේවකයාට හිසින්ද සන් කරමින් කියූ නීතිඥයා... "තියන්න..." ළඟාවූ සේවකයාට කීවේ සුදේශ් දෙස බලා... "ගන්න..." සුදේශ්ට කීවේ සේවකයාට යන්නට යැයි අතින් සංඥාවක් දෙමිනි... සේවකයා යනතුරුද ඒ දෙසම බලාගෙන සිටි ඔහු යළි සුදේශ් දෙස බැලුවේය...

"ගන්න..." දෙවන වරටත් ඔහු කීවේ සුදේශ් එය නොගෙන බලා ඉන්නා බව වැටහෙද්දීය... එලෙස කියමින්ම ඔහු එවර බන්දේසිය සුදේශ් පැත්තටම මෙන් ළං කළේය...

සුදේශ් වීදුරුවෙන් එකක් ගත්තේය... ඒ නීතිඥයා තමාට ළං කළ පැත්තේ තිබූ වීදුරුව නොව අනික් පැත්තේ වීදුරුවය... ඒ දෙස බලා සිටි නීතිඥයාගේ මුවට සිනහවක් නැගිණ...

"මේ ප්‍රශ්නෙ මං කථා කරන්න කැමැති නෑ... කාගෙවත් කණකට යන්න... සුදේශ් ඒ වෙලාවේ කථා කරද්දීත් මං කිසි දෙයක්ම කියන්න හිතුවෙ නැත්තේ ඒක... වසන්ත ගැන කියන්න මට හිතුණෙ නිකං... ඒත් මං එහෙම කියපු එක හොඳයි කියලා දැං තේරුං ගත්තේ..." කියූ නීතිඥයා එවර ඉතිරිවූ වීදුරුව ගෙන අඩක්ම එක උගුරට මෙන් බීවේය... සුදේශ්ට එවර අමනාපය තුරන් වී සිනහවක් නැගිණ... "මේ පැත්තෙන් මං කියන කාරණා ගැන දැනගන්න තරං කෙනෙක් නං ඒ වෙලාවෙ හිටියේ නැති උනාට ඒ පැත්ත ගැන මට හිතාගන්න බැරි උන නිසා... අනික එතන ඉන්නෙ කවුද කියලා මට අහන්නත් විදියක් නෑ... ඒ වෙලාවෙ මායි සුදේශුයි මේ විදියට මුණ ගැහිලා දැන ඇඳිනගෙන තිබුණෙ නැති නිසා..."

නැතැයි කියන්නට සුදේශ්ට නොහැකිය... ඔහු තරමකට සිනහවක් නගා ගත්තේය...

"සමහරවිට සුදේශ් එන්නං කියලාත් අද නැවිත් ඉන්න තිබුණා... කවුද කියලා හොයාගන්න කං..."



"මිස්ට ඉලුක්කුඹුර... මං ඇත්තටම පරිස්සං වෙන්නේ වෙන හේතුවක් නිසා නෙවෙයි... මට තියෙන වගකීම් වැඩි නිසා... සල්ලි වැඩි නිසා... මිනිස්සුන්ට... ගොඩක් අයට... හැමෝම නෙවෙයි... ගොඩක් අයට තේරෙන්නේ නෑ... සත දහයක ලාබයක් ගන්න අපි කොච්චර මහන්සි වෙනවද කියලා... හිතන්න... මං ලක්ෂ ගණන් ප්‍රොෆිට් එකක් ගන්නේ දැන්... ඉස්සෙල්ලා මාත් සෑහෙන්න බැට කෑවා... තාත්තා නැති වෙනකොට තිබුණා වගේ දහගුණයකටත් වඩා දැන් මං ලාබයක් ගන්නවා... මගේ යටතෙ ඉන්න ඔක්කෝටම යන එන මං නැති වෙනවා මං පරිස්සං නොවුණොත්..." සුදේශ් වියැකී යන සිනහවෙන් යුතුව බැරෑරුම් අන්දමින් කීවේය...

"මං පිළිගන්නවා... මේකත් ඒ ඔක්කෝටම වඩා භාරදූර වැඩක්..." භාරදූර යන්න බරකොට කියමින්ම නීතිඥයා ලිපි ගොනුව පෙරළුවේය...

"මීට අවුරුද්දකට ඉස්සෙල්ලා නන්දා නැති උනා... දන්නවද...?"

සුදේශ් අසුනෙන් ඉදිරියට විය... ඔහුගේ සිතට දැණුනු කම්පනය ඉලුක්කුඹුරුටද වැටහී ගියාක් වැනිවිය...

"නන්දා නැන්දා...?" සුදේශ්ට ඇසුණේ ඒ කම්පනයෙන්ම යුතු හඬකිනි...

නීතිඥයා හිස සැලුවේය...

"ඔව්... හිතන්න අමාරුයි නේද...? නන්දාට සනීප කරන්න බැරි විදියට අසනීපයක් ආවා... පෙණහැල්ලේ මොකක් හරි ප්‍රශ්නයක්... නන්දා ඒ වෙලාවෙදි ගත්ත තීරණේට එඩ්වඩ්ට එකඟවෙන්න උනා... එඩ්වඩුත් නන්දාගේ අසනීපෙන් වැටුණා... නන්දා නැති උනායින් පස්සේ එඩ්වඩ් මේක වෙනස් කරන්න හිටියේ... ඒත් පස්සේ ඒක එයා එහෙමම තිබ්බා... එඩ්වඩ්ට ඉදිරිය පෙනුණද... නැත්තං නන්දාගේ කැමැත්ත වෙනස් කරන්න බැරි කම නිසාද කියලා නං මං දන්නෙ නෑ... මං ඇහුවමත් මෙහෙමම තියමු කියලා කිව්වා..."

සුදේශ් සැබැවින්ම එය අසාගෙන සිටියේ කිසියම් සිතේ වේදනාවක්ද සමගිනි... තමාට කවදාවත් ඒ නැන්දා අමතක කරන්නට

Scanned by CamScanner

නොහැකිය... කුඩම්මා ගැන වැඩිපුරම හෙව්වේ බැලුවේ ඒ දෙදෙනාය... නිවසට නිරතුරු මෙන් ආවේ ගියේද ඒ දෙදෙනාය...

තමාට ඔවුන් ගැන සොයවන්නට වේලාවක් නැති විය... ඔහුගේ සිතට දැණුනු වේදනාව මුහුණින්ද පිටවෙන්නට ඇත...

පුංචි මාමාද නැතිවූ බව පරාක්‍රම කීවේය... එය අසන්නට පෙර නීතිඥයා කටහඬ අවදි කළේය...

"දැන් තමයි මං ප්‍රශ්නෙට එන්නේ... එඩ්වඩ් නැති උනා දැන් මාස අටකට විතර ඉස්සෙල්ලා..."

පුංචි මාමා... පුංචි මාමාත්.... පරාක්‍රම ආවේ එසේනම් ඒ ගැන දැනගෙනම වෙන්නට ඇත... එහෙත් පරාක්‍රම..., නන්දා නැන්දා නැතිවූ බව කීවේ නැත... දෙදෙනාම දැන් නැතිවූයේ නම් ඒ දෙදෙනාගේ දරුවා... දරුවා නොව දැරිය... ඔහුට දැඩි පීඩාවක් දැණින... පරාක්‍රම සොයන්නේ ඒ පිළිබඳවද...? දැන් ඔවුන් සිතන්නේ ඒ දැරියගෙන් ඇයට හිමි යමක් උදුරා ගැනීමටද...? කුඩම්මා නැතිවෙද්දී තමා තනිවූ බව... හදවතින් තනිවූ බව ඔහුට අමතක වෙන්නට තරම් කලක් ගියේ නැත... කුඩම්මා ගැන සිතෙද්දී තමා සැමදාමත් තනිවූවා වැනි හැඟීමක් තිබෙන බව ඔහු දත්තේය... [illegible] කීවද කුඩම්මා තමාගේ හදවතේ විසල් යමක් අත්පත් කරගෙන සිටි බව ඔහු ගේ සිතට වැටහී තිබිණ... ඒ යමක් අත්පත් කරගත් වෙනත් තැනැත්තියක හෝ තැනැත්තෙක් ගැන ඔහුට සිතාගත නොහැකිය... ඉතින් මේ දැරියටත් එලෙස වූයේ නම්... ඔහුට ඇය මතකයට ආවේ අඩි තුනක් පමණ උස කුඩා එහෙත් පුෂ්ටිමත් දැරියක විලසින්ම පමණකි... තමා තනිවූයේ හදවතින් පමණකි... තමාට බොහෝ අය වටපිටාවේ උදව්වට සිටින බව ඔහු දන්නේය... තමා පිරිමියෙකි... කුඩම්මා නැතිවෙද්දීද ඔහු සිටියේ අවුරුදු විසිනවයක් වැනි වයසකය... එහෙත් මේ දැරිය... දැන් වයස කීයක්දැයි ඔහුට මතක් කරගත නොහැකි විය...

"එතකොට ඒ දෙන්නට හිටිය බබා... එක්කෙනයි මට මතක හැටියට හිටියේ ඒ කාලේ... දුවෙක්..."

"එක්කෙනාම තමයි... දුවෙක්... සුදේශ්ගේ මතකෙ හරි... නන්දාට



වෙන බබාලා හදන්න එපා කියලා තිබුණා... මොකක් හරි හේතුවක් නිසා... වෙන අය ලැබෙන්න තරං... ශක්තියක් නෑ කියලා... මං හිතන්නේ අර පපුවෙ අමාරුව නිසාත් වෙන්න ඇති... අපිට දැනට ඒ මොකක් වත් වැදගත් නෑ... ඒ දෙන්නම නෑ..."

නීතිඥයා කීවේ උසාවියේ කථා කරන ස්වරයකිනි...

එයත් සැබෑවකි... ඒ දෙන්නා ගැන නොව දැන් කථා කළ යුත්තේ මේ දැරිය පිළිබඳවය... තමාට එන්නට කිව්වේ සමහරවිට ඒ ගැන කුමක් හෝ දැන ගන්නට විය හැකිය... ඇයට කිසිවක් දෙන්නට නැතහොත්...

"ඒ දුව... ඒ නංගි ඉන්නවද...? මට වඩා එයා ගොඩක් බාලයි මට මතක හැටියට..." සුදේශ් ඇසුවේ තරමක උනන්දුවකිනි...

අවම වශයෙන් ඇයට උදව්වක් කළ හැකි නම්... පරාක්‍රම තමාට ඒ ගැන නොකිව්වේ ඇයි...? ඔහුට එය කීවේ නම් ඔහුට ඒ මොහොතේම කොහෙන් හෝ ඒ ගැන හොයාගන්නටද තිබිණ... එක්වරම ඔහුට මතක් වුණේ පරාක්‍රම එය කීවේ දැන් පැය කිහිපයකට පෙර බවය...

පුංචිමාමා නැතිවූ බව දැනගත් විගස ඔහු එය කීවේ නම්... ඔවුන් එය දැනගත්තේ සතියකට පමණ පෙර නම්..., එදාම එය කියන්නට නොතිබුණේද...? ඔහුට පරාක්‍රමලාගේ නෑ පරපුරම විෂයයෙහි තරමක කහටක් දැණින...

"ඒකත් හරි... එයාට දැන් දාහතයි... සුදේශ්ට වඩා අවුරුදු දහතුනක් විතර බාලයි..."

"මයි ගෝඩ්... එතකොට ඒ ගර්ල් එයා... තවමත් එහේද...? කවුරුත් එක්කද ඉන්නේ...? තනියම ද...?" සුදේශ්ට එක දිගට ප්‍රශ්න වැලක් ඇසුණේ දැන් නම් තමා එම පවුල ගැන තරමක් හෝ නොසෙව්ව වැරදි බව සිතෙද්දීමය...

"එහේ එයා හිටියේ එඩ්වඩ් එක්ක යාළුවෙක්ගේ ගෙදරක... නන්දා නැති උනයින් පස්සේ... ෆැමිලි එකක් එක්ක... ඒත් එඩ්

Scanned by CamScanner

නැති උනයින් පස්සේ මේ ළමයා එහේ තියාගන්න ඒ ගොල්ලො ටිකක් අකැමැති වගේ උනා... තියාගන්නත් බැරි කමක් තිබුණා... ඒ මොකද ඒ ළමයට එහේ වියහියදමට තරම් මුදලක් හදලක් ආවේ නෑ... ඒ දෙන්නගේ යාළුවෙක් විදියට මං තීරණයක් ගත්තා... මං ඒ දරුවා මං ළඟට ගත්ත... එයා හිටියේ ඇත්තටම මෙහේ..."

සුදේශ් පුදුමයෙන් විසල්වූ දෙනෙතින් බලමින් පුටුවේ පසුපසට වුණේය...

"මෙහේ...?"

"ඔව්... ඇත්තටම නං මාස හයකට කිට්ටු තරම කාලයක්..."

සුදේශ් සැබැවින්ම එවර කුතුහලයකට පත්වුණේය... ඇය සිටියේ ලංකාවේ නම්... ඇයට මෙහි නෑදෑයින් ඇත... පරාක්‍රම ඒ බවක් කීවේම නැත...

මෙහි කුමක් හෝ හොරයක් ඇති බව ඔහුට සිතිණ...

"ඇයි...? එයාගේ අය ඉන්නවනේ...? පුංචි නැන්දලාගේ කට්ටියයි... එඩ්වඩ් මාමාගේ කට්ටියයි... තාම ඉන්නවනේ... ඒ ගොල්ල දන්නෙ නැද්ද... මෙයා ගැන... හෙවෙව්වෙත් නැද්ද...?" සුදේශ් ඇසුවේය... සැබැවින්ම නම් තමාට වඩා ඔවුන්ට ඇය ගැන ඇති අයිතිය දැඩිය... ඒ ඔවුන්ගේ ලේ නෑකමින් යුත් දැරියකි...

"හරි... සුදේශ්... දැන් මං කියන්න යන්නේ ඒක..." කියූ නීතිඥයා හොඳින් අසුනේ හරි බරි ගැසුණේය...

"සුදේශ් දන්නවද දන්නෙ නෑ... නන්දාට සෑහෙන බූදලයක් තියෙනවා... තිබුණා... ඒ බූදලේ දැන් එක එක්කෙනා බෙදාගෙන... එඩ්වඩ් නැතිවෙච්ච අළුතම වගේ මේ දරුවා ගැන ඒ ගොල්ලන්ට... ඒ කියන්නේ නන්දාගේ පැත්තේ අයට ගිහින් කිව්වේ මගේ මිසිස්... මං එතකොට මෙහේ නෙවෙයි හිටියේ... වයිෆ් මෙහේ ආවේ එයාගේ නංගිගේ වැඩ වගේකටත් එක්ක... ඒ ගොල්ලො දරුවා බාරගන්න කැමති උනේ නෑ... බූදලේ ලියවිලා තිබුණ හැටියට..."

"බූදලයක් නං බෙදෙන්නේ නඩු තීන්දුවකින් නේ... එතකොට...



පුංචි මාමා ලාස්ට් විල් එකක් ලියලා තිබුණේ නැද්ද...?" සුදේශ් සැබැවින්ම ඇසුවේ කුතුහලයකිනි...

"ලියලා තිබුණා... නන්දාගෙයි එඩ්වඩ්ගෙයි දෙන්නගේම දේවල්..."

"එතකොට මොකක්ද දැන් ප්‍රශ්නෙ... එහෙම ලියවිලා නං ඒ කිසි කෙනෙකුට මේවට අත තියන්න බෑ... ඒකට මොකක් හරිද...?"

"ඇත්ත... අත තියන්න බෑ... ඒත් හේතුවක් තියෙනවා... බූදල් කරනවට වඩා ලේසියි ඒවා භුක්ති විඳලා ගන්න එක... ඒ ගොල්ල හිතාගෙන ඉන්න ඇත්තේ එහෙම... ලාස්ට් විල් එකක් තියෙනවා කියලවත් ඒ ගොල්ල දැනගෙන ඉන්න නැතුව ඇති... දරුවා ඒ ගොල්ල ළඟ හිටියොත්... ඒ ගොල්ලට බූදල් කරනකොට මේ ගර්ල් ඉදිරිපත් කරන්න වෙනවා... ඒ ගොල්ලන්ට තේරුං යන්න ඇති මාත් දරුවා අතාරින්නේ නැති බව... ඇත්තටම මං ඒක කරන්නේ නෑ... නන්දා එඩ්වඩ් බැඳලා තියෙන්නේ තනි කැමැත්තෙන්... දන්නවත් ඇති නේ... ඒ ගොල්ල මට පෙන්නුවේ ඒ දේ විතරයි... ඒ ගොල්ල අකමැත්තේ කරගත්තු කසාදයක්..." කී නීතිඥයා යළි ඒවා හොඳින් අසාගෙන සිටින සුදේශ් දෙස යළි බැරෑරුම් බැල්මක් හෙලුවේය... ඒ සියල්ල හොඳින්ම තේරුම් ගත් හෙයින් සුදේශ් හිස සැලුවේය..

"ඒ කේ ප්‍රතිඵලේටත් ඒ ගොල්ල කැමැති නෑ... එච්චරයි... ඒ ගොල්ල අකමැත්තෙන් ඒ ළමයා මෙහේ ගෙනැල්ලා දාලා ප්‍රශ්නයක් උනොත්... කියලා මට හිතුණා... මට තවත් දරුවෙක් වැඩි නෑ කියලා මං ඒ දරුවා මගේ බාරෙට ගත්තා... ඒ මොකද මේ දුවත් එහෙදි හැදුණේ මගේ දුවත් එක්කම වගේ... අනික එඩ්වඩ් හම්බ කරපුවාත් එහෙමයි... ඒ දෙකම එකතු උනාම මේ දරුවට ලක්ෂ තිහ හතලිහක බූදලයක් එනවා... එන්නේ දහඅට පිරුණම... ප්‍රශ්නෙ ඒ පැත්තෙන් ටිකක් දුරදිග ගිය නිසා වයිෆ් ඒවා කියන්නත් ගිහින් නෑ... ඇත්තටම එයාත් අප්සෙට් වෙලා තියෙනවා ඒ කට්ටියගේ ආර්ගියුමන්ට්ස් වලට..."

"ඒ වෙද්දි එහෙනං නන්දා නැන්දා නැති උනා කියලා පුංචි මාමා කියලා තිබ්ලා නැද්ද...?"

Scanned by CamScanner

"නැහැ... ඒකත් ප්‍රශ්නයක් උනාළු... ඒ ගොල්ල කියලා තිබුණා... ඒ ගොල්ලන් අයින් කරපු අය ගැන හොයන්න බලන්න ඒ ගොල්ලන්ටත් ඕනා නෑ කියලා..."

"එතකොට පරාක්‍රමලගේ අම්මට හරි... ඒ පැත්තෙන් දෙන්නෙක් ඉන්නවනේ...?"

"ඒක ගැනත් මං හිතුවා... ඒත් ජීවත් වෙලා ඉන්දෙද්දි... එඩ්වඩ් විතරක් නෙවෙයි නන්දාත් ඒ ගොල්ල ගැන නං කැමැත්තකින් කථා කරේම නෑ... මං ඒක නිසා ඒ පැත්ත අමතක කරා... නන්දා කිව්වෙම ඒ කට්ටිය හිතුවොත් හිතන්නේ ඒ ගොල්ල ගැනම විතරයි කියලා... අනික සල්ලි... නෑනා සල්ලිවලට ටිකක් කෑදරයි කිව්වාත් එක්ක..."

නැතැයි කීමට නම් සුදේශ්ට නොහැකිය... පරාක්‍රමගේ මව සෑමවිටම කථා කරන්නේ ආත්මාර්ථකාමී අන්දමකිනි... මුදලක් ලැබේ නම් ඇය නොකරන වරදක් නැත... ඒ ඇයගේ ගති ස්වභාවයය...

"එතකොට මේ ගර්ල්ට බාර කාරයෙක් නැද්ද... විල් එකක් ලිව්වා නං බාර කාරයෙකුත් ඇති නේ...?" සුදේශ් ඇසුවේය.

නීතිඥයාගේ කට කොණකට සිනහවක් නැග්ගේය...

"දාලා තිබුණා... මම ලාස්ට් විල් එක ලිව්වෙ..."

"ඉතින් එහෙම නං ඒ බාර කාරයාට මේක කිව්වේ නැත්තේ ඇයි...?" අසද්දී සුදේශ් මඳක් කල්පනා කළේය... සමහරවිට බාරකරු හැටියට නම් කළේ කුඩම්මා නම්...

"බාර කාරයා මමීද...?" ඔහුට ඒ ලෙසින්ම ඇසුණේ වෙනත් යමක් සිතෙන්නටත් පෙරය... එසේනම්... එසේනම්... දැන් කුඩම්මා නැති හෙයින් ඇයට බාර කරුවෙක් නැත...

"මමී කිව්වේ...?" එවර නීතිඥයා ඇසුවේ කුතුහලයකිනි...

"මං කුඩම්මාට කථා කළේ ඒ නමින් තමයි හැමදාම... එයා මට අම්මා කෙනෙක් වගේම නේ..." සුදේශ් කීවේ තරමක් වේදනාවකිනි...

ඔහුගේ දෙවැනි වැකියට නීතිඥයාට තරමක පීඩාවක් වැන්නක් දැණුනද... සුදේශ්ගේ සිතට තරමක කුතුහලයක් දෙවමින් ඔහුගේ මුහුණට සිනහවක්ද නැගී තිබිණ...



"මැරිච්ච මනුස්සයෙකුට ළමයෙක් බාර දෙයිද මොළයක් තියෙන මිනිස්සු... නන්දා මැරුණෙ මියුරිට පස්සෙ..." ඔහු ඒ සිනහවෙන්ම කීවේය...

සුදේශ්ටද සිතිවිලි විසුරුවමින් සිනහවක් නැගිණ...

"එහෙනං ඒ බාර දුන්න එක්කෙනා දැන් හොයාගන්න නැද්ද...? නැත්තං..."

"ඉන්නවා... ඒත් එයා ගැන මට විශ්වාසයක් තියන්න පුළුවන්ද නැද්ද කියලා මං මාස තුනක් තිස්සෙම කල්පනා කළා..."

එසේනම් නීතිඥයා තමා ගෙන්වන්නට ඇත්තේ ඒ තැනැත්තා මුණ ගැසීමට යාමට විය යුතුය... ඒ දැරියගේ කෙනෙක් යැයි දැන් මේ අයුරින් ඉදිරිපත් විය හැක්කේ තමාට පමණි...

"කමක් නෑ... මාත් බලන්නං... මට පුළුවන් එහෙම දේකදි ඉදිරිපත් වෙන්න... මුදලින් උනත්... මං කැමැතියි ඒ ළමයට උදව්වක් දෙන්න... එයාට මට කෙළින්ම ලේ නෑකමක් නැතත්... ඒ මමීගේ මල්ලිගේ දුව කියන එක මං මතක නැති කරලා නෑ... ඒ දෙන්නම නැත්තං මට පුළුවන් ඒ ගර්ල්ට උදව්වක් කරන්න... අනික මමීයි ඒ නැන්දායි අතරෙ බොහොම ළඟ යාළු කමක් තිබුණා කියලා මං දැනගෙන හිටියා..."

නීතිඥයා බොහෝ ඕනෑකමකින් සුදේශ්ගේ මූහුණ දෙස බැලුවේය...

"මමීට... මියුරිට සුදේශ් බොහෝම කැමැති වගේ...?" නීතිඥයා නැගුවේ ප්‍රශ්නාර්ථයකි.

"ඕව්... මමී නැති උන දවසේ තමයි මං ඇත්තටම තනි උනේ..." සුදේශ් කීවේය... එය ඔහු කීවේ මුළු හදවතින්ම බව පරිණත පුද්ගලයාට දැණින... ඒ තරමටම ඒ කටහඬේ කණස්සල්ල හා පසුතැවිල්ල ගැබ්වී තිබිණ...

සුදේශ් තමා ඇසූ තරමටම නරක පුද්ගලයෙක් විය නොහැකි බව ඔහු සිතමින් සිටියේය... කොතනක හෝ වැරැද්දක් සිදුවී ඇත...

නීතිඥයාගේ විමසුම් ඇස දෙස බලමින්ම සුදේශ් කථා කරගෙන ගියේය...

"මමී මට අවවාද කර කර හිටියේ නෑ... ඒත් මට හොඳට ඉගැන්නුවා... ඉස්සරහට බය නැතුව යන්න... බිස්නස් එක තනියම රන් කරගන්න... යමක් තනියම කරගන්න... මමී නැති උනයින් පස්සේ.." සුදේශ් දෙවුර හැකිළුවේය... "මට තේරුණා මගේ ජීවිතේ තරමක අඩුවක් ආව බව..."

ඒ අඩුව තවමත් පුරවන්නට සමතෙක් හෝ සමතියක් නැති බව සුදේශ් නොකීවද නීතිඥයා වටහාගත්තේය...

"මට ඇත්තටම සතුටුයි සුදේශ් මියුරි ගැන මේ වගේ කථාවක් කිව්වට... ඒ මොකද දූන් ඇත්තටම මේ ළමයා ඔයාටත් වඩා තනිවෙලා... ඒ ගෑනු ළමයෙක්... සුදේශ් පිරිමියෙක්... එතන වෙනසක් තියෙනවා... සුදේශ් ඉන්නේ මෙහේ... ඒ ළමයට මෙහේ වැඩිය පුරුද්දකුත් නෑ..."

නැතැයි කිව නොහැකිය... තමාගේ පැත්තෙන් බැලුවහොත් තමා වටා බොහෝ අය ඉන්නා බව සුදේශ්ට අමතක කළ නොහැකිය... ඔහුගේ අම්මාද තවමත් ජීවත් වන්නීය...

ඔහුට අයේෂා නම් ඒ මොහොතේ මතකයට ආවේ නැත... ඔහුගේ මතකයට ආවේ ඔහු දරුවෙක් මෙන් බලාකියා ගත් බොහෝ දෙනෙක් තවමත් ජීවත් වන බවය...

"දූන් එතකොට ඒ ගෑනු ළමයා ඉන්නේ කොහේද...? මෙහේද...?" ඔහු ඇසුවේ එසේනම් ඇය හා කථා කර මෙය විසඳන්නට හැකිය යන සිතිවිල්ල ආ හෙයිනි...

"නෑ සුදේශ්... ඇත්තටම මටත් ප්‍රශ්නයක් ආවා... මගේ දූවගේ ස්ටඩීස් වලට මට පිට යන්න වෙලා තියෙනවා... මගේ වයිෆ් ගියා... මට ඉන් පස්සෙ මේ ළමයා තියාගන්න තැනක් නැති නිසා මං එයාව තැනක නතර කළා... ගෑනු ළමයිම ඉන්න තැනක... කොන්වන්ට් එකක..."



"එයා බුද්ධාගමේ නේද...?"

"ඔව්... ඒත් මෙහේ එහෙම තැන් නෑ නේ... මගේ වයිෆ් කැතලික්... එයා තමයි එතනට මෙයාව දැම්මේ... අනික ඉතින් එයාට ඒ පැත්ත ගැනත් දැනුමක් තියෙනවා... හිටියේ වෙන වෙන රිලිජන්ස් තියෙන ළමයි එක්කමනේ... ඒක එයාට ප්‍රශ්නයක් නෑ..."

"බාරකාරයා හොයාගන්න නැද්ද...? එහෙනං මොකක් හරි කරගන්න උනත් තිබුණා..." සුදේශ් කීවේය...

"බාරකාරයා ගැන මං හොයාගත්තා... මං හිතාගෙනම හිටියේ දරුවාට දහඅට පිරෙන කං ඉඳලා මේ දේවල් ගැන කියලා දෙන්න... ඒත් දූන් ඒ ළමයා පරිස්සං කරගන්න ඕන තත්ත්වයක් ඇවිල්ලා තියෙනවා... මං ඒක හින්දා කල්පනා කළා බාර කාරයාට ඒ ගැන දැනුම් දීලා ඒ දරුවගේ කැමැත්තකට ඉඩ දෙන්න... ඒ දරුවත් මොළේ නැති දරුවෙක් නෙවෙයි..."

නීතිඥයා සමහරවිට තමා මෙලෙස එක් කරගන්නට සිතුවේ බාරකාරයා ලෙස දමා තිබෙන තැනැත්තා සොයා ගැනීමටද විය හැකිය...

"බාරකාරයා පිරිමියෙක්ද ගැනියෙක්ද...?" ඔහු ඇසුවේ දූන් ඒ පැත්ත තරමක් පැහැදිලි කරගැනීමට සිතමිනි...

"පිරිමියෙක්... නම හැටියට දාලා තියෙන්නේ... ඉද්දමල්ගොඩ නවරත්න මුදියන්සේලාගේ සුදේශ් විජය නවරත්න... නොහොත් අයි එන් එම් එස් වී නවරත්න..."

Scanned by CamScanner

# හතර

**නමින්** අඩක් කියවෙද්දී සුදේශ් නැගිට වාඩිවුණේය... තමා භාරකරු වශයෙන් දමන්නට තරම් ඒ දෙදෙනට තදවුණු පිස්සුව කිමෙක්දැයි සිතෙද්දීය... තමා ගැන ඇති තරම් කථා ඔවුන්ද නොඇසුවේ යැයි සිතිය නොහැකිය... අනික දාහත් වියැති ගැහැනු ළමයෙකුට...

සමහරවිට තමා විවාහ වී ඇති බවක් ඔවුන් සිතුවා වත්ද...?

"මිස්ට ඉලුක්කුඹුරට විශ්වාසද...?" ඔහුට ඇසුණේය...

"විශ්වාස නොකර කොහොමද සුදේශ්... ලියුවෙ මම නේ..." සුදේශ්ට සිනහවක් නංවමින් නීතිඥයා කිවේය...

එහෙත් ඒ ලෙසම සුදේශ්ගේ සිනහව වියැකිණ... ඔවුන් තමා ගැන තැබූ විශ්වාසය මහමෙරක බරක් සිතට එක්කළ බව පමණක් ඔහුට සිතිණ...

ඔහුට සුසුමක් හෙලුණේ නිතැතිනි...

තමා මෙවැනි යුවතියකගේ බාරකරු ලෙස සිතන්නේ කෙලෙසද...? අම්මාට බාර දුනහොත්... එහෙත් මේ යුවතිය කෙසේ හැදුණු වැඩුණු යුවතියක්දැයි නොසොයා එලෙස කිරීමද බියකරුය...



සුදේශ් නීතිඥයා දෙස බැලුවේ තරමක ව්‍යාකූල දැසකිනි.

"සුදේශ් ඇත්තටම මං හිතාගෙන හිටියේ වෙන විදියකට... මගේ යාළුවා වෙනුවෙන් උදව්වක් කරනවා කියලා... මේ දුවට දහඅට පිරෙන කං මෙහේ තියාගෙන ඉඳලා... දහඅට පිරුණ දවසට සුදේශ්වත් ගෙන්නගෙන එයාගේ කැමැත්තත් අරගෙන මොකක් හරි කරන්න කියලා... ඒත් එහෙම කරන්න බැරි විදියට ප්‍රශ්න දෙක තුනක් ආවා..."

"ප්‍රශ්න දෙක තුනක්...?"

"ඔව්... පළවෙනි එක මගේ වයිෆ් ගිය එක... ඒත් මං හිටිය නිසා මට ගිහින් ගිහින් ඒ දරුවා ගැන හොයන්න බලන්න පුළුවන් උනා... දෙවෙනි එක... කොන්වන්ට් එකේ නිවාඩුවට වත් මට ඒ දරුවා දූන් මෙහේ ගේන්න බෑ... ඒකට හේතුවක් තියෙනවා... ඒක තමයි තුන... මට වැදගත්ම උනේ ඒක.., මේ දරුවා ගැන හොයන්න දූන් කට්ටියක් දඟලනවා..."

"කට්ටියක්...?" පුදුමයෙන් ඇසූ සුදේශ්ට එවර පරාක්‍රමගේ පැමිණීම මතක් වුණේය... ඔහුද යළි අසුනේ හරි බරි ගැසුණේය... කුඩම්මාද මෙම දියණියට බොහෝ ආදරය කළ බව ඔහුට මතක් විණ... ඇය මෙම දූරියට ඇඳුම් පවා මසා තැපැල් කළ බව ඔහුට මතකය...

...ඕන්න... අපි නැති උන දවසක ඔයා තමයි නංගිව බලාගන්න ඕන... නේද නන්දා... තමාගෙන් ඇය වරක් ඇසුවේ නන්දා නැන්දා මෙන්ම එඩ්වඩ් මාමාද ඉදිරියේය... එකල බොහෝ විට කුඩම්මා ඇයගේ මිතුරියට ඇය අමතන නමින් කථා කළේ නැත... ඔහුට ඒ නම මතකයේ නැත...

...බැරියැයි... බත් ටික කවා ගන්න පුළුවන් උනොත්... ඔහු එදා කීවේ ඒ නංගීට බත් කවන්නට කුඩම්මාත් නැන්දාත් සෑහෙන මහන්සියක් ගන්නා බව දැන සිටි බැවිනි... එදා එඩ්වඩ් මාමා නම් මහ හඬින් සිනහසුණේය... තමාට ඒ වෙද්දී වයස දහසයක් හෝ දහහතක් බව ඔහුට මතකය... සමහරවිට කුඩම්මා ඒ දියණියට ආදරේ කළේ ඇයට ඒ වයසේ දරුවෙකුගේ සුරතල් බලන්නට නොලැබුණ නිසා

විය හැකිය... තමා ඇයට ළං වෙන විටද එම වයස ඉක්මවා තිබිණ... ඔහුගේ සිතට එවර දැණුනේ වේදනාවකි... කුඩම්මා බොහෝ දේවල් කරන්නට සිතාගෙන ඉන්නට ඇත...

...මං බත් කන්නෙ නෑ... එදා ඇය තමාට කීවා ඔහුට මතක් විය...

...එහෙම කියලා බෑ... කන්න වෙයි... කියමින් ඔහු පසෙකට ගිය බව නම් ඔහුට මතකයේ ඇත...

ඔහුගේ මුවට සිනහවක් නැගුණේ ඒ මොහොතේදීය... තමා බාරකරුට දැමීමට ඒ දෙදෙනම සිතන්නට ඇත්තේ එහෙයින් විය යුතුය...

"කට්ටිය කියන්නේ එහෙනං හද්‍රා නැන්දලා... පරාක්‍රමගේ අම්මා...? එහෙමද...?" ඔහු ඇසුවේ පරාක්‍රමගේ පැත්තෙන් එවර මෙම යුවතියට කරන්නට දඟලන වින්නැහිය කුමක්දැයි සිතමිනි... දාහත් වියැති යුවතියකට...

"ඒ ගොල්ලො විතරක් නෙවෙයි සුදේශ්... නන්දාලාගේ අයියාගේ පැත්තෙනුත්..."

"ඒ පැත්තේ අය ගැන නං මං වැඩිය දන්නෙ නෑ... ඒ පැත්තෙන් ඇයි...?"

"දරුවට ආදරේට නෙවෙයි... බූදලේට... ඒ ගොල්ල හිතන්නේ නන්දාගේ ඒවා පිට නොදෙන්න... මේ ගොල්ල හදන්නේ එඩ්වඩ් හම්බ කරපුවායි මහ ගේයි ගන්න..."

"ඒත් දැන් ලාස්ට් විල් එකක් ලියලා නං එහෙම ගන්න බෑ නේ මෙයාගේ වයස පිරුණයින් පස්සේ ඒවා මේ ගර්ල්ට නේ යන්නේ...?"

"වයස පිරෙන කං ගන්න බෑ... ඒත් එයිට ඉස්සෙල්ලා එයත් එක්ක යාළු උනොත්.... කසාදයකින් බැඳෙන්න පුළුවන්... මේ පැත්තෙන් පරාක්‍රම... අනික් පැත්තෙන් ඉන්නවා වරුණ කියලා මැන් කෙනෙක්... නන්දාගේ අයියාගේ පුතෙක්... ඒ දෙගොල්ලම මේ මරණ ගැනයි... බූදල් ගැනයි... ළමයා නැවතිලා ඉන්න තැනයි ගැන හොයවනවා..."



"දැනගෙන තියෙන්නේ කාගෙන්ද...? මෙච්චර කල් දන්නෙ නැත්තං...?"

"ඒක අහම්බෙන් වෙච්ච වැරැද්දක්... එඩ්වඩ් හිටිය ගෙදරට ආව ගිය එබ්‍රෝඩ් හිටිය යාළුවෙක් ආවා ළඟදී... මැන් දන්නවා පරාක්‍රමගේ තාත්තාව... එහේ නිකමට ගිහිල්ලා තියෙන්නේ... එයා තමයි කියලා තියෙන්නේ මෙයා නැති වෙලා කියලා විතරක් නෙවෙයි... නිකමට කියවෙලාත් තියෙනවා කෙල්ල නමට ඔක්කෝම ලියලා තියෙන්නේ කියලා... ඒ ගොල්ලන්ට පෙණුනේ මහ ගේයි වත්තයි... එහෙදි නන්දා නැතිවෙච්ච බව ඒ ගොල්ල දන්නෙ නෑ... ඒක අර මැන් කියලත් නෑ... කියන්න අමතක වෙන්නත් ඇති..."

"එතකොට ඒක නන්දා නැන්දලගේ පැත්ත දැනගෙන තියෙන්නේ කොහොමද...?" සුදේශ් කල්පනා සහගත ලෙසින් ඇසුවේය... එසේනම් සතියකට පමණ පෙර දැනගත්තා යැයි පරාක්‍රම කීවේ එහෙයින් විය යුතුය... සුදේශ්ට සිතිණ... සුදේශ්ට යමක් කමක් එක්වරම කල්පනා වෙන බව නීතිඥයාට සිතිණ... නැතිවත් නොහැකිය... ඔහු දියත් කරන්නේ බොහෝ ගාම්භීර ව්‍යාපාරයකි...

"ඒක වෙලාව... වරුණ අඳුනන එකෙක් එහේ ඉඳලා තියෙනවා... කථාව ගිහින් තියෙන්නේ මැන් ගෙන්... එයත් නිකමට කියලා තියෙනවා මෙහෙම එඩ්වඩ් නැති වෙලා කියලා... ඒ පැත්තට... ඒ ගොල්ලො මාව නෙවෙයි කන්ටැක්ට් කරේ... එඩ්වඩ්ගේ ගෙදර රෙන්ට් ඇග්‍රිමන්ට් එක ගැස්සුව ලෝයර්ව... මට විස්තරේ කිව්වේ ලෝයර්... හරියටම නං ගිය සතියෙ මුල වගේ තමයි මේ ප්‍රශ්නෙ ආවෙ... මට දවස් දෙක තුනක් ගියා සුදේශ්ගේ ටෙලිෆෝන් නම්බර් එක හොයාගන්න... ඇඩ්‍රස් එක විතරයි මට දීලා තිබුණෙ... එහෙට ගිය මගේ මැන් කියාගෙන ආවා එහේ කවුරුත් නෑ කියලා..."

"මමී නැති උනායින් පස්සේ කවුරුත් නෑ... මං එහේ යන්නෙ ඉඳහිටලා නේ..." සුදේශ් කීවේය...

"ඕව්... ඒක කියලා තියෙන්නේ වොචර්මන් කෙනෙක්... එය නම්බර් එක දන්නෙ නෑ කිව්වළු..."

"එහෙනං ඒක තමයි මට කියලා තිබුණා කවුරු හරි ආවා කියලා මාව හොයාගෙන... ඒත් ඒ වෙලාවේ මගේ ලේඩි සර්වන්ට් ඉඳලා නෑ... නමක් ගමක් වත් කියලා නැති නිසා මං හොයන්න ගියෙත් නෑ..."

"මට මේ නම්බර් එක දුන්නෙ ඇත්තටම වසන්ත... මං වසන්තගෙන් නිකමට ඇහුවේ... අඳුනනවද කියලා..."

"වසන්ත මගේ තරමක යාළුවෙක්..." කියූ සුදේශ් එවර නීතිඥයා දෙස හොඳින් බැලුවේය... "දැන් මේ ගර්ල්ගේ නම මොකක්ද...?" සුදේශ් ඇසුවේ දැන් ඉතින් මෙයට තමා ඉදිරිපත් විය යුතුම බව සිතෙද්දීය...

නීතිඥයාට සිනහවක් නැඟුණද එය නවතා ගත්තේය... වසන්ත ඔහුගේ හොඳ යාළුවෙකැයි කියන්නට සුදේශ් නොසිතූ බව සිතෙද්දීය... එක් අන්දමකින් බැලුවහොත් සුදේශ් බොරුවක් කියන පුද්ගලයෙක් යැයි කියන්නට නුපුළුවන... නැතහොත් තමා ඔහු හොඳින්ම හඳුනන බව කියන්නටද තිබිණ... ඔහු එලෙස කීවේ නැත... දෙවන වරටද නීතිඥයාට සිතුණේ සමහරවිට නන්දා මොහු ගැන හොඳින්ම දැන සිටින්නට ඇත යන සිතිවිල්ලය...

"විස්තර මේ ෆයිල් ඒකේ ඇති... මේක රහසිගතයි... මේක සුදේශ්ගේ කොපිය... මගේ කොපිය මං ළඟ තියාගත්තා... ඒ ළමයට දහඅට පිරෙන්න තව මාස නවයක් විතර තියෙනවා... එතකං ඒ ළමයා පරිස්සං කරගන්න ඕන..."

සුදේශ් කටකොණකට සිනහසෙමින් ලිපි ගොනුව දිග හැරියේය... නීතිඥයා තමා ගැන සොයවන්නට ඇත්තේ එහෙයින්ම විය යුතුය... තමාගේ වගකීම් ගැන දෙසා බාන්නටද ඇත්තේ එහෙයින්ම විය යුතුය... එහෙත් ඔහුට සුසුමක් හෙලුණේ එහි දාතම දකිද්දීය.

එය ලියා ඇත්තේ කුඩම්මාගේ මරණයෙන් මාස හතකට පමණ පසුවය...

මෙලනි නීලියා ප්‍රනාන්දු...

ඔහු ලියැවිල්ල කියාගෙන ගියේය... බාරකරු වූයේ ඔහුය...



දහඅට සපිරෙන තෙක් කීවද එතනින් පසු වූවද යුවතියක පාරට දමිය හැකිදැයි ඔහු කල්පනා කළේය... මේ එංගලන්තය හෝ ඇමෙරිකාව නොවේ... ඇය විවාහ වනතුරුම ඔහුට ඇයගේ වගකීම දරන්නට සිදු වෙනු ඇත...

සුදේශ් එය කියවද්දී නීතිඥයා ගොස් තවත් ලිපිගොනුවක් ගෙන ආවේය... ඇවිත් වාඩි වුණේය... දැන් ලියැවිල්ල මොහු කියවන්නේ දෙවෙනි වරට විය යුතුය... ඔහුට සිතුණේය...

ඒ මොහොතේදී නීතිඥයා කල්පනා කළේ මේ තැනැත්තාගේ කියැවීමේ වේගය ගැනය...

එම දිගු ලියැවිල්ල කියවීමට ඔහුට පැය කාලක් වත් නොගිය බව සිතෙද්දීය... ඔහු දෙවන වර කියෙව්වේ ඔහුට තවත් පැහැදිලි කරගත යුතු තැනක් දෙකක් බව පරිණත පුද්ගලයාට වැටහිණ...

මෙහි යුවතිය ගැන වැඩිමනත් විස්තර නැත... සමහරවිට ඔහු දෙවන වර කියෙව්වේ ඇය ගැන විස්තරයක් සොයා ගන්නට සිතමින්ද විය හැකි බව නීතිඥයා සිතුවේය...

එවරද නීතිඥයා නිවැරදි විය... සුදේශ් සෙව්වේ යුවතිය ගැන විස්තරයක් එහි ලියැවී තිබේදැයි යන්නය... එහි දැක්වී ඇත්තේ බූදලය හා වෙනත් වත්කම් ගැන මිස යුවතිය ගැන නොවේ... ඇය ගැන කිසිදු විස්තරයක් මෙහි ලියැවී නැත... අවම වශයෙන් අධ්‍යාපනය ගැන හෝ...

තමාට ඇය ගැන වගකීම ගත හැක්කේ ඇය කිනම් අන්දමේ යුවතියක්දැයි සිතා ගැනීමෙන් පසුවය... කෙසේ වූවත් දැන් තමාට මෙම ප්‍රශ්නයෙන් ලිස්සා යැමට නම් නොහැකිය... එහෙත් ඉලුක්කුඹු නැමැති මෙම පුද්ගලයා දෙස බලද්දී ඔහුද මේ ගැන මොනරම් ව විඳින්නේ මෙම යුවතිය විසේකාර යුවතියක නොවන නිසා වි... කි යන සැකයද දැන් ඔහුගේ සිතට නැගුණේය...

"මං හිතන්නේ මට තව විස්තර ටිකක් දැනගන්න පුළු වෙයි නේද...?" සුදේශ් ඇසුවේ ලියැවිල්ල තිබූ ලිපි ගොනුව ව උකුල උඩ තබා ගනිමිනි...

Scanned by CamScanner

"ඔව්... ඔකේ තියෙන්නේ බූදලේ ගැන විස්තරයයි බාර කාරයා
බාර දීමෙ වගකීමයි විතරයි..."

"දහඅට වෙනකං කිව්වට මිස්ට ඉලුක්කුඹුර... ඉන් පස්සෙ
උනත් ගෑනු ළමයෙක් පැත්තකට දාන්න බෑ නේ... පිරිමි ළමයෙක් න
මේක වෙනයි..."

නීතිඥයාට සිනහවක් නැගිණ... "කරෙක්ට්..." ඔහු කීවේය...
"එහෙනං ඉතින් දැන් බලමු මොනවද දැනගන්න ඕන විස්තර කියලා..."
ඔහු පැවසුවේ සුදේශ්ගේ බාහිර තත්ත්වය කෙසේ වෙතත් ඇතුළාන්තය
බොහෝ පිරිසිදු විය යුතුය යන්න සිතමිනි... මෙය ඔහුගේ බිරිඳ තම
කියා තිබිණ... නන්දා මෙලෙස මොහු ගැන ඇසූ සියලුම කථා පසෙකට
ලා ඔහු විශ්වාසයට ගනිමින් මෙලෙස ඇයගේ දුවගේ බාරකාරයා
ලෙස ලියූ මෙම පුද්ගලයා..., යුවතියකගේ වගකීමක් දරා ගත හැකි
කෙනෙක් විය යුතුය යන්න ඇය පෙන්වා දී තිබිණ... පිටතින් සුදු
බොහෝ දේ ඇතුළත බලද්දී කළු බව ඇය කීවාය... උපාසක බළල්ලු
නේ මීයෝ දෙන්නා දෙන්නා අල්ලන්නේ... ඇය ප්‍රස්ථා පිරුළකින්ද
ඔහු දැනුවත් කළාය...

ඔහුට සුදේශ්ගේ පැණයෙන් මේ සියල්ලම මතකයට
නැගුණේය...

"මෙයා දැන් මෙහේ මොනවද කරන්නෙ...? මං අහන්නේ
එඩියුකේෂන් එක ගැන...?" සුදේශ් ඇසුවේය... නීතිඥයා තරමක්
කල්පනා කාරීවූ බව දැණුනද ඔහු එය ගැන සිතන්නට නොගියේය...

"දැනට එයා එච් එස් සී කරනවා... එත් මං හිතන්නේ නෑ
එයාට මෙහේ කරගන්න පුළුවන් වෙයි කියලා... එයා මගක් දුර යද්දි
නේ මෙහේ ආවේ... ඒක ගැන කථා කරලා මොකක් හරි කරන්න... ඒ
දුවට ෆ්‍රෙන්ච් එහෙමත් පුළුවන්... එයා සෙකන්ඩ් ලැන්වේජ් එකක්
හැටියට කළේ ඒක... ජර්මන් එහෙමත් කළා... දන්න තරමින් එයා වැඩ
කළා පාට් ටයිම් මොකක් හරි බියුරෝ එකක... ඒ නිසා ලැන්වේජස්
දෙක තුනක් ඉගෙන ගත්තා ටික ටික..."

"සිංහල...?"



"සිංහල හොඳට පුළුවන්... කථා කරන්න... ඉක්මණට ලියන්න
නං එච්චරම බෑ මං දන්න තරමින්... ඒත් විභාග නං පාස් කරලා
නැතුව ඇති... කථා පොත් එහෙම කියවනවා... මට මදර් කිව්වා...
මෙහෙන් දැම්මා සිංහල... ඒත් තාම රිසල්ට්ස් ආවෙ නෑ නේ... ආං...
තව ටයිපින් ෂෝර්ට් හෑන්ඩ් පුළුවන්... ඉංග්ලිෂ්..."

"ඒක නං හොඳයි... මගේ කම්පැනි එකේ මොකක් හරි වැඩකට
උනත් දාගන්න බැරි යැයි..."

යළිත් නීතිඥයාට සිනහවක් නැගිණ... ඔහු සිනහසෙමින්ම
ඔහුගේ අතේ තිබුණ ලිපිගොනුවෙන් ගත් ලිපියක් සුදේශ්ට දිගු කළේය...

"මේ තියෙන්නෙ එතන කොන්වන්ට් එකේ මදර්ට මගේ
ලියුම සුදේශ්ව අඳුන්නලා දීලා... දුව එක්ක කථා බහ කරලා මට
විස්තර දන්නන්න... ඒ මොකද මෙතනදි මම පුද්ගලිකවම ඒ දරුවගේ
ප්‍රශ්නෙට මූණ දෙනවා... දුව අකැමැති උනොත් සුදේශ් ගැන... නීතියට
වැරැද්දක් කළා නොවෙන්න වෙන පැත්තක් හිතන්නත් වෙනවා... අර
අයගෙන් මේ දරුවාව බේරගන්න නැතුව වෙන ක්‍රමයක් නෑ..."

තමාගේ සිතිවිල්ල නිවැරදිය... යළිත් සුදේශ්ට සිතිණ... ඇය
හොඳ යුවතියක විය යුතුය... නැතහොත් මෙවැනි පුද්ගලයෙක් මෙලෙස
ඇය ගැන වද විඳින්නට නොසිතන බව සුදේශ්ට හොඳින්ම
වැටහුණේය...

"මං එහෙනං අනිද්දාට තරම යන්නං මෙතනට..." සුදේශ්
කීවේ දැන් ඒ යුවතිය රැගෙන එන්නේ නම් ඇයව බලා කියා ගැනීමට
මෙහෙකාරියක් හෝ රැගෙන ආ යුතු බැවිනි... නිවසේ නම්
මෙහෙකාරියක් ඇත... එහෙත් එවැන්නියකටම පමණක් යුවතියකගේ
වගකීම පැවරිය නොහැකිය... නිවසට ගොස් සියල්ල සකසා අනිද්දා
උදයේම මෙම ගමන යායුතුය...

"අනිද්දට...?" නීතිඥයා ඇසුවේ මෙම ප්‍රමාදය කුමක්දැයි
සිතමිනි...

ඔහු මේ නීලියාගේ වගකීම ගැන වඩාත් බියවී සිටියේය...
ඔහුගේ බිරිඳ සිටියේ නම් බියක් නැත... ඔහු නීලියාට කිසිවක්ම මේවා

ගැන කිව්වේ නැත... ඇයගේ නෑදෑයින් ගැන ඇයගේ සිතේ කහටක් එක්කරලීමට ඔහු කැමැති වූයේ නැත... එහෙයින්ම නීලියා නෑදෑයින් ගැන සිතද්දී ඔවුන් සමග යන්නට තරම් පිළිවන් කමක් තිබෙන්නට හැකිය...

"ඔව් ඇත්තටම නං... මං යන්න ඕන මෙයා ගේන්න බලාගෙනම නේ... මට එයාව එක්කගෙන එන්න වෙන්නේ කොළඹට... මෙහේ එයාව බලාගන්න තරං එක්කෙනෙක් නෑ... වගකීමක් ගන්න පුළුවන් ගෑනු කෙනෙක් වත්තෙන් ගෙන්න ගන්න ඕන... මෙහේ ඉන්න කුස්සිඅම්මාට ඒ වගේ වගකීමක් දෙන්න පුළුවන් කෙනෙක් නෙවෙයි..."

නීතිඥයාට සිනහවක් නැගිණ... සුදේශ්ගේ කල් ක්‍රියාව ගැන ප්‍රචාරය කෙසේ වූවද, ඔහු යමක් කමක් සිතා මතා කරන්නට අඩු ගණනේ උත්සාහයක් දරණ බවවත් වැටහීමෙනි... නන්දා සමහරවිට ඒ ගැන දැන සිටින්නට ඇත... ඒ නැතත් එතරම් පාලනයකින් යුතුව විශාල ව්‍යාපාරයක් දියත් කරමින් තිබෙන මොළයක් ගැන සැක සිතන්නටද හැකියාවක් නැත... ඔහුද සුදේශ් මෙන්ම දෙවන වරටත් වටහා ගත්තේය...

"ඔයා හිතුව හැටි හරි... හැබැයි මේ ගැන කාටවත් වැඩිය කියන්න එපා... මේ ළමයා හැංගුවොත් කොහේ හරි... මටත් ප්‍රශ්නයක් එනවා... සුදේශ් කසාද බැඳලා නැති බව දැනගත්ත නිසා මම දුවව එහේ තිබ්බේ... ඒත් බාරකරුට නොකියා මට ඉස්සරහ ගැන හිතන්න බෑ... දැන් යන ක්‍රමේට... අනික් පැත්ත බල වැඩියි... නෑදෑයෝ නිසා... සුදේශ්ට බේරා ගතෑකි... සුදේශ් ඉන්නේ බාරකරු තනතුරේ..."

සුදේශ් අයේෂා මුහුණ ගැසෙන්නට ගියේ නැත... දැන් ඔහුට එයට වඩා ප්‍රශ්නයක් ඇවිත් තිබිණ... කුඩම්මා තමාට දැක්වූ ආදරය වෙනුවෙන් මෙම නන්දා නැන්දාගේ දියණිය ගැන ඇති භාරකරත්වයේ භාරදූර වගකීම ඔහුගේ සිතට තද පීඩනයක් එකතු කර තිබුණේය...

දැන් අසරණ වී ඇති මෙම යුවතියට ඇත්තේ ඔහුගේ පිහිටම පමණක් බව සිතෙද්දී ඔහුට අයේෂා මුණ ගැසීමට වඩා මෙම ප්‍රශ්නයේ



විසඳීමක් ලැබ ගැනීම සිතට එකඟ සිහිවිල්ලක් වී තිබිණ... ඔහු නිවසට ගියේය... මේ කොන්වන්ට් එක නොහොත් කන්‍යාරාමය පැත්තේ සිටින තමාගේ යහළුවෙක් ගැන ඔහුට මතකය... දින කිහිපයක්ම ඔහු හා එකතුවී විනෝද ගමන් ගිය බවද ඔහුට මතකය... දැන් ඔහු සිතාගත්තේ එම යහළුවා මුහුණ ගැසෙන්නට ගොස් එක්වරම එම කොන්වන්ට් එකට යායුතු බවය... අයේෂාට කථා කළ ඔහු එදින හදිසි වැඩක් යෙදුණ හෙයින් පැමිණීම බලාපොරොත්තු නොවන ලෙස දැන්වූයේය...

දින දෙකකට පසු ඇයද මිතුරු මිතුරියන් කිහිපදෙනෙක් සමග ත්‍රිකුණාමලයේ යන බව ඇය කීවාය...

"අද යන්න හිටියේ... එක්කෙනෙක්ට එන්න විදියක් නෑ කිව්වනේ..." අයේෂා කියද්දී මෙවැන්නක් කරපිට නොපැටවුණේ නම් තමාටද එයට එක්වෙන්නට තිබුණ බව මතක් වූ සුදේශ්ගේ සිතට තරමක කණස්සල්ලක්ද නැගිණ...

ඇය එන දවස හෝ අසන්නට ඔහුට අමතක වූයේ එහෙයිනි...

Scanned by CamScanner

# පහ

**ඔහු** එදා කොළඹ නිවසට ගියේ සති දෙකකට පමණ පසුය...

"මහත්තයා අද හදිසියේ...?" අසමින්ම ගේට්ටුව විවර කළ මෙහෙකරුට සිනහසෙමින් ඕහු කාරය වත්ත තුළට ගත්තේය...

"අද මහත්තයා ඉන්නවද...? නැත්තං යනවද...?" කුස්සි අම්මා ඇවිත් ඇසුවාය...

"අද ඉන්නවා..." කියමින්ම ඔහු උඩුමහළට නැග්ගේ කාමරයේ දොර හැරියේය... මිතුරාගේ ලිපිනය සොයා ගැනීමටද තරමක කාලයක් ගත වනු ඇත... තමා නැතිව වුවද නිවස හොඳින් තබා ගැනීමට සියලුම සේවකයෝ යුහුසුළු වෙති...

ඔහු මිතුරාගේ දුරකථන නම්වරය බැලීමට පරණ දිනපොත් ඇවිස්සුවේය... එම මිතුරාගේ නම තමාගේ දින පොත් දෙකකම නැති බව ඔහුට මතකය...

මිතුරා අවසන් වරට මෙම නිවසට ආවේ කුඩම්මාගේ තුන් මාසයේ දානයේදීය... ඉන්පසු ඔහුට එහි යන්නට නොහැකි විය... මිතුරාට ඒ දෙසින්ම රැකියාවක් ලැබිණ... ඒ නැතත් ඒ දානයෙන් පසු



මිතුරා පරාක්‍රම හා මඳක් එකතුවූ බවක්ද දක්නට ලැබීම නිසා ඒ දිනවලදී සුදේශ්ගේ සිතේ මිතුරා කෙරෙහි තරමක නොමනාපයක් හටගෙන තිබිණ... එහෙයින්ම ඔහු එම මිතුරාගේ සමාගමය තරමක් දුරට අත් හළේය...

එහෙත් මේ මොහොතේ එම අමනාප නොමනාප ගැන සිතමින් සිටීමට හැකි කමක් නැත...

ඔහු මිතුරාගේ නම්වරය ඇති පොත සොයා ගනිද්දී සෑහෙන කාලයක් ගතවී තිබිණ... දුරකථන අංකය සොයා ගනිද්දී රාත්‍රී දොළහටත් ළං වී තිබුණ තරම්...

මේ මහ රෑ යාමයේ දුරකථන පණිවිඩයක් දුනහොත් ඒ නිවැසියන් බිය වන්නටද පිළිවන... ඒ නැතත් මෙම අංකය ඔහුගේම නිවසේ අංකයක්ද නොවේ... මෙය මිතුරාගේ නැන්දාගේ උප තැපැල් හලේ අංකයය... ඔහු ඉන්පසුදා උදයේම එම අංකයට කථා කරන්නට සිතුවේය...

මිතුරාට කථා කරන්නට ලැබෙද්දී උදය අට පසුවී තිබිණ...

"මචං... මදැයි මතක් උන කාලේ... මට නං ඉතින් මතක් උනත් එන්න වෙලාවක් තිබුණෙ නෑ... අනික අපි ඉතින් එනවනං බස් එකේම එන්නත් එපැයි..." මිතුරා කථා කරන්නේ සුදේශ් බව දැනගත් ගමන්ම කියාගෙන ගියේය...

"උඹේ නම්බර් එක හොයාගත්තෙත් අමාරුවෙන්... උඹ මේ පිස්සු කියවන්න එපා... මට උනත් එහෙමයි... කාරෙකක් තිබුණා කියලා මං එහේ මෙහේ යන්නේ නෑ... වත්තට යනවා එනවා මිසක්.. වත්තට යන්න උඹලගේ පැත්තෙන් ඇවිල්ලා මොකෝ පරංගිය කෝට්ටෙ ගියා වගේ යන්නයැයි..."

"හරි... ඉතින් උඹ මොනවා කිව්වත් පිළිගන්නම වෙනව මට..."

"කොහොමද දූන් අක්කා එහෙම... නංගි බැන්දද...?"

"උඹ අහන්නේ අක්කලා නංගිලා ගැන විතරයි..."

"නැත්තං... මං ආච්චිලා සීයලා ගැන අහන්නයැයි... පස්වලට යට කරපු... මට මතක් උනා දෙන්නා එක්ක සුප් කියලා තැම්බුං හොද්දක් මට පෙව්ව හැටි..."

මිතුරා සිනහසෙන්නට ගත්තේය... එක්වරම තමාගේ අවශ්‍යතාවය අසන්නට නොහැකි කමක් සුදේශ්ට දැණිනි... ඔහු ඒ හෙයින්ම තවත් විනාඩි දෙක තුනක් ඔහුගේ මිතුරාගේ මෙන්ම තමාගේ විස්තරද තරමක් හුවමාරු කරගත්තේය...

"දැන් නං උඹ මේ කථා කරේ තැම්බුං හොද්දක් හදාගන්න වෙන්න බෑ..." මිතුරා කීවේද විනාඩි දෙක තුනකට පසුවය...

"නෑ මචං... මට මේ ඔය පැත්තේ තැනක් ගැන දැනගන්න ඕන... ආවොත් උඹ එක්ක නොගියත් යන්න පුළුවන් තරමට... මට විස්තරේ ඕන..."

"මොකක්ද...?"

"මේ කොන්වන්ට් එක..." සුදේශ් එහි නම හා ලිපිනය කිව්වේය...

"ඒක මේ පැත්තෙ එකක් තමයි... තියෙන්නේ නං..." මිතුරා ඒ පැත්තේ වත්තක නමක් කීවේය... "ඒ එස්ටේට් එක පැත්තේ..."

"උඹලගේ පැත්තට වඩා ටිකක් දුරයි නේද...?" සුදේශ් ඇසුවේ ඔහුට වත්ත ගැන මතකයක් තිබෙන බැවිනි...

"මචං... මට දැන් මතක් උනේ... ඊයේ රෑ... හතට විතර පරාක්‍රමකාරයත් මගෙන් ඕකම ඇහැව්වා... මොකද දැන් උඹලා අයියාලා මල්ලිලා දේව කන්‍යාවෝ හොයන්න වගේ යන්නේ...?"

සුදේශ් කෙළින් වුණේය... පරාක්‍රම මෙය ගැන දැනගත්තේ කෙසේද...? ඉලුක්කුඹුර කීවා වෙන්නට නොහැකිය...

"පරාක්‍රම...?"

"පරාක්‍රම තමයි... උඹේ අර මල්ලි කෙනෙක් හිටියේ... මාත් එක්කත් ටිකක් ෆිට් වෙච්ච පොර... දානෙ දවසෙ..."



"මට මැන් ව නං හම්බ උනේ නෑ... මොකටද මැන් මේක ගැන දැනගන්න යන්නේ කියලා... මට මේක දුන්නේ මගේ යාළුවෙක්... එතන මමීගේ යාළුවෙක් දැන් ටීච් කරනවා කියලා... මට ඕන එයාව හොයාගන්න... සමහරවෙලාවට මැන්ටත් ඒ යාළුවා කිව්වද දන්නෙ නෑ... මමී කියන්නේ ඉතින් එයාගේ පුංචි අම්මානේ... මටත් කියන්න ඇති... මගේ යුතුකම නේ ඒ සිස්ටර් හොයාගන්න එක..." සුදේශ් ඕනෑවට එපාවට මෙන් කීවේය...

"මං එතන කට්ටිය නං අඳුනන්නේ නෑ මචං... පාර නං කියන්න පුළුවන්..." කියූ මිතුරා එවර එයට යන පාර කීවේය...

පරාක්‍රම එම පාර එලෙසම දැනගන්නට ඇත්තේ ඊයේ රාත්‍රියේ නම් දැනටමත් ඔහු ගමන අරඹා තිබෙන්නට පිළිවන... එහෙත් ඔහු යායුත්තේ බසයේය... තමා කාරයේ යද්දී..., ඒත් දැන් හෙට වනතෙක් ඉවසිය නොහැකිය... නීතිඥයා කී විලස පරාක්‍රම මෙන්ම අනිකාද පන්නන්නේ බූදලය පසුපසය... යම් හෙයකින් තමාගේ නම ගාවා පරාක්‍රම ඇයව...

ඔහුගේ සිත ගිනි ගත්තේය... ඇය තමාගේ රුව හෝ දැක නැත...

"රයිට් මචං... මං පස්සෙ කථා කරන්නං... මොකද මැන්ට මේක හදිසියි කිව්වා..." කියමින්ම දුරකථනය විසන්ධි කළ සුදේශ් වෙනත් කිසිවක්ම ගැන නොසිතා එවෙලෙහිම අනික් අතට මොනිකාට කථා කළේය...

මොනිකා කාට හෝ දුරකථනයෙන් කථා කරනු වැනිය... ඔහු එය විසන්ධි කළේය... කාර්යාලයයේ අනික් දුරකථනයට කථා කොට මොනිකාට තමාට ගන්නටයැයි කියන්නට සිතද්දීම එවර දුරකථනය නද දුන්නේය...

ඔහු එය සවණට තබා ගත්තේය...

"සර්..."

මොනිකා... සුදේශ්ගේ සිත සැහැල්ලු විය...

"ඉයස් මොනිකා... මං මේ ඔයාට ගන්න ගියා විතරයි... එන්ගේජ් තිබුණා..."

"මං සර්ව කන්ටැක්ට් කරන්න ට්‍රයි කර කර හිටියේ... අදත් මිස්ට පරාක්‍රම ආවා..."

"පරාක්‍රම...? කොයි වෙලාවෙද...?"

"මං මෙතනට එනකොටත් එයා ඇවිත්... හත විතර... මං අද ටිකක් වේලසනින් ආවා සර් උදෙන්ම එන්නෙ නෑ කියලා කිව්ව නිසා... සර් එන්න පරක්කු වෙයි කියලා කිව්වම... එහෙනං එනකං ටිකක් වෙලා ඉඳලා හරි යන්නං කියලා කාමරේ වාඩිවෙලා හිටියා... පැය කාලක් විතර ඉඳලා... මං පහළට ගිහිල්ලා එනකොට එයා එළියට ඇවිත් හිටියා... ආයේ එහෙනං හවස එන්නං කියාගෙන ගියා..."

"මිස්ට ඉලුක්කුඹුර ගෙන් මොකක් හරි පණිවිඩයක් ආවද...?"

"නෑ සර්..."

පරාක්‍රමගේ ආගමනයේ කිසියම් හොරයක් ඇත... තමා කාර්යාලයයට එන්නේදැයි නොඑන්නේදැයි හරියටම දැනගන්නට සිතුවා වැනිය...

කාර්යාලයයේ වැඩ කටයුතු ඒ මොහොතේම එහි සිටම් දුරකථනයෙන්ම කථා කොට දෙවෙනියාට පැවරූ ඔහු හැඳ පැළඳ ගත්තේ කාරයට නැග්ගේය... ඔහුට දැන් හැකි ඉක්මණින්ම එම කන්‍යාරාමය සොයා ගත යුතුව තිබිණ...

යුවතිය නොව ඔහුට දැන් අමතක කරන්නට නොහැකිවී ඇත්තේ නන්දා නැන්දා තමා කෙරෙහි තිබූ විශ්වාසය හා වගකීමය...

නන්දා නැන්දා පමණක් නොවේ...

එඩ්වඩ් මාමා... පරාක්‍රමගේ අම්මාට වඩා ඔහු තමා ගැන විශ්වාසයක් තබන්නට ඇත... නන්දා නැන්දා ලියූ ලියවිල්ල ඔහු වෙනස් නොකරන්නට සිතන්නට ඇත්තේ එහෙයින් විය යුතුය...

ඒ විශ්වාසය නොකඩන්නට ඔහු තදින්ම සිතට ගත්තේය...



ඔහු එම නිවාසය සොයා ගනිද්දී දෙකටත් ළඟාවී තිබිණ...

ආ කාරණය කියද්දී මුරකරු ඔහුව ප්‍රධාන මව්තුමියගේ කාර්යාල කාමරය වෙත යොමු කළේය...

මේසයක වාඩිවී කුමක්දෝ ලියවිල්ලක් කියවමින් සිටි ප්‍රධාන මව්තුමිය සුදේශ් ඇතුළුවෙද්දීම ඔහු දෙස බැලුවාය...

ඒ තරමක් ආගන්තුක පෙනුමකිනි...

"ඉයස්...?" ඇය ඇසුවේ ප්‍රශ්නාර්ථයකිනි...

"මිස් නීලියා ප්‍රනාන්දු...?" සුදේශ් ඇසුවේද ප්‍රශ්නාර්ථයකිනි...

"වාඩිවෙන්න..." ප්‍රධාන මව්තුමිය එවර කියමින් සිටි ලියවිල්ල වසා ඔහුට ඉදිරි අසුන පෙන්නුවේ තරමක කුතුහලයකින් බලමින් බවද ඔහුට සිතිණ...

"තැන්ක්ස් මදර්..." කියමින්ම ඔහු වාඩිවිය...

"නීලියා...? මේ නීලියාගේ කවුද...?" ඇය ඉන්පසු ඇසුවෙ මඳක් විමසිල්ලකිනි... එහි ඇයගේ මුහුණේ කුතුහලයට සමගාමීව තරමක සැක සහිත බවක්ද තිබෙන බව සුදේශ්ගේ සිතට වැටහිණ...

ඔහු නීතිඥයාගේ ලිපිය ගත්තේ ඉදිරිපත් කළේය...

"මේ ලෙටර් එක මට මිස්ට ඉලුක්කුඹුර දුන්නේ... මම සුදේශ් නවරත්න..."

ඇය එය ගත්තේද සුදේශ්ගේ මුහුණ දෙස හොඳින් බලමිනි... ලිපිය දිග හැරි ඇය එය කියවද්දීම නළල රැළි කර ගත්තී ලිපිය කියවා සුදේශ්ගේ මුහුණ දෙස බැලුවාය...

"මේ මිස්ට සුදේශ් නවරත්න... හරි... මේක ලෝයර්ගෙම තමයි... ඒත් මිස්ට සුදේශ් නවරත්නට එන්න බැහැ කියලා ලෝයර් මට ඊයේ කථා කරලා කිව්වේ... දැන් ආවේ...?"

"මට මේ පැත්තේ වැඩ වගයක් වැටුණා... ඒක නිසා..."

"ඒත් ඉතින් මිස්ට නවරත්න... මෙහෙම දේවලදි බොහොම ප්‍රවේශම් වෙන්න ඕන නේ... අද එතකොට මට එන්න බැහැ කියලාත්

Scanned by CamScanner

ලියුමක් එවලා තිබුණ නේ...?" ඇය පැණයක් ලෙසින් කියද්දී සුදේශ්ට දෙලෝ රත්විය...

තමා ලිපියක් ලියුවේ කවදාද...? කාටද...?

"මම එව්ව...?" ඔහු ඇසුවේ තරමක කුතුහලයකින්ද යුතුවය... තමාගේ අත්සන ගසා ලිපියක් ගෙන එන්නට තරම් තැනැත්තෙක් ගැන ඔහුට සිතාගත නොහැකිය... අනික ඔහු ලිපියක් ලිව්වේත් නැත...

"ඔව්... මිස්ට පරාක්‍රම කියලා කෙනෙක්... නීලියා කිව්වා ඒ එයාගේ මස්සිනා කෙනෙක් කියලා... නම ඇහුවම... එයාව අඳුනගත්තේ නං නෑ... නීලියත් එයා දැකලා නං නෑ කියලා කිව්වා... ඒත් එයාගේ පාස් පෝර්ට් එක එහෙම අපිට ඉදිරිපත් කළා... බර්ත් සර්ටිෆිකේට් එකත් එක්ක... මිස්ට නවරත්නගෙන් ලියුමකුත් ගෙනාව නිසා..."

එක දිගටම කියාගෙන ගිය මව්තුමිය ලාච්චුව විවර කර එයින් ලිපියක් ගත්තාය...

සුදේශ් එවර කෝපයෙන් දත්කුරු සැපූවද ඇය එය නොදැක්කේ එම ලිපිය යළිත් ඇය කියවන්නට ගත් හෙයිනි...

අද සිදුවූ සිද්ධිය ගැන දූන් සුදේශ්ට මඳක් වත් අවිශ්වාසයක් තබන්නට නොහැකිය...

අද උදේ ඒ පාහරයා කාර්යාල කාමරයෙන් තමාගේ කාර්යාලයීය මුද්‍රාව සහිත කොළයක් සොරා ගන්නට ඇත... ඒවා බොහෝ විට මොනිකා තබා ගන්නේ ඇයගේ ලාච්චුවේය... කොළ දෙක තුනක් අත්සන් ගසා ඒම ඔහුගේ කවදත් කාර්යයක් වූයේ හදිසියේ ඔහුට තැන තැන යන්නට වුවහොත් මොනිකාට වන අපහසුතාවයන් මග හැරවීම සඳහාය... මෙතෙක්ම ඇයගෙන් විශ්වාසය කඩවෙන කිසිවක්ම සිදුවී නැත...

මව්තුමිය දූන් ලිපිය ඔහු කියෙව්වේ කෝපයෙන් රත්වෙන තතින් යුතුවය... එහි ලියා තිබුණේ සුදේශ් නවරත්නට එන්නට නොහැකි හයින් මේ ලිපිය ඉදිරිපත් කරන පරාක්‍රම නැමැත්තාට නීලියා කැමැති ම් බාරදිය යුතු බවය...



කාර්යාලයයෙන් කිසියම් කාර්යයක් සඳහා ලිපි නිකුත් වෙද්දී තමාගේ අත්සන පමණක්ම නොව මුද්‍රාවද අවශ්‍යය... මෙහි මුද්‍රාවක් නැත... ඔහුට අත්සන ගැසූ කොළයක් අසුවන්නට ඇත... නැතහොත් දන්නා හෙයින් සොරා ගන්නටද ඇත...

කෙසේ වෙතත් මව්තුමියට තමාගෙන් හෝ පරාක්‍රමගෙන් වෙන අපහසුතාවය යන්නෙ ඉලුක්කුඹුර හරහාය... එපමණක් නොව එය නීලියාගේ ගරුත්වය කෙලසන්නක්ද විය හැකිය... ඔහු ක්ෂණික තීරණයක් ගත්තේය...

"ආ... වෙන්න පුළුවන් මදර්... මං මේ කොළේ නං දුන්නා... මං හෙට එන්න හිතුවෙ... හදිසියක් උනොත් එහෙම... මට ඒ ගන්න බැරි උනොත් කියලා හිතලා තමයි මේක කරේ නං... පරාක්‍රම කිව්වේ අනිද්දා එනවා කියලා... මං හෙට එන්න බැරි උනොත් කියලා මේක දුන්නේ... පරාක්‍රමට මාව කන්ටැක්ට් කරගන්න බැරිවෙන්න ඇති... මං ඔෆිස් එකෙන් ආවේ හදිසියෙ... මේ පැත්තේම වැඩකට..." ඔහු එක දිගට කියවාගෙන ගියේය...

"මිස්ට ඉලුක්කුඹුර කිව්වෙත් එහෙම තමයි... ඒත් ඉතින් අද මේ ලියුම අරගෙන මිස්ටර් පරාක්‍රම ආවම නීලියත් කිව්වා ඒ එයාගේ මස්සිනාගේ නම තමයි කියලා... ඉතින් අපිට..."

"කමක් නෑ... කමක් නෑ... දූන් ඒ ගොල්ල කොහේටද දන්නෙ නෑ ගියේ... ඒ මොකද මං වත්තට යන්නත් බලාගෙන ආවෙ... ඒ ගොල්ලො කොළඹ ගියොත්..."

"ගියේ නං කුරුණෑගල පැත්තට... ඒ මොකද මෙහේ සිස්ටර් කෙනෙක් කුරුණෑගල හොස්පිට්ල් එකට යන්න බස් එකට නග්ගනවා කිව්වා... ඒ ගොල්ල එතනින් හැරෙන කථාවක් කිව්වා..."

"පරාක්‍රම එහෙනං එන්න ඇත්තේ වාහනේ වෙන්න ඇති නේද...?" ඔහු තිකමට ඇසුවේය... කවුරුන් හෝ රැගෙන යන්නට සිතුවේ නම් ඔහු එන්නට ඇත්තේ වාහනයකය...

"ඔව් මිස්ට නවරත්න... නීලියාගේ බඩු ඇති කියලා හිතලා

තමයි මිස්ට පරාක්‍රම වාහනයක් අරගෙන ඇවිල්ලා තිබුණේ... ඒත් නීලියා එක සූට්කේස් එකක් විතරයි ගෙනිච්චේ... අනික්වා ගන්න පස්සේ එන්න කියලා මං කිව්වා... නීලියට එහේ හරි නැත්තං ආයේ මෙහෙට හරි එන්න පුළුවන් නේද කියලා හිතලා තමයි මං එහෙම කිව්වේ... නීලියාත් කිව්වා අද ගිහිල්ලා... මිස්ට ඉලුක්කුඹුරවත් කන්ටැක්ට් කරගෙන... තව දවස් දෙක තුනකින් එනවා කියලා... ඒක හින්දා එයාත් ඇඳුං එහෙම වැඩිය ගෙනිච්චේ නෑ... අනික් ඒවා මෙහේ..."

"වාහනේ මොකක්ද...? වැරදිලාවත් මට ඒ දෙන්නා මුණ ගැහුණොත්... කථා කරන්නත් පුළුවන් නේ... මං මෙහේ ආව විත්තියවත් කියන්න... එහෙමම මට වත්තටත් යන්න පුළුවන් වෙයි එහෙම උනොත්..." සුදේශ් කීවේය...

"ආවේ නං මොරිස් මයිනර් එකක... ඒක හයරින් කාර් එකක් වෙන්න ඇති කියලා මට හිතුණා..." මව්තුමිය කීවාය...

යන්නට ඇත්තේ මහ ගෙදර පැත්තට බව ඔහුට සිතිණ... පරාක්‍රම දන්නා හඳුනන නිසා වෛද්‍යවරයා ඒ දෙදෙනාට අර උඩුමහළ විවර කරදෙනු ඇත...

ඔහු මව්තුමියට නොපෙනෙන්නට දත් සපාගත්තේ ඇයටද ස්තුති කර එතනින් නික්මුණේය...



# භය

**පරාක්‍රම** නීලියා රැගෙන යන්නට, එන්නට ඇත්තේ කුලියට ගත් කාරයකය... සුදේශ් හැකි තරම් වේගයෙන් ඔවුන් ගිය දෙසට කාරය පැදෙව්වේය...

ඔහුට පරාක්‍රමව පණපිටින් වළලෑමට තරම් සිත්වී තිබිණ... දැන් මේ නීලියා නැමැති යුවතිය තමාගේ ආරක්‍ෂාවට පත් යුවතියක් හෙයිනි...

නීලියාට කුමක් හෝ අතවරයක් කළ පසු ඇය අයත් වන්නේ එම තැනැත්තාටය...

මෙයට වරුණ නැමැත්තා සම්බන්ධ විය නොහැකිය... වරුණට කොන්වන්ට් එක සොයාගන්නට හැකි වන්නේ නැත... එහෙත් පරාක්‍රම එය සොයාගත්තේ කෙසේද...? එය දැනගත යුත්තේ ඔහුගෙන්මය... සැබැවින්ම නම් සිතේ හොරයක් නොතිබුණේ නම් ඊයේ ඔහුට තමා හා මේ ගැන කථා කරන්නට තිබිණ...

නීලියා ඔවුන්ට ලේ නෑකමකින් යුක්ත වූවද දැන් ඇය ඇත්තේ තමාගේ භාරයේය... ඔහුට ඇයගේ මුදල් හෝ බූදල් අවශ්‍ය නැත... ඒ කිසිවක්ම නැතද කුඩම්මාගේ සිත ගත් ඒ දැරියට..., දැන් යුවතියට...

Scanned by CamScanner

සලකන්නට ඔහුට හොඳින්ම හැකියාවක් ඇත... කුඩම්මා තමාට දූන් නිවස ඇය වෙනුවෙන් වෙන් කළ හැකිය... එය තමාගේ යුතුකමක් බව ඔහු සිතමින් සිටියේය... එහෙත් දූන් මේ පරාක්‍රමලා කරන මගඩිය...

තමාගේ වගකීම තමාගෙන් උදුරාගෙන වීරයෙක් වන්නට තතනන පරාක්‍රම කෙරෙහිද ඔහුට දැණුනේ කෝපයකි...

මෙය නම් ඇයට ඇති ආදරයක් නොවන බව ඔහු දූන් හොඳින්ම දැන ගත්තේය... එලෙස වූයේ නම් ඔවුන්ට තිබුණේ තමාගේ කොළ සොරකම් කරමින් මැය මෙලෙස රැගෙන යාම නොවේ... තමාගෙන්ද අසා ඇයව නිවසේ රඳවා ගැනීමය... ඇය ගැන කැමැත්තක් හෝ අකැමැත්තක් ගැන ඔවුන් දූන් විමසිය යුතු වන්නේද තමාගෙනි... නීලියා කැමැත්තේ නම් තමාට අත සෝදාගෙන ඇය ඔවුන්ට දී පසෙකට විය හැකිය... තමාට මෙම යුවතියගේ ප්‍රශ්නය හෝ ඇයව හිසේ තබා ගත යුතු නැත... එහෙත් මේ සියල්ලටම ඇයගේ කැමැත්තක් නැත්නම්...

ඔහු හැකි තරම් කාරයේ වේගය වැඩි කළේ හොඳින් වටපිටාවද නිරීක්ෂණය කරමිනි... දූන්වූ වේලාව අනුව ඔවුන්ගේ ගමනාන්තයට යන්නට තවත් පැය එකහමාරක් වත් යන බව ඔහුට සිතිණ... පරාක්‍රම මෙලෙස ඇය කෙරෙහි සැලකිලිමත් වන්නේ නම් ඇයව තබා ගන්නට වන්නේ වත්තේ බංගලාවේය... එයට සැබැවින්ම පොලිස් ආරක්ෂාවක්ද ඇති හෙයිනි... එහෙත් ඉන්පසු ඒ යුවතිය එහි හිරකාරියක සේ වෙනු ඇත... එවන් දෙයකට එම යුවතිය කැමැත්ත දේයැයි සිතිය නොහැකිය... කෙසේ වූවත් දූන් මේ දෙදෙන සොයා ගත යුතුය...

තවත් පැය භාගයක් පමණම වේගවත් ගමනකින් පසු පාරෙන් අයින් වෙන්නට මෙන් නවත්වා තිබූ මොරිස් මයිනරයක් ඔහුගේ නෙත ගැටිණ... මේ පළාතේ මෙවැනි වාහන දකින්නට නැත... ඒ පළාත්වල ඇත්තේ බක්කි කරත්ත නැතහොත් තිරික්කල පමණක් හෙයිනි...

මේ නම් පරාක්‍රම කුලියට ගෙන ආ වාහනය බව ඔහුට සිතුණේය... නැතහොත් මේ ලෙස මේ පළාතේ මෙවැනි කාරයක්



දක්නට ලැබෙන්නේ නම් කලාතුරකිනි... සියල්ලන්ගේම පොදු වාහනය වූයේ පාපැදියය... එවන් පාරක වේගයක් වුවද ගත නොහැක්කේ ඒ හේතුවෙනි... සියල්ලෝම යන්නේ සෙමිනි... බසයක් විනා කාරයක් ඒ දෙසින් නොයන හෙයින් මෙන්ම..., බසය වුවද යන වේලාවක් ඇති හෙයින්ද සියල්ලෝම පාර පුරාම යන්නට පුරුදු වී සිටිති...

මොරිස් මයිනරයට හේත්තුවී සිටි රියැදුරා සුරුට්ටුවක් උරමින් සිටියේය... ඉදිරියේ තිබුණු තානායමට යන පාර යන්න ඔහුගේ නෙත ගැටුණේ දෙවෙනිවය...

සුදේශ්ගේ සිරුරම සිහිතල විය... දිවයිනේ කිසි පාරක් නොපුරුදු නොදන්නා දැරියක ගෙනැවිත් පරාක්‍රම කරන මෙ දඟය ලෙහෙසියෙන් අත හරින්නට ඔහුට නොසිතිණ... එහෙත් කාරයේ ආ තැනැත්තන් තමා හඳුනන වග මෙම රියැදුරු මෙන් පෙනෙන වයසක මිනිසාට කියන්නට ඔහුට නොසිතිණ...

ඔහු කාරය එතනින්ම නවත්වා ගත්තේ..., බැස්සේය... මේ සමහරවිට වෙනත් කවරෙක් හෝ ගෙන යන වාහනයක් වන්නටද ඇත...

"උන්නැහේ... මොකද කාරෙක කැඩිලද....? නැත්තං..." ඔහු විමසුවේ බොහෝ කුළුපග ලීලාවෙනි... දතට දත... ඇහැට ඇහැ නියමය පිළිපදින්නට අවශ්‍ය පරාක්‍රම වැනි කපටින් සමගය...

"ටිකක් බොයිල් වෙලා වගේ මහත්තයා... මං මේක මෙතන නවත්තලා දූන් වතුර ටිකක් ගේන්න කොළුවෙක් ඇරියා..."

"උන්නැහේ විතරද ආවේ...? නැත්තං කුලී ගමනක්ද...?"

"කුලී ගමනක් මහත්තයා... ටිකක් දුර යන්නත් ඕන... මේක කඳු නගින්න ටිකක් හොරයි... ඒත් මේකේ ආව මහත්තයට මගේ කාරෙකෙන්ම එන්න ඕන කිව්වා..."

"එහෙනං ඒ මහත්තයත් එක්ක මුන්නැහැ ගමන් බිමන් ගිහිල්ලා ඇති..."

"එහෙමයි මහත්තයො..."

"මං මෙ හිතුවෙ කරදරයක් නං... මොකක්ද කියලා... උදව්වක් දෙන්නවත්..." රියැදුරුට සැකයක් නොඑන්නට කියූ සුදේශ් වටපිට බැලුවේ..., "මෙතන රෙස්ට් හවුස් එකක් නේද...?" ගණනකට නොගෙන මෙන් ඇසුවේය...

"ඔව්... අපි මෙතනට කාර් එක ටිකක් දුර තල්ලු කරගෙනම වගේ ආවා... අර හරියෙදි බොයිල් උනේ... මේක දැක්කම ඒ මහත්තයා කිව්වා නෝනත් එක්ක ගිහිල්ලා තේකක් බීලා එන්නං කියලා එතකං කාරෙකටත් නිවාඩුවක් දෙමු කියලා..." මහළු මිනිසා සිනහසුනේය... මේ තැනැත්තා පරාක්‍රමගේ මගඩිය නොදන්නා වග සුදේශ්ට සිතිණ...

"කොහේ ඉඳන්ද ආවේ මුන්නැහෙලා...?" අසමින්ම සුදේශ් කාරයේ පිටුපස අසුන දෙස බැලුවේය... එහි කිසිවක්ම නොවිණ... ඇයගේ බෑගය ඇත්තේ ඩිකියේ විය යුතුය... බෑගය ගත් නොගත් බව දැනගන්නේ කෙසේද...?

"අපි මෙහේ පල්ලියක නෝනා කෙනෙක් එක්ක ගෙන යන්න ආවෙ... මේ මහත්තයාගේ නංගි කෙනෙක්... ඒරොප්පේ ඉඳලා ආව දූරිවියක් කිව්වෙ..."

සුදේශ්ට ඒ ඇත... ඒ පරාක්‍රම හා නීලියා බව ඔහුට සැකයකින් තොරව කියන්නට පිළිවන... ඇතුළට ගොස් බැලිය යුතුයැයි ඔහු සිතුවේය...

"එහෙනං මං යන්නං උන්නැහේ... මාත් ගිහින් මොනවා හරි බොන්න හිතුවෙ... උන්නැහැටත් මාත් එක්ක යන්න තිබුණා... අර ළමයෙක් කවුද ඇවිල්ලා හිටියනං..."

"එපා මහත්තයෝ... මට මේකේ ප්ලාස්කුවේ තේ තියෙනවා... මගේ පොඩි කෙල්ල ගෙදරින් එනකොට මට තේ එකක් දානවා හැමදාම..."

සුදේශ් කාරය වත්ත තුළට ගත්තේ වේගයෙනි... එම රේසිං කාරය දෙස රියැදුරා ආශාවෙන් බැලුවේය... එවැනි කාරයක් අයිති වන්නේ හොඳ පෝසත් තැනැත්තෙකුටය... මේ මහත්තයා නම් හොඳ නිහතමානී තැනැත්තෙක් බව රියැදුරුට සිතුණේය... නැතහොත් මෙලෙස මෙතැන කාරය නවත්වා තමා හා කථා කරන්නට සිතන්නේ නැත...



තානායම තිබුණේ සැතපුම් කාලක් පමණ ඇතින් බව ඔහු දුටුවේය... තානායමේ පිටුපසින් ඇත්තේ මිටියාවතක් බව ඔහුට සිතිණ... තානායම එතරම් ඈතක වෙන්නට සාදා තිබුණේ එම ලස්සණට බව ඔහුට සිතිණ... තවත් ළඟාවෙද්දී එය පැරණි වලව්වකට කොටස් එක්ඨාර තනන ලද්දක් බව ඔහු සිතාගත්තේය...

පළාත එතරම් ජනාකීර්ණ නැති වූවද, ඒ මොහොතෙහිද තානායමේ තරමක සෙඟක් සිටින බව ඔහු සිතුවේ වාහන දෙක තුනක්ම එහි දකිද්දීය... විනෝද ගමන් යද්දී විවේකයක් ගැනීමට කියාපු තැනකි... නීලියා සමග සිටින පරාක්‍රම එළිමහනේ සාදයක් නොදාන බව ඔහුට සිතුණේය... ඔහුගේ සිතට ආවේ දැඩි පසුතැවිල්ලකි... කිහිප දෙනෙක්ම ඔහුගේ කාරයේ හඬ ඇසෙද්දී බැලුවා පමණක් නොව කාරයෙන් බසිද්දීද ඔහු දෙස බලාගෙන සිටින බව ඔහු ඒ අතරද දුටුවේය... කෙළින්ම ගොස් එවැනි යුවළක් ගැන විමසන්නට ඔහු ඉක්මණ් නොවිණ...

එළිමහනේ යුවතියන් දෙතුන් දෙනෙකු මෙන්ම කාන්තාවන්ද සිටින බව ඔහුගේ නෙතට හසුවිය... නීලියාගේ හැඩරුව නොව ඇයගේ පාටවත් ඔහු දන්නේ නැත... ඔහු සෙමින් වටපිට බලමින් ඇතුළට ගමන් ගත්තේය...

දිගු විසල් විවෘත ආලින්දයේ කොණක මේසයකට වී තේ බොමින් සිටි යුවළ දකිද්දී සුදේශ්ට සැහෙන සැනසිල්ලක් දැණින...

පරාක්‍රම මෙන්ම යුවතියද ඔහු දෙස බැලුවේ ඔහුගේ සපත්තු හඬ තරමක නිහඬ ආලින්දයේ තරමක් ශබ්දයක් නැගූ හෙයින් විය යුතුය... ඔහු කෙළින්ම පරාක්‍රමගේ නෙත් දෙසම බලාගෙන ගමන් කළේය... ඇයට වෙනත් අයුරකින් සැලකීමට සමහරවිටක පරාක්‍රම බය වෙන්නටද ඇත. සුදේශ් ළං වෙද්දී මුළු මුහුණම වෙනස් වූ පරාක්‍රම නැගිට ගත්තේය...

වාඩිවී සිටි යුවතිය පුදුමයෙන් අර තැනැත්තා දෙස යොමු

Scanned by CamScanner

දෑස් දුන් නැගිට ගත් පරාක්‍රම දෙසටද යොමු කළේ, ඉන්පසු යළිත් දූත් ළං වෙන තැනැත්තා දෙස බැලුවාය...

ඇයට කිසිවක් වැරදී ගොස් ඇති බව වැටහෙමින් තිබිණ... හේම් අන්කල්... එනම් ඉලුක්කුඹුර ඇයට කියා තිබුණේ සුදේශ් නැමැති ඇයගේ භාරකරු පැමිණ ඇයව කොළඹ රැගෙන යන බවකි... ඒ තැනැත්තා නම් එතරම් වගකීමක් බාර දිය හැකි කෙනෙකු නොවන බව ඇයට හේම් අන්කල් ගේ බිරිඳ නිශා ආන්ටි කියා තිබිණ...

එහෙයින්ම තමාගේ ලොකු නැන්දා වන භද්‍රා නැන්දාගේ පරාක්‍රම යන පුතා, සුදේශ්ගේ අවසරයෙන් ඇයව රැගෙන යන්නට පැමිණීම ගැන ඇයගේ සිතේ තිබුණේ සතුටකි... ඔහු තමාගේ වයසට සරිලන අයියෙකි... දන්නා තරමින් සුදේශ් බොහෝ වැඩිමහල්ලෙකි. ඇයට සුදේශ් ළඟට යෑමට වඩා පරාක්‍රම නැමැත්තාගේ නිවස හොඳ බව සිතෙමින් තිබුණේ පරාක්‍රම දකිද්දීය... එහෙත් කාරයේ එද්දී ඒ සියල්ල තරමක් දුරට වෙනස් වෙමින් තිබිණ...

පරාක්‍රම නැමැත්තා ඇයගේ පියා ගැන හෝ මව ගැන වුවද වචනයක් නොදෙඩුවේය... ඔහු ඇයගේ වයස මෙන්ම ඇයගේ මිතුරු මිතුරියන් ගැන ඇසුවේය... සුදේශ් ගැන බොහෝ වැරදි කීවේය... තමා අවුරුදු ගණනාවකින් නොදුටු තැනැත්තෙක් ගැන එවැනි දේ දෙඩවීම ඇයට එතරම් මනාප දෙයක් නොවිණ...

ඇයට සුදේශ් මතකයේ තිබුණේ යම්තම් ඡායාවක් ලෙසින් පමණකි... කෙට්ටු උස... ඇයට ඒ ලෙස ඔහු පෙණුනේ ඇය ඒ වෙද්දී ළදැරියක නිසා බවත් ඇයට වඩා ඔහු ඒ වෙද්දී උසින් බොහෝ වැඩී සිටි නිසා බවත් ඇයට සිතා ගත නොහැකි විය...

එහෙත් ඒ ගොඩක් කළකට පෙර දුටු සුදේශ් ගැන සිතීම හොඳ බව ඇයට සිතුණේ කාරයේදී පරාක්‍රම හා කළ කථා බහ මතකයට එද්දීය...

'ඔයා හරි ලස්සණයි නීලියා...' කාරයේදී පරාක්‍රම කථාව පටන් න්තේද එසේමය...

මේ කාගේත් කීමක් බව දන්නා හෙයින් ඇය ඒ ගැන සිතන්නට



නම් ගියේම නැත... එහෙත් එයට පිළිතුරක් දිය යුතු බව නම් ඇය සිතුවාය...

'වෙන්න ඇති... දෙතුන් දෙනෙක් කියලා තියෙනවා...' එහෙත් එයට වෙනදා මෙන් ස්තුතියි කියන්නට නොසිතාම ඇයට කියැවිණ... එය කියන්නට පෙර ඔහුට තමා හා කියන්නට බොහෝ දේ තිබෙන බව ඇය සිතුවාය... ඔහු ඇයගේ දෙමාපියන් ගැනවත් පැණයක් නැගුවේම නැත... අවම වශයෙන් සුදේශ් ගැන නැතහොත් තමා මෙතෙක් කලක් සිටියේ කෙසේදැයි කොහේදැයි වත් විමසුවේ නැත...

'ඇත්තටම නැද්ද ඔයාට බෝයි කෙනෙක්...?'

'පරාක්‍රම අයියා මං දැක්කෙත් අද... මං කොහොම ඒ වගේ දේවල් කියන්නේ...?' ඇය එවර ඇසුවාය... එලෙස සිටියා නැතා..., ඒ මොහොතේදී ඒ බව කියන්නට ඇයට සිතුණේ නැත...

'දැක්කේ අද උනාට ඔයයි මමයි නෑනයි මස්සිනයි...' ඔහු කීවේ තරමක් රහසිනි... මේ කිසිවක්ම රියැදුරුට ඇසෙන්නට නොකියන්නට ඔහු පරිස්සම් සහගත වූ බව ඇය දැනගත්තේ නැත...

ඒ කථාව ඇය දැන සිටියාය... ලංකාවේදී නෑනා මස්සිනා විවාහ සුලභ බව ඇය දැන සිටියාය... ඇයට සිහින් සිනාවක් නැගිණ...

'තවත් මස්සිනාලා මට ඇති පරාක්‍රම අයියේ...' ඇය කීවේ වෙනත් කිසිවක්ම නොසිතමිනි... 'මට කියන්න ඔයාලගේ ගෙදර කවුරු කවුරුද ඉන්නෙ...?' ඇය සිතුවේ මේ මොහොතේදී ඔහුගේ නිවස ගැනත් නිවැසියන් ගැනත් කිසියම් දැනීමක් ගැනීමටය...

'අම්මයි මායි... නංගියි...'

'මං දැන් එහේ ඉන්නවට මේ සුදේශ් අයියා කැමැති වෙයිද...?'

'සුදේශ් කියන්නේ ගෑනු ළමයෙක් එක්ක තනියෙම තියන් හොඳ එක්කෙනෙක් නෙවෙයි නීලියා... අනික එයා කවුද...? අපි ෙ කෙළින්ම ඔයාට නෑයෝ වෙන්නේ...'

'ඒක හරි අයියෙ... කොහොම උනත් මට සුදේශ් අයියා මීට් වෙන්නම වෙනවා... එයා දැන් මගේ ගාර්ඩියන් හරියට බැලුවො

Scanned by CamScanner

එයාගේ අත්සනක් නැතුව මට සල්ලිවත් ගන්න බෑ... මගේ වෝර්ඩ්න් හැටියට මට සල්ලි උනත් ඉල්ල ගන්න වෙන්නේ එයාගෙන්...'

පරාක්‍රම මදක් තිගැස්සුණු බව ඇයට ඒ මොහොතේහිදී සිතිණ...

'සල්ලි ගන්න නං තවත් ක්‍රම තියෙනවා...' පරාක්‍රම කීවේ ගණනකට නැතිව මෙනි...

'මගේ...?' ඇය ඒ මොහොතේදී විමතියෙන් ඇසුවාය... සුදේශ්ගේ අත්සන හෝ හේම් අන්කල් ගේ අත්සන නැතිව කිසිවක්ම කළ නොහැකි බව නිශා ආන්ටි නොකීවේද...? නිශා ආන්ටි ඇයට එම ලියැවිල්ලද තරමකට කියවන්නට දී තිබිණ... නිශා ආන්ටි සිටියේ නම් මෙය කුමක්දැයි අසාගන්නට තිබිණ... මේ ක්ෂණයේදී නම් ඇය මෙහි නැතිවීම පාඩුවකැයි නීලියා සිතුවාය...

'ඔයාගේ තමයි...' ඇයගේ සිතිවිල්ලට තිතක් තබා පරාක්‍රම කීවේය...

'ඒ කොහොමද...? ඔයා මට දෙනවද...?' ඇය තරමකට සිනහවක් දී ඇසුවාය... ඇයට වෙනත් යමක් සිතාගත නොහැකිය...

'නෑ... මෙහෙම දෙයක් තියෙනවා නීලියා... ඔයාට සල්ලි ගන්න පුළුවන් බැන්දොත්...'

'බැන්දොත්...?'

'ඔව්... මැරි කරා නං හරි...'

'මැරි කරන්න මං... කාවද...?' ඇයට එය වැටහුණේම නැත...

'අපි දෙන්නා බඳිමු... එතකොට ඔයාගේ සල්ලි ඔයාට ගන්න පුළුවන්...'

'එහෙම ක්ලෝස් එකක් ඒකේ තිබුණේ නෑ...'

'නැත්තේ මොකද නීලියා... ඔයාට බැන්දොත් ඒවා ගන්න පුළුවන්...'

'බැන්දොත්... අනේ විකාර කථා නොකියා ඉන්න... මැඩ්නස්...' ඇය ඒ මොහොතේදී නම් උරහිස් ගස්සාම කීවාය...



'නැහැ නීලියා... ඒක එහෙම තමයි...'

'ඔයා දන්නේ කොහොමද...? මට සල්ලි ගන්න බෑ දහඅට වෙනකං...'

'ඉතින් ඒකට මොකද...? දහඅට වෙනකං හරි ඉඳලා ගන්න බැරියැයි... ඔයා මට කැමැති නං ඒක ප්‍රශ්නයක් නෑ... ඒ වයස වෙනකං මට බැරියැයි ඔයාට සලකන්න...' ඔහු කීවේ එතෙක්ම ඇය වෙත එන ආදායමද මෙම දිවයිනේ මුදල් අගයෙන් නම් සුළුපටු නොවන බව ඔහු දන්නා බව ඇයට වසන් කරමිනි... ඒවා ගැන ඇය දන්නේ නැත...

ඒවා ගැන නොදත් නමුදු නීලියාට මෙම කථාවල් එතරම් සිතට ඇල්ලුවේම නැත... විදේශ ගත වී හැදී වැඩී සිටියද ඇය වැඩිහිටියන්ගෙන් සියල්ලක්ම අසා බලා කරන යුවතියක වූවාය... මෙවන් දෙයක් ඇය හොර රහසේ කරන්නට නම් කැමැත්තක් ඇත්තේම නැත...

'මට එහෙම තනියම ඩිසිෂන් ගන්න බෑ නේ අයියෙ... මං තාම මෙහේ ගැන දන්නෙ නෑ...' ඇය කීවේ එහෙයිනි...

'ඇයි බැරි... දැන් ඔයා තනියම නේ ඉන්නෙ... ඔයාගේ ඩැඩීලා මම්ලා වගේ නෙවෙයි නේ අනික් අය... ඔයා මට කැමැති නං එහෙම කරාම ඔයාට කරදරයක් නැතුව අපේ ගෙදර ඉන්න පුළුවන්...'

'එහෙම නැත්තං එහේ ඉන්න බෑ කියලද දැන් අයියා කියන්නේ...?'

'නෑ නෑ... එහෙම දෙයක් නෙවෙයි... ඒත් ඉතින් ඔයාට කවද හරි බඳින්නම වෙනවනේ... මෙහේ ඔයා දැන් දන්නේම මං විතරයි නේ...'

ඇයගේ සිතට නැගුණේ මේ මොන කරදරයක්ද යන්න පමණකි... ඇය මේ තැනැත්තා මස්සිනා ලෙසින් හඳුනාගත්තාම පමණකි...

'සුදේශ් අයියා නැතිව නං මට ඒ වගේ දෙයක් හිතන්න බෑ... ං දන්නේ නෑ නේ එයා මට මොන වගේ දේවල් මෙහේ කරන්

කියයිද කියලා...' ඇය කීවේ පරාක්‍රම මේ එක දිනක් එක මොහොතක් දුටු තමාගෙන් මෙලෙස අසන්නේ කෙලෙසදැයි ඇයට සිතාගන්නටත් අපහසු තරම් වූ හෙයිනි...

'ඉතින් එයා මොනවා කියන්නද...? එයාත් කැමැති උනානේ ඔයා අපේ ගෙදර එනවට... ඒක නේ මෙහෙම මාව එව්වෙත්...' ඔහු කියා ගත්තේය...

'ඒත් හේම් අන්කල් එහෙම කථාවක් කිව්වේ නෑ නේ... කොහොමටත් ඒක උනත් මං අහලා බලලා තීරණයක් ගත්තොත් තමයි හොඳ...' නීලියා ඇයට සිතෙන අයුරු පැවසුවාය...

'සුදේශ් නං ඉතින් එක සැරේම කියයි කමක් නෑ කියලා... හේම් අන්කල් උනත් එයා ගැන දන්නෙ මොනවද...? සුදේශ් කියන්නේ එච්චර හොඳ එක්කෙනෙක් නෙවෙයි කියලා මං කිව්වනේ... එයාට ඕන එක සැරේම ඔයාගෙන් නිදහස් වෙන්න... එයාට ඕන විදියට වැඩ කරගන්න බැරි නිසා තමයි මෙහෙම හරි මාව මේකට පටලවන්න හිතන්න ඇත්තෙත්... ඒකට නං මං දැන් මොකවත් කියන්නේ නෑ... ඔයා ගැන දැනගත්තම මට හිතුණා එයා මට එහෙම පවරපු එක හොඳයි කියලා...' පරාක්‍රම කීවේ සැබැවින්ම ඇයට එය ඒත්තු ගන්නන ස්වරයකිනි... 'නැත්තං ඉතින් එයාටම එන්න තිබුණනේ දැන ගත්තු ගමන්...' ඔහු එවර එක් කළේ තිර ස්වරයකිනි...

එහෙත් මෙහි කුමක් හෝ වැරැද්දක් තිබෙන බව නීලියාට වැටහිණ... සුදේශ් අයියා පරාක්‍රමට තමා බාර දෙන්නට හෝ ඒ නිවසට බාර දෙන්නට හෝ තමා මුණ ගැසිය යුතුමය... සුදේශ් කෙසේ හෝ මුණ ගැසිය යුතුය... යන තීරණයට ඇය එළැඹියේ ඒ මොහොතේදීය... පරාක්‍රමගේ තිර ස්වරයට වඩා ඇයගේ හදවතින් දෙන කිසියම් පණිවිඩයක් ගැන ඇයට විශ්වාස කළ හැකි විය...

කාරය නතරවෙද්දී ඇය සිතුවේ කොහේ හෝ තැනකින් හේම් අන්කල්ට හෝ මව්තුමියට දුරකථන පණිවිඩයක් ගන්නටය... ඇයට එහි යා නොහැකිය...

ඇය මෙහි පාරවල් හෝ වෙනත් කිසිවක්ම දන්නේ නැත...



මව්තුමියගේත් හේම් අන්කල්ගේත් දුරකථන නම්වර ඇය ළඟ තිබුණ නමුදු තමා ගෙන යන තැනක දුරකථන පහසුකම් තිබේදැයි ඇයට සිතාගත නොහැකිය...

මෙම දිවයිනේ ඒ පහසුකම් නම් බොහෝ අඩු බව දැන් දැන් ඇය වටහාගෙන සිටියාය...

කාරය නතරවූ පසු තේ කෝප්පයක් බොමු යැයි යෝජනාව ඇය ගෙන ආවේ මෙම තානායමෙන් හෝ දුරකථන පණිවිඩයක් ගත හැකිදැයි සිතමිනි... එහෙත් පරාක්‍රම තමාට එලෙස ගන්නට උදව්වක් නම් නොකරන බව ඇයගේ සිතට දැණින... ඇය තේ කෝප්පය සාදා ගනිමින්ද කල්පනා කළේ එයය...

යළි මව්තුමිය වෙත ගොස් මේවා වාර්තා කළ යුතු බව ඇය සිතමින් සිටියාය... සුදේශ් මෙලෙස තැනැත්තෙක් නම්... තමා අත් අරින්නට සුදානම් තැනැත්තෙක් නම් තමාට ඇත්තේ යළිත් මව්තුමිය වෙත ගොස් මේ සුදේශ් නැමැත්තාට හෝ හේම් අන්කල්ට හෝ කථා කර තමාගේ නැවතීමේ පහසුකම ගැන විසඳා ගැනීමටය...

පරාක්‍රමගේ නිවසට නොගොස් සිටිය හැකි නම් යැයි ඇය සිතුවේ තේ කෝප්පය තොලගාමිනි...

එහෙත් පරාක්‍රම හා තමා වෙතට එන මේ තැනැත්තා සුදේශ් විය හැකියැයි ඇයට මොහොතකටවත් නොසිතිණ... ඔහු තරුණයෙකි... පරාක්‍රමගේම වයසට ඇත... ඇය සිතාගත්තීය... ඒ තැනැත්තාත් මොහුගේ මිතුරෙක් නම් ඇය තවත් කරදරයකට වැටෙන බව ඇයට සිතිණ... දැන් එතන දෙදෙනෙකි...

එහෙත් ඇය නිසංසලේ තේ කෝප්පය තොල ගෑවාය... පරාක්‍රම නැගිට්ටාට ඇයට නැගිටීමට අවශ්‍යතාවයක් නැත...

"පරාක්‍රම..." ළඟටම විත් පරාක්‍රම අයියාගේ නම උච්ඡාරණය කළ තැනැත්තා එලෙස උච්ඡාරණය කළේ එතරම් මනාප හඬකින් නොවන බව නම් ඇයට වැටහිණ... එහි තර්ජනයක් වැන්නක්ද ගැබ්ව තිබිණ...

Scanned by CamScanner

පරාක්‍රම අයියාගේ සියළු පරාක්‍රම ඔද තෙද බල සුන්වී ඇතිවාක් මෙන් ඇයට දැණින... පරාක්‍රම ඒ තැනැත්තා දෙස බැලුවේ බියපත් දෑසකින් බව ඇයට වටහා ගැනීමට අපහසුතාවයක් ආවේ නැත... තනිවූ යුවතියක ලෙස ඇයට දුන් බොහෝ විට අන් අයගේ මුහුණේ හැඟීම් ඇසුරෙන් බොහෝ දේ වටහා ගැනීමට නුවණක් තිබිණ... පරාක්‍රම තමාගේ නෑදෑයෙක් වුවද එහි නොගොස් යළිත් මව්තුමියගේම පිහිට පැතිය යුත්තේද එහෙයින්ම බව ඇයගේ සිතට දැනෙන්නට වූයේද එහෙයිනි...

"මෙ... මෙ... මෙහෙ...?" පරාක්‍රම ඇසුවේ සුදේශ් නම නොකියමිනි... අයියේ යැයි ඇමතීමටද දුන් ඔහුට බියක් දැණින...

වැරැදි කරන සිත සැමතින්ම සෙලෙවෙන බැවිනි...

"ඇයි...? තමුසෙට විතරද මෙහෙම එන්න හොඳ...? දන්නවනං මං තවත් හොඳ තැනක් කියනවා කෙල්ලෙක් එක්ක ගෙන යන්න පුළුවන්... මෙතන කට්ටිය වැඩියි..." කියමින්ම සුදේශ් අනවසරයෙන්ම වාඩිගත්තේය...

ඔහු නීලියා දෙස බැලුවේ ඉන්පසුවය... ඇය නිවාඩු පාඩුවේ තේ කෝප්පය තොල ගාමින්ම දුන් වාඩිවූ තැනැත්තා දෙස එලෙසම බැලුවාය...



# හත

**කුඩා** කලදී දුටු දැරියට වඩා රුමත් පැහැපත් උසැති... ඇය තමාගේ උසටම මෙන් සිටින බව ඒ අතරම ඔහු සිතුවේය... සමහරවිට අඟල් තුනක් හෝ හතරක් අඩු විය හැකිය... කොණ්ඩය නම් කෙටිය... එය එක්කොට පෝනි ටේලයක් දමා තිබිණ... මුහුණේ ලාබාල පෙනුම නම් එලෙසමය ඔහුට සිතුණේය... ඔහු ඇයගේ මුහුණින් දුටුවේ නන්දා නැන්දාට ඇති සමීපත්වයක් නොවේ... කුඩම්මාගේ රුවකි... ඇය එඩ්වඩ් මාමාගේ නැතහොත් ඔහුගේ අක්කාගේ රුවට නැකම් දරන්නීය... ඇය විෂයයෙහි ඔහුගේ සිතිවිලි ඒ මොහොතේ වෙනස් වී ගියේය... ඔහුගේ සිතට ආවේ කුඩම්මාගේ අනුරුව දරන මෙම යුවතියට කරදරයක් නම් වන්නට නොදිය යුතුය යන හැඟීමය...

පැමිණි අමුත්තා කටාක්ෂ නිරීක්ෂණයෙන් ඇය දෙස බලද්දී නීලියාට දැණුනේ සබකෝලයකි... එහෙත් ඒ තැනැත්තා තමා දෙස බැලුවේ කුතුහලයකින් මිස වෙනත් අදහසකින් නොවන බව නම් ඇයට ඒ අතරද සිතිණ...

ඇයගේ සබකෝලය ඔහුට හොඳින්ම තේරුම් ගියද, එය නොතකා, සුදේශ් හොඳින්ම රුවැත්තිය දෙස බැලුවේය... ඇය සිහින්ය...

Scanned by CamScanner

එහෙත් පුෂ්ටිමත්ය... තාරුණ්‍යයේ ජවය ඇයගේ සිරුර පුරා දිවෙන බව ඔහුට සිතුණේය... ඇයගේ දෑසේ දුන් නැගී ඇත්තේ කුතුහලය බව දැනගැනීමට ඔහුට තවත් වරක් ඇය දෙස බැලීමට අවශ්‍ය නොවීය... ඔහු දෙවන වර යළිත් බැලුවේ පරාක්‍රම දෙසය...

"තමුසෙත් වාඩිවෙනවා මෙතනින්... මට කාරණා කටයුතු දෙක තුනක් දැනගන්න තියෙනවා..." ඔහු කීවේ පරාක්‍රමටය... ඒ ස්වරය ඉදිරියේ පරාක්‍රම තරමක් සැලුණද එය යම්තම් නීලියාට පෙන්වන්නට නොදී නවත්වාගන්නට සමත් වූයේය...

"අපි යන්න ලැහැස්ති වෙලා හිටියේ... යමු..." පරාක්‍රම එක්වරම කියා දැමුවේ නීලියාට අණක් මෙන් අන්තිම වචනයද කියමින්, නීලියාගේ විශ්මයද ගණන් නොගෙන මෙනි... ඇය තවමත් තේ කෝප්පය බොද්දී ඔහුගේ බොරුව ගැන සුදේශ්ට සිනහවක් නැගිණ...

නීලියා ඒ සිනහව නොදැක්කේ වුවද, පරාක්‍රම දෙසට ඇයගේ අමනාපවූ නෙත් හැරවූවාය... ආ තැනැත්තා ගැන තමාට කිසිදු හැඳින්වීමක්වත් නොකර කිසිදු සිරිතක් විරිතක් නොදන්නා අන්දමින් එතනින් යන්නට පරාක්‍රම තීරණය කරගත් වග දැනෙද්දී නීලියාගේ සිතට මඳක කෝපයක්ද එක් විණ... තමා අයත් වන්නේ සුදේශ් නැමැත්තාටය... ඔහු තමාගේ නීතියෙන්ම පත්වී ඇති භාරකරුය... පරාක්‍රම වෙනුවට ඔහු මෙතන සිටියේ නම් තමාට අණ දීමට අයිතියක් ඇත... මේ තැනැත්තාට... එනම් පරාක්‍රමට අර ලිපියක් ගෙන ආ පමණින්ම ඒ අයිතිය ලැබෙන්නේ නැත...

පරාක්‍රම දෙස මෙන්ම ඇයගේ නෙත් මෙම ආගන්තුකයා දෙසද එසැණෙන්ම මෙන් යොමු වූයේ පරාක්‍රමගේ කීම ඔහුගේ මුහුණට දුන් පෙනුම බලන්නට විය හැකිය...

පරාක්‍රම එසේ කියද්දී මේ තැනැත්තාට වෙනත් යමක් කියන්නට නොහැකි බව ඇය සිතුවාය... දෙවන වර ඇයගේ සිතිවිල්ල බිඳ වැටිණ...

ඒ මෙම තැනැත්තාගේ දෑසේ පෙනුම දකිද්දීය... එම දෑස පරාක්‍රම දෙස බැලුවේ තර්ජනාත්මක පෙනුමකින් බව වටහාගන්නට



ඇයට හැකිවූ හෙයිනි... එහෙයින්ම ඇය වඩාත් හොඳින් ඔහු දෙස බැලුවාය... දිගු කමිස අතද ඔහු මඳක් දුරට නවාගෙන සිටියේය... වැළමිට තෙක්ම නොව... ඇය එලෙස කවුරුත් මේ දිවයිනේදී මෙලෙස ඇඳ සිටිනු මෙතෙක්ම දැක්කේ නැත... ඇය දැක්කේම දිගු කමිස අත හෝ කෙටි කමිස අත්ය... නැතහොත් දිගු අත කෙටි කමිස අත තරමටම නවා තිබිණ...

මොහු ඒ අතින් නම් වෙනස්ම තැනැත්තෙකි... පරාක්‍රමට වඩා නම් මඳක් උස වන්නට පිළිවන... එකල මෝස්තරයට අනුව පරාක්‍රම මෙන්ම ඔහුද සයිඩ්බර්න්ස් හඳුන්වන දෙපැත්තේ රැවුල වවාගෙන සිටියේය... තරමකට උඩු රැවුලක්ද තිබුණෙන් ඇයගේ දෑසට ඔහු දිස්වූයේ හොලිවුඩ් නළුවෙකුගේ පෙනුමෙනි...

ඇයට ඔහු ගේ විස්තරය සොයමින් එතරම් වේලාවක් ගත කරන්නට නම් ලැබුණේ නැත...

"මං දන්නවා..." ඔහු එක්වරම කථා කළ හෙයිනි... "මටත් ඒක පේනවා... ඒත් මැනර්ස් නොදන්න විදියට මෙතනින් යන්න එපා පරාක්‍රම... මටත් අඳුන්නලා දෙන්න මේ ඔයාගේ ගෑනු ළමයව..."

ඔහු ඔයාගේ යන්න බර කළේය... නීලියා වෙව්ළුවාය... ආ තැනැත්තා තමා පරාක්‍රමගේ ආදරවන්තියක ලෙස සිතුවා වත්ද...? පරාක්‍රම තමා ගැන නොකියන්නේ නම් තමා හෝ තමා හඳුන්වා දිය යුතුය ඇයට සිතිණ... එහෙත් ඇය තරමක් ඉවසුවාය... තමා හඳුනන්නේ තවමත් පරාක්‍රම අයියා පමණකි... නොදන්නා නාඳුනන අමුත්තන්ට තමාගේ විස්තරයක් පැවසිය නොහැකිය... විදේශයකදී එය වෙනස්ය... මෙහිදී එය ගැන ඇය තරමකට දැනුවත්ව සිටියාය...

"මේ මේ..." පරාක්‍රම ගොත ගැසුවේය... නම නම් කියන්නට නොහැකි ය...

"ඇයි...? බයද මට අඳුන්නලා දෙන්න... නෑ පරාක්‍රම... මං අම්මලාට කියන්න යන්නේ නෑ..." සුදේශ් කියද්දී නීලියා දෑස් අයා බැලුවාය... මේ තැනැත්තා පරාක්‍රමගේ පවුලම හොඳින් හඳුනනවා වැනිය...

Scanned by CamScanner

"හ්..." ගැවා මිසක පරාක්‍රම වෙනත් යමක් කියන්නට නොසිතුවේය... තමා කරමුලින්ම අසුවී ඇත...

"වාඩිවෙනවා මිනිහො..." එවර සුදේශ් පරාක්‍රමට තරමක තර්ජන ස්වරයකින් කීවේය... "මොකද...? මට අඳුන්නලා දෙන්නෙ නැද්ද මේ ළමයව..."

"මෙයා මෙයා..." පරාක්‍රම යළිත් කියන්නට තැතනුවේය... වදන් නම් මුවට එන්නේම නැත... සුදේශ් අයියාට බොරුවක් කියන්නට නොහැකි බව දූන් ඔහුට සිතුණේය... පළමුවර නීලියා නැගිට්ටේ නම් ඒ ගැම්මෙන්ම යන්නට තිබිණ...

"හරි... තමුසෙට නේ බැරි... මං දැනගන්නං..." කියූ ඔහු නීලියා දෙසට හැරුණේය... එවර ඔහු කෙළින්ම කථා කළේ ඇයටය... ඔහු තමාට කුමක් හෝ කියන්නට යන බව දැනෙද්දී නීලියා තරමක් කුතුහලයෙන් යුතු දෙඇස් ඔහු දෙසටම යොමු කළේ තේ කෝප්පයෙන් යළිත් උගුරක්ද ගනිමිනි...

"එයාට ඔයා අඳුන්නලා දෙන්න අමාරු ඇති... මං දැන් එයාට ඔයාව අඳුන්නලා දෙන්න යන්නේ... පරාක්‍රම මේ තමයි... මෙලනි නීලියා ෆර්නැන්ඩු... එඩ්වඩ් මාමාගෙයි... නන්දා නැන්දාගෙයි එකම දුව... තමුසෙ හරියටම දන්නෙ නැතිව වෙන්න ඇති නේ එක්ක එන්න ඇත්තේ..." සුදේශ් කියද්දී නීලියාගේ දෑස් විශ්මයෙන්ම විසල් විය... ඇය තේ උගුර බීවා නොවේ... ගිල්ලාය...

"ඔයා... එතකොට ඔයා කවුද...?" ඇය ඇසුවේ පරාක්‍රම පුටුව මත ඇද වැටෙද්දීය... පරාක්‍රමට වඩා ඇයට එය අසන්නට දහිරියක් තිබිණ... ඇයගේ සිතේ පරාක්‍රමගේ සිතේ මෙන් වෙනත් වැරදි සිතිවිල්ලක් නොතිබුණ හෙයිනි...

"මං තමයි... සුදේශ් නවරත්න..." වෙනත් කිසිවක්ම නොකියා සුදේශ් තමා හඳුන්වා දුන්නේය...

"හ්..." ගැවුණු ඇය තේ කෝප්පය ස්ටූලය උඩ වැටෙන්නට ඩ නොදී තබා ගත්තාය... "අනේ... මේ සුදේශ් අයියාද...? දැන් ඔයා ගොඩක් ලොකු...ඌ...ඌයි නේ... මහතයි නේ... මට හිතාගන්නවත්



බැරි උනා... ඇයි ඉතින් ඔයා නාවේ...? මාව එක්කගෙන එන්න... මට නං හිතුණෙම නෑ මෙතනට එනකොටවත්... මට අම්මා පෙන්නලා තිබුණ ෆොටෝ එකෙත් ඔයා ගොඩක් වෙනස්..." ඇය කෑගැසුවාය... වටපිටාවේ සිටි කිහිප දෙනෙක්ද ඇයගේ කථාවේ ශබ්දයටදෝ හැරී බැලූහ...

"සයිලන්ස්... සයිලන්ස්... හෙමින් කථා කරන්න... දැන් මෙතන ඉන්න හැමෝම මං ගැන දැනගන්නවා... මං පොඩි කාලෙ කෙට්ටුයි... දැන් මහතයි... අපෝ අපෝ... දන්නවනං එන්නෙත් නෑ..." සුදේශ් කීවේය...

ඇය සිනහසෙන්නට ගත්තාය... පරාක්‍රමට වඩා සුදේශ් බොහෝ සැහැල්ලු බව ඇයට වැටහිණ... මොහුට නම් තිස් එකක් යැයි කිසිසේත්ම කිව නොහැකිය... සියල්ලන්ටම වැරදුණාදැයි ඇයට සිතිණ... පරාක්‍රමගේ කථාව අනුව ඇය මවාගෙන සිටියේ කළු... මෙයට වඩා මහත කරකැවූ උඩු රැවුලක් ඇති... ඇයගේ සිනහව වැඩිවුණේ ඇය මවාගත් රූපය මතකයට එද්දීය...

"වට්ස් සෝ ෆනී නීලියා...?" ඇය දෙස බලා ඇසූ සුදේශ් පරාක්‍රම දෙස බැලුවේය...

නීලියාට තවත් වෙනසක් දැණින... ඔහු පරාක්‍රම මෙන් තතනන්නට ගියේ නැත... පළමුවර තමා හා කථා කරද්දී පරාක්‍රම නම් තමා ඉදිරියේ බොහෝ ගොත ගැසූ බව ඇයට සිතිණ...

වයසේ පරාසය වෙන්නටත් හැකිය... නැතහොත් මේ තැනැත්තාගේ සිතේ පරාක්‍රමගේ සිතේ දිදුලන කිසිවක් නැතිවා වෙන්නටත් විය හැකිය... පරාක්‍රම කීවාක් මෙන්... මොහු දෙස බලද්දී නම් ඇයට කිසිදු වරදක් කියන්නට හැකි කමක් නොවිණ... දෙනෙත් වල බැල්මෙන් පුද්ගලයෙක් හඳුනාගත හැකි බව ඇයට බොහෝ විට සිතුණු දෙයකි... ඒ අතින් බලද්දී පරාක්‍රමගේ දෑසේ පෙනුමට ඇය අකැමැති වූවාය... ගැහැනියකගේ සහජ ඉවටත් වඩා තනිවූ යුවතියකගේ ඉව නිසාදෝ ඇයට බොහෝ විට දැසෙන් කෙනෙක් ගැන තරමක් දුරට පවසන්නට හැකියාවක් තිබිණ...

Scanned by CamScanner

මොන දේ සිදුවූවද, තමා මේ තැනැත්තාගේ භාරයට පවරා ඇත්තේ දෙමාපිය දෙන්නා විසිනි... දන්නා තරමින් මවගේ අසනීපයෙන් පසු පියාට වුවද මේ තැනැත්තාගේ බාරයෙන් තමා ඉවත් කරන්නට තිබිණ... එහෙත් ඔහුද එවැන්නකට පියවර තබා නැත... තමාගේ සුරක්ෂිත බව රැඳෙන්නේ සුදේශ් නවරත්න නැමැත්තා බාරයේය... ඒ හේම් අන්කල්ද ඔහු ගැන තරමක් විස්තරයක් කළ හෙයිනි... ඒ ඊයේය...

ඇසූ ප්‍රශ්නයට සුදේශ් පිළිතුරක් බලාපොරොත්තු වෙන්නටත් නැත... ඇය කුමක් වත් කියන්නට පළමු ඔහු යළි පරාක්‍රම දෙස බැලූ හෙයිනි...

"පරාක්‍රම... තමුසෙ කරන්න හැදුවෙ බරපතල වැරැද්දක්... මගේ මල්ලි කෙනෙක් වගේ කියලා මං හිතං ඉන්න නිසා මේක වැඩි දුරදිග යන්න ඉස්සෙල්ලා මං මෙතනින්ම නවත්තන්න බලනවා... තමුසෙට පුළුවන් දැන් තනියම යන්න... මං නීලියා එක්ක යන්නං..." සුදේශ් යළි කීවේත් පරාක්‍රමටය...

පරාක්‍රම කෙළ ගුලියක් ගිල ගත්තේය...

"එහේ නීලියාට ඉන්න වෙන්නේ තනියම..." ඔහු සැහෙන්නට දහිරියක් ගනිමින් කියාගත්තේය...

"මං දන්නවා... ඒක නිසා මං නීලියා එක්කගෙන කොහොමටත් කොළඹ යන්නෙ නෑ..." සුදේශ් කීවේ නීලියාගේ දෑසද විසල් කරවමිනි...

"එහෙනං... එහෙනං..." පරාක්‍රම තැතනුවේය...

"මං යන්නෙ වත්තට..."

"අයියා එහේ නෑ... එතකොට..." ඔහු එවර නම් යම්තම් අයියා යන්නෙන් කියා ගත්තේය...

"මිස්ට පරාක්‍රම... තමුසෙට නීලියා ගැන මෙච්චර කැක්කුමක් එන්නේ මොකද කියලා කියන්න මං දන්නෙ නෑ..." සුදේශ් කියද්දී එය ඔහු දන්නා බව හොඳින්ම ස්වරයෙන් වටහාගත්තේ පරාක්‍රම පමණකි... මේ වෙන දේවල් දෙසත් කථා දෙසත් බලා සිටියා මිස නීලියාගේ සිතට ඒවායේ බරක්පතලක් තේරුම් ගියේ නැත... ඇය සිටියේ



සැබැවින්ම සැහැල්ලු සිතකිනි... පරාක්‍රමට වඩා සුදේශ් නවරත්න ගැන ඇයට විශ්වාසයක් තබා ගත හැකි බව ඇය සිතමින් සිටියාය... කුමක් හෝ නිසා ඔහු අදම එන්නට ඇත... ඇය යළි සුදේශ්ගේ මුහුණ දෙස බැලුවාය... සුදේශ් පරාක්‍රමට කථා කරමින් සිටියා මිස ඇය දෙස ඒ මොහොතේත් බැලුවේ නැත...

"මං තමුසෙ කරපු කියපු කිසි දෙයක්ම හිතන්න යන්නේ නෑ... එක දෙයක් මට කියන්න පුළුවන්... අද ඉඳලා... මේ දැන් ඉඳලා මේ ළමයගේ බාරකරු මම... ඒ ළමයා බාර දීලා තියෙන්නේ මට... රට දෙපැත්තේ ජාති දෙක තුනක් බිස්නස් රන් කරන මට මේ ළමයගේ වගකීම හරියට කරන්න හරි දරන්න හරි බෑ කියලා කියනවනං..."

"මං කියන්නේ ඒක නෙවෙයි... මෙයාට මෙයාට..."

"ඕව් මොකද මෙයාට කථා කරන්න පුළුවන් නේ... මං නීලියාට දෙනවා තීරණයක් ගන්න... ඒ මොකද ඒ ළමයා එච්චරම මෝඩ... බය... අපේ මේ ලංකාවේ කෙල්ලො වගේ වෙන්න බෑ නේ... වට් ඩිඩ් යූ සේ නීලියා...? ලාස්ට් ඩිසිෂන් ඉස් අප් ටු යූ... අයි කැන් මැනේජ් ද සිටුවේෂන් ලීගලි... ආෆ්ටර් දැට්... ආ යූ කමින් විත් මී ඕ... හිම්...? ඉට්'ස් ඕකේ ටු මී... වෙදර් යූ ආ කමීන් විත් මී ඕ... නොට්..."

තත්පර දෙක තුනක් දෑස් විසල් කර ඔහු ඇයට කියවූ දේ හොඳින්ම සිතට ගත්තා වැනිව බලා සිටි ඇය සුදේශ් දෙසද බලා යළි පරාක්‍රම දෙස බලා ඇයගේ එවර කටහඬ අවදි කළාය... ඇය එය කියන්නට කල් ගත කළේද නැත... බියවූයේද නැත...

"මං සුදේශ් අයියාත් එක්ක යනවා..." ඇය කීවේ කෙළින්ම පරාක්‍රම දෙස බලමිනි... පරාක්‍රමගේ මුහුණ ඇඹුල් වුණද සුදේශ්ට සිනහවක් නැගිණ... ඇය හොඳ ධෛර්යවත් කෙල්ලකි... තමාට වඩා නෑකමක් ඇති ඔහුට එලෙස කියන්නට ඇය පැකිළුණේ නැත... පරාක්‍රම හා නොදැනීමෙන් හෝ ආශාවෙන් හෝ පැමිණියද දැන් එලෙස කියන්නට තරම් ඇයට දහිරියක් තිබිණ... සමහරවිට පරාක්‍රමගේ කථා බහ ඇයගේ සිතට නාල්ලන්නට ඇත... නැතහොත් මේ වයසේ ගැහැනු ළමයෙක් එලෙස ඇයගේ වයසේ තැනැත්තෙක් හා යන්නට

Scanned by CamScanner

නොහැකියැයි පවසන්නට තරමක් අදි මදි කරන බව නම් ඔහුට සිතුණේය... සිතුවාට වඩා මේ යුවතිය වෙනස් යුවතියක් විය හැකියැයි ඔහුට සිතිණ... විදේශගතවී සිටි යුවතියකගේ පෙනුම තිබුණාට ඇය බොහෝ දේ වගකීමකින් හා යුතුකමකින් යුතුව ඉටු කරන්නට හැකි කෙල්ලක බව මේ වෙද්දී සුදේශ් නිගමනයකට බැසගෙන තිබුණේය... සමහරවිට තනිවූ යුවතියක් හෙයින් ඇයට යම් යම් දෑ ගැන හැඟීමක් ඇතිවාද විය හැකිය...

කෙසේ වූවද ඔහුටද තරමක සැනසිල්ලක් දැණුනේය... තමාට පැවරූ අති මහත් භාරදූර කාර්යයේ වගකීම හරියාකාරව ඉටු කර ලිය හැක්කේ ඇය තමා හා පැමිණිය හොත් පමණකි...

ඔහු පරාක්‍රම දෙස බැලුවේය...

"ඇහුණ නේ... දැන් ඒ ළමයගේ බෑග් එක ගෙනැත් මගේ කාරෙකට දානවා... තමුසෙ ගෙනියන්න ගත්තා නං..." සුදේශ් එවර පරාක්‍රමට අණ දෙන ස්වරයකින් කීවේය...

කේන්තියෙන්ම නැගිට ගත් පරාක්‍රම එතනින් නික්මුණේය...

සුදේශ් වෙනත් කිසිවක්ම නොපවසා සේවකයකුට අඬ ගැසුවේ...,

"තව හොඳට කිරි දාලා තේ එකකුයි... බිලයි ගේන්න..." ඔහුට කීවේය...

"ඔක්කෝම මේ ටේබල් එකේ බිලද සර්...?" සේවකයා ඇසුවේය... ඔහු පරාක්‍රම නැගිට යනු දුටුවේ නැත...

"ඔව්... ඒ මහත්තයාගේ බිලත් එක්කම... ඒ මගේ මල්ලි..."

නීලියා දෑස් අයා සුදේශ් දෙස බැලුවාය... තමාට කෙළින්ම නෑකමක් ඇති පරාක්‍රමට වඩා සුදේශ්ගේ මෙම ගතියට ඇයගේ සිත එක්වරම ඇදිණ... සුදේශ් තමාගේ අයියායැයි පවසන්නට පරාක්‍රමට නොහැකි විය... එහෙත් ඔහු ඒ තමාගේ මල්ලී බව නොවළහා පවසා තිබිණ...

සුදේශ් එලෙස කීවේද තරමක් කල්පනා කාරීවූ බැවිනි... මෙතනට ආ ලාබාල තරුණයා තමාට මෙම යුවතිය බාරදී ඉක්ම යනු



දකිද්දී එය ගැන වෙනත්ම ආකාරයෙන් සිතන මිනිසුන් කොටසක්ද මෙහි සිටින්නට හැකි බව ඔහුගේ සිතට ආ හෙයිනි...

සේවකයාට එය කිවහොත් සේවකයා එය කියන්නට නොපැකිළෙන බව ඔහු දැන සිටියේය... වඩාත්ම වැදගත් වන්නේ මෙතැන්හිදී නීලියා අපහසුතාවයකට පත් නොකිරීමය...

සේවකයා වෙනත් කිසිවක්ම නොපවසා එතනින් පිටවුණේය... සුදේශ් එවර නීලියා දෙස බැලුවේය...

"පරාක්‍රමගෙන් මොකක් හරි කරදරයක් උනාද...?" ඔහු ඇසූ දෙස ඇයට හොඳින්ම තේරුම් ගිය බව ඔහුට ද වැටහිණ...

ඇය හිස සැලුවාය... ඇය වෙනත් යුවතියක මෙන් සිතන්නට හෝ සබකෝලයෙන් ඇඹරෙන්නට ගියේ නැත... නෑ... එයින් හැඟවිණ...

සුදේශ්ට තවත් වරක් සැනසිල්ලක් දැණින...

සේවකයා තේ කෝප්පයක් හා බිලක් රැගෙන ආවේය... ඔහු මුදල් දැමුවේ තේ කෝප්පය අතට ගත්තේ සේවකයා එතනින් යන තුරු තේ කෝප්පය තොල ගෑවේය... ඇයගේ තේ කෝප්පයේ තවත් තේ ටිකක් ඉතුරුව තිබිණ...

"තේ එක බීලා ඉන්න... මාත් තේ එක බීලා... ගිහින් එහෙනං ඔයාගේ ඉතුරු ඇඳුං ටිකත් අරගෙනම යනවද...? නැත්තං...?" සුදේශ් ඇසුවේ ඇයගෙනි...

මෙතැන් සිට තමාට ඇය ගැන තීරණ ගත හැකි වූවද, ඇයගේ සිතිවිල්ලට අනුව වැඩ කිරීම හොඳ බව ඔහු සිතාගත්තේය... ඇය යමක් කමක් තේරුම් ගත හැකි යුවතියක් බව මේ අඩ පැයේදී ඔහු පැහැදිලි තීරණයක් ගෙන තිබුණේය...

නීලියා සෙමින් තේ කෝප්පයේ ඉතිරි ටික බීවාය... ඇය කල්පනා කාරී වනු දුටුවේ සුදේශ්ගේ දෑසය...

ඔහු සිතුවා නිවැරදිය... ඇය කල්පනා කළාය...

මේ කරුණේදී ඇයට කිසිවක්ම සිතාගත නොහැකිය... එහෙ
යන්නේ මොහු සමග නම් තමා මේ ගෙනා සුළු ඇඳුම් ප්‍රමාණයෙ

Scanned by CamScanner

කෙසේවත් ජීවත්විය නොහැකිය... පරාක්‍රම සමග එද්දී ඇය සිතුවේ දින දෙකකට හෝ තුනකට යන හැඟීමක් පමණකි... ඒ පරාක්‍රම යනු තමාගේ බාරකරු නොවන බව ඇය දන්නා හෙයිනි...

ඇයට හැකි වන්නේ සුදේශ් නැමැත්තා කියන තැනකට යෑම පමණකි... ඒ ඇයගේ භාරකරු හෙයිනි...

තමා ගෙන යන්නට අණ දී තිබුණේ සුදේශ් වූවද, ආවේ වෙනත් තැනැත්තෙක් නිසා ඇය ඇඳුම් සියල්ලම නොගන්නට තීරණය කරගත්තාය... එයට මව්තුමියද එපැයි කීවේ නැත... ඇයද කීවේ එය හරි බවය... එහෙත් හරි හෝ වැරදි හෝ වේවා... මොහු හොඳ හෝ නරක හෝ වේවා තමාට දැන් ඉන්නට වෙන්නේ මොහුගේ සෙවණේය... මේ බෑගය මව්තුමිය ළඟ තබා අනික් බෑග ටික ගෙනයන්නට ඇය සිතුවාය...

එවිට කරදරයක් වූයේ නම් යළි මව්තුමිය ළඟට එද්දී ඇයට කුමක් හෝ ඇඳුමක් පැළඳුමක් තිබෙන හෙයිනි...

දෙවන වර ඇය සිතිවිල්ල වෙනස් කර ගත්තාය... තවමත් හේම් අන්කල් ලංකාවේ සිටින බව ඇය දන්නීය... ඒ නැතත් දැන් මේ සිදුවූ කාරණා දෙස බලන කළ තමාට තමාගේම මස්සිනා වන පරාක්‍රම නමින් යුත් තැනැත්තාට වඩා මොහු ගැන තරමක විශ්වාසයක් තැබිය හැකිය...

කෙසේ වෙතත් සුදේශ් සමග යද්දී පරාක්‍රම සමගින් යන්නට තීරණයක් ගන්නවාට වඩා හේම් අන්කල්ට තමා ගැන සොයන්නට ඇති හැකියාව වැඩිය... ඇයට ඇය ගත් තීරණය ගැන සතුටක් දැණුනේ ඒ මොහොතේදීය... සැබැවින්ම තමා පරාක්‍රම සමග ගියේ නම් හේම් අන්කල්ට වුවද කරන්නට දෙයක් නොලැබෙන්නට හැකිය... මේ තැනැත්තා හොඳ නැත්නම් හේම් අන්කල් තමා ගැන බලාගන්නා බව කිහිප විටක්ම ඔහු කී බව ඇයට අමතක නැත...

අන් අයගේ කීම් කථන්දර ගැන සලකා නොව තමාටම මොහු ගැන සොයා ගන්නට පිළිවන... වැරැද්දක් තිබේ නම් හේම් අන්කල්ට කිව හැකිය...



"ඒ ඇඳුං ටික ගන්න හේම් අන්කල් එක්කම ගියොත් නේද හොඳ...?" ඇය ඇසුවේ සුදේශ්ගේ සිතත් නොකඩන්නට සිතමිනි... එලෙස කියද්දී තමා ඇඳුම් ටික ගන්නට හේම් අන්කල්ට කථා කර යළි මව්තුමිය වෙත එන්නේ නම් මොහු එන්නට දෙන බව ඇයට සිතෙද්දීය... නොදන්නා නාඳුනන රටක කවරෙක්වත් තරහා කරගැන්මටද ඇයගේ කැමැත්තක් නොවිණ... "ඒත්... ඒක ඔයාට කරදරයක් වගේ නං අදම අපි ඒවාත් අරගෙනම යමු..." ඇය එයට එක් කළේද එහෙයිනි...

තමාගේ බාරකරු ලෙස තමා බාරගන්නට ඔහුගේ දහිරිය දකිද්දී ඔහුට කරදරයක් වන්නටද ඇයගේ සිත ඉඩ දුන්නේ නැත...

සුදේශ්ගේ සිතට ආ සිනහව ඔහු නවතාගන්නට උත්සාහ කළේ නැත... ඔහු සිනහසෙමින්ම ඒ දෙසට එන සේවකයා දෙස බැලුවේය... ඇය තමාගේද සිත නොතළා කිසිවක් කියන්නට අර අදින බව සිතෙද්දීය...

"ඒක කමක් නෑ කොහොම උනත්... ඔයාගේ කැමැත්තක්..." ඔහු කීවේ සේවකයා ගෙන ආ ඉතිරි බිලෙන් මුදල් නෝට්ටුවක් වැන්නක්ම පීරිසියේ ඉතිරි කරමිනි... මේ දිවයිනේ මෙලෙස සේවකයෙකුට සන්තෝෂමක් දෙනු ඇය දුටුවාමය... බොහෝ අය තිබ්බේ සත ගණනකි...

"හේම් අන්කල් කිව්වේ මිස්ට ඉලුක්කුඹුරට වෙන්න ඇති නේ..." කියාගෙනම ඔහු නැගිට ගත්තේය... නීලියාද නැගිට්ටාය... ඇය සැහෙන්නට උස යුවතියක බව ඔහුට දැණිණ... මේ වයසට මෙම දිවයිනේ යුවතියන් මෙතරම් උසක් ගන්නේ නැත... අයේෂාගේ වයසට එද්දී ඇය තවත් අඟලක් දෙකක් උස යන්නට පිළිවන...

"ඔව්... මං කල්පනා කළේ දැන් ආයෙත් ගියත්... ඒක හොඳ නෑ වගේ නේ... හේම් අන්කල්ටත් කියලා..."

සුදේශ්ට ඇයගේ සිතැඟි වටහා ගැනීමට එතරම් වෙලාවක් ගන්නට වුණේ නැත...

"හරි ඒක කමක් නෑ... එයා යන්න ඉස්සෙල්ලා එහෙනං අපිට

Scanned by CamScanner

ආයේ එන්න පුළුවන්... එතකං ඔයාට ඕන කරන දේවල් තියෙනවනං... ගිහිල්ලා අළුතින් හරි ගමු... වැඩියක් වෙන එකක් නෑ නේ... වත්තෙ කොටසක් තියලා කොළඹ කොටසක් තියාගන්නත් පුළුවන් නේ..." සුදේශ් කියද්දී නීලියා එයට හිස සැලුවාය... නැහැයි බැහැයි එපැයි කියන්නට මෙම කරුණු වලදී දූන් ඇයට හැකියාවක් නැත...

එහෙත් ඇයගේ සිතේ තිබුණු සියළුම පසුතැවිලි හා දුක් දෝමනස්ස නැතිවී ගියේ කාරය ළඟට සුදේශ් ළං වෙද්දීය...

"මොකක්ද අයියාගේ කාර් එක...?" ඇය ඇසුවේ එහි වාහන දෙක තුනක්ම දකිද්දීය... ඇයගේ සිත ගත්තේ රතුපාට ස්පෝර්ට් කාරයටය... ඒවා වැඩිය අය පාවිච්චි කරන්නේම නැත... එහෙත් ඇය එවැන්නක යන්නට ආශා කළාය... සුදේශ්ගේ ගතියට ඇය සිතුවේ එතන තිබුණු වෙනත් වර්ගයේ වාහන දෙකකින් එකක් වන්නට ඇති බවය... මොරිස් මයිනරය නම් ඔහුගේ වෙන්නට නුපුළුවන...

"රතු ස්පෝර්ට් එක..." සුදේශ් කියද්දී ඇයගේ දෑස් විශ්මයෙන් විසල් විය...

"ෂා...ආ...ආ... ඒකද ඔයාගේ කාරෙක... හරි ෂෝක් නේ... මං ආසා...ආ...ආ...ම ජාතියේ කාර් එකක්..." ඇයට කෑගැසිණ... සුදේශ්ට සිනහවක් නැගිණ... ඇය තවමත් දූරියක බව සිතෙද්දීය... වෙනත් ගැහැනියක නම් එය එලෙස කියන්නට නොසිතනු ඇත...

"එහෙදි ඕගොල්ලන්ට තිබුණෙත් මේ වගේ වෙහිකල් එකක්ද...?" අසමින්ම සුදේශ් එයට ළං වුණේය...

"අපෝ නෑ... ඒක පොඩි වෑන් වගේ එකක්... මිනි වෑන් එකක්... තාත්තා නැති උනාම ඒක තාත්තාගේ යාළුවෙක් ගෙනිච්චා... එයා ඒ වෙනුවට මට කීයක්ද දාලා තිබුණා..."

"කීයක් වගේ...?" සුදේශ් නිකමට ඇසුවේය...

"මං හොයන්න ගියේ නෑ සුදේශ් අයියෙ... ඇත්තටම නං මට ඔක්කෝම එපා වෙලා තිබුණෙ... කාත් කවුරුත් නැති වෙද්දි... සල්ලි කියන ඒවා එච්චරම වටිනකමක් එන්නේ නෑ..." ඇය කීවේ තරමක්



දුක්බර කටහඬකිනි... සුදේශ්ගේ සිතට පසුතැවිල්ලක් දැණිත... ඔහුට එය නොසිතී නොතිබුණේද...? කුඩම්මාගේ ආදරය නැතිවෙද්දී තමාට එම ආදරයට මුදල්මය වටිනාකමක් දෙන්නට හැකියාවක් තිබුණේ නැත... එහෙත් මෙවන් යුවතියකගෙන් එවන් කථාවක් අසන්නට වේයැයි ඔහු කිසි දිනෙක සිතා නොතිබුණේය...

"නගින්න නගින්න... අපිට සෑහෙන දුරක් යන්න තියෙනවා..." කියමින්ම සුදේශ් පළමුවම ඇයගේ පැත්තේ දොර ඇරියේය... ඇයගේ සිත සතුටින් තිබීම දූන් ඔහුගේ කාර්ය භාරය බව ඔහුගේ සිත කියෙව්වේය... නීලියා නගින්නට පෙර පසු පස කුඩා කොටස දෙස බැලුවාය... කාරයේ යා හැකිවූයේ දෙදෙනෙකුට පමණකි... පසුපස අසුනක් නොවුණද කෙනෙක්ට අපහසුවෙන් නමුත් වාඩිවෙන්නට හැකියාවක් නම් තිබිණ... එම කොටසේ නීලියාගේ බෑගය තිබිණ...

"මේ මගේ බෑග් එක ගෙනැල්ලා දාලා..." කියමින්ම ඇය අසුනට නැග්ගාය... දොර වැසුවාය...

"හ්ම්..." ඕනෑවට එපාවට මෙන් හූමිටි තැබූ සුදේශ් කාරයට නැග දොර වසාගත්තේ එය පණ ගැන්වූයේය...

"පරාක්‍රම අයියා යන්න ඇති..." ඇය කීවේ මහපාරට සේන්දු වෙද්දීමය... ඔවුන් ආ කුලීරිය එහි දූන් තිබුණේ නැත...

"ඉඳලා වැඩක් නෑ නේ ඔයා යන්නෙ නැත්තං..." සුදේශ් කීවේ කාරය මහපාරට දමමිනි...

# අට

**පරාක්‍රම** හා ආ ගමන මෙන් නොව සුදේශ් හා ගමන ඇයට බොහෝ විනෝදයක් ගෙනදී තිබිණ... වහලක් නැති කාරයේ යෑම සියල්ලටමත් වඩා ආශ්වාදජනක විය... ඇය දෙපැත්තේ ඇති කුඹුරු මිටියාවත් ආදී දේ දෙස බැලුවේ ආශාවෙනි...

පරාක්‍රම ඇයට වටපිටාවට වත් නෙත් යොමු කරන්නට දුන්නේ නැත... ඇය වෙනතක බලන හැම වාරයක් පාසාම මොනවා හෝ මුමුණා ඔහු දෙසට ඇයගේ මුහුණ හරවා ගත්තා මිසක ඇයට කිසිවක්ම වටපිටාව ගැන විස්තරයක් වුවද කීවේ නැත...

එහෙත් සුදේශ් එයට වඩා වෙනස් විය... ඔහු තරමක් දුරට දන් පසුවූ ගම්වල නම්ද කීවේය... නොම්මර කණු ගැන කීවේය... ඒවැනි දේවල් ලංකාවේද ඇතැයි ඇයට සිතාගත නොහැකිවීද තිබිණ... විදේශයේදී මෙන් නොව ඒවා මෙහිදී සොයා ගන්නට නම් අපහසු ව ඇයට සිතිණ... විදේශවල සැතපුම් කණු ගමනාන්ත කාටත් ාදින්ම පෙනෙන පරිදි සටහන් කර තිබිණ...

සුදේශ්ටද මෙම යුවතිය හා මෙම ගමන සෑහෙන ආශ්වාදයක් ර දී තිබිණ... ඔහු හා මෙම කාරයේ බොහෝ විට ගියේ මහ



ගැහැනුය... ඔවුන්ට කථා කරන්නට තිබුණේ එක් පරාසයක කථා පමණකි. උසස් සමාජයේ ඕපාදූප අයේෂා හරහා මෙන්ම අනික් අගනුන් හරහාද ඔහු ඕනෑතරම් අසා තිබිණ... එහෙත් නීලියා එලෙස නොවීය...

ඇයට වටපිටාව ගැන මෙන්ම සුදේශ් ගැනද සෑහෙන විස්තරයක් අවශ්‍ය විය... එය තේරුම් ගත් නිසාදෝ ඔහු ගමන පටන් ගත් තැන සිටම නීලියාට මෙම ගම්මානවල නම් ගැන හැඟීමක් දෙන්නට සිතට ගත්තේය...

මොන දේ සිදුවූවද ඇයට යන පාරක් ගැන විස්තරයක් දී තිබීමද වඩාත් වැදගත් බව ඔහු සිතුවේය... පරාක්‍රමලා මෙයින් නවත්වන්නට සිතුවහොත් එය වෙනකකි... නැතහොත් ඇයට ලංකාවේ හැටි සොබාව තරමකට විස්තරයක් කර දී තිබිය යුතුය...

එයටත් වඩා ඔහුගේ සිත ගත්තේ ඇයගේ සැහැල්ලු කථා ලතාවය... ඇය තමාට වඩා බොහෝ බාල දැරියක වූ හෙයින්ම සුදේශ් ඇයට අවිෂය වූ කිසිවක්ම පවසන්නට නම් නොගියේය...

එහෙත් නංගී යැයි ඇමතීමට නම් ඔහු අකැමැති විය... ඒ කථාව ඔහුගේ පරාසයේ කීමට ඔහුට අපහසුය... ඔහු කාටත් ආමන්ත්‍රණය කළේ නමිනි... එය වෙනස් වූයේ අක්කාලා දෙදෙනාටම පමණකි...

පරාක්‍රම අයියාට වඩා සුදේශ් අයියා වෙනස් බව ඒ අතර නීලියාද සිතුවාය... හැසිරීමෙන් පමණක් නොව කරන කියන දේවල් පවා වෙනස් ය... පරාක්‍රම මෙන් නොව සුදේශ් ඇයගේ මව හා පියා ගැනත් ඇයගේ එහිදී මිතුරු මිතුරියන් ගැනත් ඇසුවේය... ඉගෙනුම ගැන ඇසුවේය... කරන ලද විභාග ගැන ඇසුවේය... මෙහිදී කරන්නට අදහස් කරන දේවල් ගැන විමසීමක් කළේය...

"ගිය ගමන්ම ඔයා කොන්වන්ට් එකේ මදර්ටයි... ඔයාගේ අන්කල්ටයි කෝල් කරලා කියන්න ඕන ඔයා ඉන්නේ මං ළඟ කියලා... අන්කල්ට විතරක් වෙච්ච දේ කියන්න... මදර්ට කියන්න එපා... එයාට කියන්න ඕන පරාක්‍රම ඔයා මට බාර දුන්නා කියලා විතරයි..."

"ඇත්තටම ඇයි පරාක්‍රම අයියා එහෙම මාව එක්කගෙන යන්න හිතුවෙ...?" මෙතෙක්ම ඇයගේ සිතට වදදෙමින් තිබුණ ප්‍රශ්නය

Scanned by CamScanner

නීලියා සුදේශ්ට යොමු කළාය... හිතෙන අන්දමින් තුමා පරාක්‍රම ඇවිත් ඇත්තේ සුදේශ්ගේ අනුදැනුම පිට නොවේ... එහෙත් අර ඉදිරිපත් කරන ලද ලිපිය... ඒවා අසන්නට නම් ඇය අකමැත්තක් දැක්වූවාය... සුදේශ් කියන්නේ නම් වෙනකකි...

කෙසේ වෙතත් සුදේශ් නැමැත්තා තමාගේ බාරකරු වූවද, මෙතෙක්ම ඇයට ඔහුගේ හෝ විස්තරයක් නැතහොත් ඔහුගේ ගැන සිතා ගන්නට තරම් කාලයක් නොවිණ... ඇය ඔහු ගැන දන්නී හේම් අන්කල් කියූ විස්තරය ඇසුරෙන් පමණකි..

නිශා ආන්ටි නම් එලෙසවත් ඔහු ගැන කිව්වේ නැත... එහෙත් පරාක්‍රම නැමැත්තාට වඩා සුදේශ් ගැන විශ්වාසයක් තැබිය හැකි බව ඇය සිතාගත්තීය... ඒ සුදේශ් පරාක්‍රම තමාගේ මල්ලී බව සේවකයාට කියද්දීය...

"හිතෙන්න ඇති... පිටරට හිටිය නැනා කොහොම කෙනෙක්ද කියලා බලන්න... මට වඩා ඒ ගොල්ලන්ට අයිතියි ඔයා..." සුදේශ් කියද්දී ඒ විශ්වාසය තවත් තහවුරු විය... ඔහු තමාගේ බාරකාර බව ඉහට ගෙන නැත...

"නෑ සුදේශ් අයියා දන්නෙ නැති උනාට අම්මි නං හැමදාම වගේ අයියා ගැනයි ඒ නැන්දා ගැනයි කියෙව්වා... මං ඔයා ළඟට එන්න ටිකක් බය උනේ ඔයා දැන් ගොඩක් ලොකු කියලා හිතුණ නිසා..."

"මං කොහොමටත් ලොකු තමයි..." එවර නම් සුදේශ් සිනහසී කීවේය... තමාගේ වයස හා සසඳද්දී ඇය දැරියකි...

"එහෙම නෙවෙයි... මං හිතුවෙ මහත ටිකක් මැර පාට..."

"මොකක්ද ඒ පාට...?"

"මැර පාට... මැරයො කියන්නේ රණ්ඩු වෙන අයට නේද...?"

"තරමක් දුරට..."

"අම්මි එහෙම කියනවා මං අහලා තියෙනවා... ඒ පැත්තේ චූඩීස්ලට..."



සුදේශ්ට සිනහව නවතා ගන්නට මඳක් කල් ගතවිය...

"ඒ මිනිස්සුන්ට පාටක් තියෙනවද...?" ඔහු ඇසුවේය... මෙම කෙල්ල සමග කාලය ගත කිරීම නම් බොහෝ විනෝදජනක විය හැකිය...

"පාටක් නෑ... එක එක පාටනේ... ෆෙයාර්... ගුඩ් ලුකින්... බ්ලැක්... වයිට්... බ්‍රවුන්..."

"ඔයා කියන විදියට මිනිස්සුන්ට පාට කියන්න ගියොත් තියෙන්නේ පාට හතරයි..."

"එච්චරයි තමයි... හියුමන්ස්ලගේ පාට කියන්න පුළුවන්ද...?"

"හරි හරි... මං ඔයාට දිනුම දුන්නා... දැන් ඉතින් මගේ මැර පාටක් නෑ කිව්වනේ...මං ගැන ඔයාට හිතෙන්නෙ මොනවද...?"

ඇය ඔහු දෙස බැලුවාය... ඔහුද බැලුවේය... ඇයගේ මුහුණේ තිබුණේ තරමක සැකයක් වැන්නකි...

"ම්... මගෙන් ඔයා හරිම ආන්සර් එකද ඉල්ලන්නෙ...?"

"ඔව්... නැතුව බෑ..." කියමින්ම සුදේශ් යළි ඉදිරිය බැලුවේය... බල්ලෙක් පැන්නෙන් නළාව හැඬ වූයේය...

"ඒක වැරදුණොත් ඔයා මාව කොහේට හරි දානවද...?" ඇය ඇසුවේ පණ එපා කියමින් දුවගිය බල්ලා දෙසද බලමිනි...

"කොහේ දාන්නද...? ගිහිල්ලා වත්තට දානවා මිසක් මේ විදියටම..."

"එහෙනං මං කියන්නද...?" ඇය ඇසුවේ තරමක් සැනසිල්ලකට පත්වූ ලීලාවකිනි... ඇය දැරියකි... ඔහු සිනහසී අවසරය දුන්නේය...

"ස්මාර්ට්... ගුඩ් ලුකින්... හැන්ඩ්සම්..." කියමින්ම ඇය තවත් හොඳින් ඔහු දෙස නැවෙමින්ම බැලුවාය... වඩාත් ඔහුගේ රුව සිතාගන්නට මෙනි... ඔහු වාහනය පදවන අතරම ඇය දෙස බලමින් සිනහසුණේය...

පරාක්‍රමට වඩා තේජවන්ත පෙනුමක් මෙන්ම බොහෝ

Scanned by CamScanner